## 2018.07.03වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති

## මාසික සභා රැස්වීම් වාර්තාව

**සහභාගීත්වය (-**

| | |
|---|---|
| ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතාගරු සභාපති | |
| කමල් වැල්ලගේ මහතා | ගරු උප සභාපති |
| ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ. ඩබ්. ජගත් කුමාර මහතාගරු නගර සභා මන්ත්‍රී | |
| ඒ.පී.ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රී |
| දිනයාදුර ධර්මදාස මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| නන්දන රාජපක්ෂ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ලලිත් ධම්මික කොඩිකාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ආර්. එම්. ලසන්ත අජිත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩෙනට් පනියන්දුවගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| මගගේ අතුල ප්‍රියන්ත මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්. ඒ. සෝභිත රංජිත් මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ජී. ජී. ආර්. පේෂලා කුමාරි මහත්මිය | ගරු නගර සභා මන්ත්‍රී |
| එච්. ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය | ගරු නගර සභා මන්ත්‍රී |
| එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්. එම්. නිලානි මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ධනසේන මාදුවගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| කේ. ජී. පී. දයානන්ද මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| එස්. එම්. සරත්චන්ද්‍ර ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |

☸ **පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ.ව. 09.35ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී** ☸

**(01)**

**01:01 018 – 06 – 05Èk mj;ajk ,o udisl iNd /iaùï jd¾;dj iNd ïu; lsÍu**

**2018 – 06 – 05දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාරමහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.**

✠ **ඒ අනුව 2018- 06- 05 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය විසින් ඉදිරිපත් කරන ලද සංශෝධන

සභාපතිතුමනි සංශෝධන වශයෙන් මම කියන්නෙ පසුගිය සභාවෙ මම කියපු දේවල් කිසි දෙයක් රෙකෝඩ්න් වෙලා තිබුනෙ නැහැ. ඒ ලිපිකාරතුමිය ගෙන්නල මට ඇහෙන්න සැලැස්සුව. මට පෙනී

ගියා මම කියපු දේවල් නැහැ කියලා. ඒ නිසා ඔබතුමා ඒ ගැන අවධානය යොමු කරල ඉදිරියේදී ක්‍රියාමාර්ගයක් ගන්න කියල මම ඉල්ලා සිටිනවා.

**(02)** සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන නැත

**(03)** ලැබී ඇති පැමිණිලි පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

**03:01** **" අම්බලන්ගොඩ නගරයේ උපත ලැබූ ශ්‍රේෂ්ඨ අධ්‍යාපනඥයින් වන පී.ද.එස්. කුලරත්න හා එල්.එච්. මෙත්තානන්ද මැතිතුමන්ලාගේ ජීවමාන ප්‍රමාණයේ ප්‍රතිමා ඉදිකිරීම සඳහා භූමිය වෙන්කරවා ගැනීම** " මැයෙන් අම්බලන්ගොඩ දේශප්‍රේමී සංවිධානයේ ලේකම්තුමා හා සභාපතිතුමා විසින් 2018-06-05 දාතමින් එවා තිබූ ලිපිය සභාගතකරන ලදී.

ශ්‍රී ලාංකීය අධ්‍යාපන ක්ෂේත්‍රයට සුවිශාල වූ සේවාවක් ඉටුකල අම්බලන්ගොඩ නගරයේ උපත ලැබූ ශ්‍රේෂ්ඨ අධ්‍යාපනඥයින් වන පී.ද.එස්. කුලරත්න හා එල්.එච්. මෙත්තානන්ද මැතිතුමන්ලාගේ ජීවමාන ප්‍රමාණයේ ප්‍රතිමා දෙකක් අම්බලන්ගොඩ නගරය තුල ඉදිකිරීමට බලාපොරොත්තු වන බවත් ඒ සඳහා නගර සභා ක්‍රීඩා පිටියේ උඩ කොටසෙහි ස්ථානයක් සහ නගර සභා මහජන පුස්තකාල භූමියේ බිම් කොටසක් ලබා දීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමා, මෙම දෙපල අම්බලන්ගොඩ නගරයට, රටට සේවය කරපු වැදගත් පුද්ගලයන් දෙදෙනෙක්. නමුත් ගැටළුව තියෙන්නෙ අපි අනගාරික රයිටර් තිලකසේකර මැතිතුමාගෙ අවමංගල කටයුතු සිදු කරපු වෙලාවෙ සභාවක් තිබුනෙ නෑ නගර සභාවෙ හිටපු ලේකම් තුමිය, ප්‍රාදේශීය ලේකම්තුමිය, ප්‍රධාන අමාත්‍යතුමා, මමත් සහභාගි වුනා එතනදි තීන්දුවක් ගත්තා පිට්ටනිය මැද මින් ඉදිරියට ආදාහන උත්සව තියන්න කටයුතු කරන්න එපා කියලා. ඔය තියන ඉඩකඩ තමයි අම්බලන්ගොඩ ප්‍රභූවරයෙකුගෙ ආදාහන කටයුත්තක් සඳහා භාවිතා කරන්න තියෙන්නෙ.ඔතන මේ පිළිරුව හදන්න ඉඩ දුන්නොත් එස්.ජී. ද සිල්වා මහත්මයාගෙ පවුලෙ කෙනෙකුත් ඉල්ලන්න පුළුවන්, දොස්තර සද්ධාසේන මහත්මයාගෙ කෙනෙකුත් ඉල්ලන්න පුළුවන් අපෙත් හදන්න ඕනෙ කියලා. අනිත් එක කියන්න ඕනෙ මම ජනතා විමුක්ති පෙරමුනේ නිර්මාතෘවරයා අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයේ. එහෙමනම් එතුමාගෙ එකත් ඔතන හදන්න ඕනෙ. මොකද රටටම දැනෙන්න දේශපාලනය කරපු කෙනෙක්. මෙහෙම ඉල්ලන්න ගත්තොත් අපට යම් දේකට තැනක් නැති වෙනවා සභාපතිතුමනි. එම නිසා මෙම ඉඩ ලබා දීම පිළිබඳව මම සහ මගේ පක්ෂයේ සියළු දෙනා විරුද්ධ බව ප්‍රකාශ කරනවා. ගාළු පාරේ තිබෙන වෙනත් භූමියක් ලබා දීම පිළිබඳව අපේ අකමැත්තක් නැහැ. අනිත් එක මෙම දෙපලගෙ පිළිරු සෑදිය යුත්තේ ප්‍රධාන පාරකට මුහුණලා. එහෙම තමයි වෙනත් රටවලත් තියෙන්නෙ. එනිසා මගේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා මෙම භූමිය ලබා දීම සම්බන්ධව. කරුණු දෙකක් නිසා. එකක් මේ භූමිය දුන්නොත් වෙනත් දෙයකට යොදා ගැනීමේදී ප්‍රශ්න වෙනවා. ප්‍රධාන පාසල් දෙකේ ක්‍රිකට් තරගයේදී ටෙන්ට් එකක්වත් ගහගන්න තැනක් නැති වෙනවා. කුමන හෝ පක්ෂයක දේශපාලන රැස්වීමක් තියන්නවත් තැනක් තැනි වෙනවා. එනිසා වෙනත් භූමියක් ලබා දීම සම්බන්ධව අපේ විරුද්දධත්වයක් නැහැ. ඒ බව ඒ අයට දන්වන්න. ඒ සඳහා අපි සහයෝගය ලබා දෙනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මමත් මෙතුමාගෙ කතාවට එකග වෙනවා. මෙතුමා කිව්ව තීරණයක් ගත්තා කියලා ක්‍රීඩා පිටිය මැද ආදාහන කටයුතු සිදු නොකිරීමට. අපේ මීට පෙර ගත්ත සභා තීරණයක් තියෙනවා ක්‍රීඩා පිටිය තුල ආදාහන කටයුතු සිදු නොකිරීම සම්බන්ධව. සභාපතිතුමනි, මමත් මේ ඉල්ලීමට පෞද්ගලිකව විරුද්ධයි. අම්බලන්ගොඩ නගරයට මෙම දෙපල ලොකු සේවයක් කරල තියෙනවා. ඒවගේම මුළු රටේම සහ ලෝකයේම මෙම දෙපල නමක් දිනාගෙන තියෙන දෙපලක්. අම්බලන්ගොඩට ඒක ගෞරවයක්. අපි ඒ ගෞරවය එතුමාලට පුද කරනවා. නමුත් සභාපතිතුමනි අම්බලන්ගොඩට මීට වඩා සේවය කරපු අය ඉන්නවා. අනගාරික රයිටර් තිලකසේකර මැතිතුමා තමයි අම්බලන්ගොඩට වතුර දුන්නෙ. කුලරත්න ඉස්කෝලෙ හැදුවෙ, තල්ගස්ගොඩ බස් ඩිපෝව හැදුවෙ. මේව කරේ අම්බලන්ගොඩ නගරයට. මම හිතනවා සභාපතිතුමනි එතුමාගේ ආදාහන කටයුතු කරපු ස්ථානයේ වෙනත් කෙනෙකුගේ පිළිරුවක් සෑදීම සදාචාර සම්පන්න නැහැයි කියලා. එනිසා අපි යෝජනාවක් ගෙන එමු කුලරත්න විද්‍යාලය එතුමාගෙ නමින් තියෙන්නෙ. ඒ පිළිරුව ඒ පාසලේ ඇති කරන්න අපේ සහයෝගය දෙමු. එනිසා මෙය දන්වා යවන්න මෙම ස්ථානය දුන්නොත් අම්බලන්ගොඩට සේවය කරපු විශාල පිරිසක් ඉන්නවා. ඒ අයටත් දෙන්න වෙනවා කියන බව. මට මතකයි පහුගිය කාලෙ රට බේරා ගත් රණ විරුවන් වෙනුවෙන් ස්මාරකයක් හදන්න ඉල්ලීම් කරා. ඉතින් දිගින් දිගට මෙවැනි පිළිරු හදන්න ඉල්ලීම් කරොත් මේ නගරෙ තියෙන පොඩි ඉඩකඩ ප්‍රමානෙ ඉතා අපහසු කටයුත්තක් වෙනවා. එනිසා මෙම යෝජනාවට මගේ එකගතාවයක් නැති බව පවසමින් මම නිහඬ වෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී කේ. ජී. පී. දයානන්ද මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, අම්බලන්ගොඩ නගරයේ සුජාත පුත්‍රයින් දෙපලක් වන පී.ද.එස්. කුලරත්න හා එල්.එච්. මෙත්තානන්ද මැතිතුමන්ලා වෙනුවෙන් පිළිරු විතරයි නැත්තෙ. කොළඹ නගරයේ පවා පාරවල් නම් කරල තියෙනවා. අම්බලන්ගොඩ නගරයේ පමණයි මේව අඩුවෙන් තිබෙන්නේ. මෙම අඩුව සම්පූර්ණ කිරීම පිළිබඳව අපි ගෞරව සම්ප්‍රයුක්තව එකගතාවය පල කරනවා. නමුත් මේ කියන ස්ථාන පාවිච්චි නොකර ගාළු පාරට මුහුණලා වෙනත් කුමන හෝ ස්ථානයක් පාවිච්චි කිරීම සම්බන්ධව අප පක්ෂයේ එකගතාවය පල කර සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මෙම දේශප්‍රේමී සංවිධානය මගින් කරන ඉල්ලීම වැදගත් ඉල්ලීමක්. නමුත්අපි තීරණයක් අරගෙන තියෙනවා දරුවන්ට ක්‍රීඩා කිරීමට තිබෙන වටිනාම ස්ථානය වශයෙන් තමයි මෙම ක්‍රීඩා පිටිය සලකන්නෙ. කමල් මහත්මයගෙත් ඩෙනට් මහත්මයගෙත් කතා වලින් කියවුනා අම්බලන්ගොඩ හිටපු විද්වතුන් ගැන. මෙම දෙපලගේ පිළිරු වලට හදන්න අවසර දුන්නොත් තවත් බොහෝ දෙනෙකුගෙ නම් යෝජනා එන්න පුළුවන්. ඒවගේම මුළු ලංකවෙම ප්‍රථම නගරාධිපතිනිය වශයෙන් කටයුතු කල සිරිනාවතී ද සිල්වා මැතිණියගෙ නමත් ඉදිරියේදී යෝජනා වේවි. එහෙම වුනොත් ඒකත් ලොකු ප්‍රශ්නයක්. එම නිසා මෙම දෙපලට කරන ගෞරවයක් ලෙස අපි පොදු තීරණයකට ඇවිල්ලා කටයුතු කිරීම සුදුසුයි කියා කියමින් සභාව විසින් ගන්නා තීරණයකට අපගේ එකගතාවය පල කරමින් නිහඬ වෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි, මෙම දෙපල අපේ නගරයට විශාල ගෞරවයක් සිදු කරපු දෙපලක්. මෙය ලබා දුනහොත් ප්‍රථම පුරපතිනිය වන සිරිනාවතී ද සිල්වා මහත්මියගේ පිළිරුවක් ඉදිකරන්න කිව්වත් නගරයට විශාල සේවයක් කල රයිටර් තිලකසේකර මැතිතුමාගේ පිළිරුවක් ඉදි කරන්න කිව්වත් කරන්න වෙනවා. ඒවගේම නගර සභා මන්ත්‍රී ධුරයක් දරමින් සිටින අවස්ථාවේ ජීවිතක්ෂයට පත් සරත් දීප්තිචන්ද්‍ර මහත්මයගෙ පිළිරුවක් ඉදිකරන්න කිව්වත් ඒකත් කරන්න වෙනවා. මම හිතනවා මෙතුමන්ලාගේ පුද්ගලික ඉඩම් වල හෝ කුලරත්න විද්‍යාලයේ හෝ මෙම ප්‍රතිමා ඉදිකිරීම සුදුසුයි කියා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරුනි, මාධ්‍යවේදී මහතුනි දේශප්‍රේමී සංවිධානය විසින් ඉල්ලා ඇති ලිපියට අනුව මෙතුමන්ලා දේපල අම්බලන්ගොඩ නාමය රටට ලෝකයට ගෙනියන්න මහත් සේවාවක් කල පුද්ගලයන්. දේශප්‍රේමී සංවිධානය මෙතුමන්ලාගේ ප්‍රතිමා නිර්මාණය කිරීමට කටයුතු කිරිම සම්බන්ධව අපි සතුටු වෙනවා. මෙතුමන්ලාගේ සේවය අම්බලන්ගොඩ නගරයට එහාගිය රටට ලෝකයට ගිය සේවාවක්. ඒවගේම ධර්මාශෝක දේවානන්ද විද්‍යාලවලට එහා ගිය කොළඹ ආනන්ද විද්‍යාලය, නාලන්ද විද්‍යාලය, ඇල්පිටිය

ආනන්ද විද්‍යාලය වැනි විද්‍යාල වලට ගිය සේවයක් කල විදූවතුන්. එසේ බැලුවත් ඔවුන්ගේ සේවය අම්බලන්ගොඩින් එහාට තමයි සිදු වෙලා තියෙන්නෙ. අපි ඔවුන්ට ගරු කල යුතුව තිබෙනවා ඔවුන්ගේ කීර්තිනාමය නගරයට වෙසෙසින් ලැබී තිබෙන නිසා. අපි සභාවක් හැටියට ඔවුන්ට ගරු කරනවා. නමුත් මේ සියළුම මන්ත්‍රීතුමන්ලා ඉදිරිපත් කල ආකාරයට මේ කියන ඉඩම් මේ ආකාරයෙන් පිළිරූ සඳහා ලබා දුන හොත් ඉදිරියේදී අම්බලන්ගොඩින් බිහිවෙලා නගරයට අතිමහත් සේවාවක් ඉටු කරපු අනගාරික රයිටර් තිලකසේකර මැතිතුමා අපි වතුර ටික බොන්නෙත් එතුමා නිසයි. ඒ දාපු ලයින් එක දික් කර ගන්න බැරිව තියෙනවා වර්තමාන දේශපාලන නායකත්වයට. අපි දේශපාලනය මොකක් වුනත් ගරු කල යුත්තාට ගරුකල යුතුයි. එල්.සී. ද සිල්වා මහත්තයා අවුරුදු විසිගානකට එහා ධර්මාශෝක විද්‍යාලයේ කළමනාකරු ලෙස ක්‍රියා කලා. විජේවීර මහත්මයා ධර්මාශෝක විද්‍යාලයෙන් බිහිවෙලා ලෝකෙ පිළිගත්තු දේශපාලන කායකයෙක්. එහෙමනම් එවැන්නන්ගෙ පිළිරූ අනිවාර්යෙන්ම ඉදි කරන්න වෙනවනේ. ඒත් දෙන්න වෙන්නෙ අපේ ඉඩම්. අනික් කාරණාව අපි මේ ඉඩම් පවර ගත්තෙ පුද්ගලික අයිතිකරුවන්ගෙන් නගර සභාවෙ අවශ්‍යතාවයට කියලා. මේ ඉල්ලන ඉඩම ලබා දුන්න ගෙදර කෙනා අද පාරෙ හිගා කනවා. එදා තුට්ටු දෙකයි ගෙව්වෙ. වර්තමානයේ වගේ වන්දි ගෙව්වෙත් නැහැ. ඉතින් මේ දේවල සඳහා නෙමෙයි පවරා ගත්තෙ. දූ දරුවන්ගේ ක්‍රිඩා අවශ්‍යතාවයට පිට්ටනිය ලොකු කරන්න. වෙන කිසිදු හේතුවකට යොදවනවට අපි කැමති නැහැ. අපිට තවත් ඉඩ මදියි. එම නිසා සභාපතිතුමනි, සභාව සතු ඉඩම් මේ විදියට දෙන්න යන්න එපා. අනිත් එක මිලියන 10 ක් වියදම් කරන මේ සංගමයට පුළුවන් මිලියන 1 ක් වියදම් කරල ඉඩමක් අරන් මේ පිළිරූ දෙක එකතැන ඉදි කරන්න. මේ පවුල්වල ඉඩම් ඕන තරම් තියෙනවා. අපි වැඩිදුර මේ සඳහා කතා කලයුතු නැහැ. දේශප්‍රේමී සංවිධානය වැදගත් ඉල්ලීමක් තමයි සිදු කරල තියෙන්නෙ. ඒ සඳහා අපි ඔවුන්ට ගරු කරනවා. එකම දේ නගර සභාව සතු ඉඩම්වල මෙම කටයුත්ත ඉල්ලීමයි. මේ ඉල්ලීම පමණක් නෙමෙයි ඉදිරියේදී මෙවැනි ඉල්ලීම් සඳහාත් සභාව සතු ඉඩම් ලබා දීමෙන් වලකින ලෙස ඉල්ලා සිටිනවා. ඒවගේම මේ නගර සභාවෙ මීට පෙර සම්මත කරපු නීති රීති තියෙනවා. ඒ අනුව කටයුතු කරන්න කියන ඉල්ලීම කරමින් නිහඬ වෙනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මෙහිදී මම මතක් කරන්න ඕනෙ 1907 සම්මත වුන අතුරු නීතියක් තියෙනවා අම්බලන්ගොඩ නගර සභා සීමාව තුල ස්මාරක ඉදිකිරීම තහනම් කරල. ඒ නිසා තමයි අම්බලන්ගොඩ කිසිම සුසාන භූමියක ස්මාරක නැත්තෙ. අවුරුදු 111 ක් තිස්සෙ මෙය රැකගෙන ආපු ජාතියක් තමයි අම්බලන්ගොඩ ඉන්නෙ. මෙම අතුරු නීතිය නොසලකා හැරල තමයි මෙම දෙපලගේ ප්‍රතිමා ඉදිකරනවා නම් ඒ සඳහා අවසර දෙන්න වෙන්නෙ. ඒත් මෙම භූමිවල නෙමෙයි වෙනත් සුදුසු භූමියක පාරට පෙනෙන අයුරින් එය කිරීම වඩාත් සුදුසුයි. මෙම දෙපල ගමට සේවාවක් කරපු දෙපලකට වැඩිය සිංහල බෞද්ධ අධ්‍යාපනය වෙනුවෙන් මේ රටේ සුවිශාල මෙහෙයක් කරපු ඒ සඳහා කැපකිරීම් කරපු හෙන්රි ස්ටීල් ඕල්කට් තුමාගෙ දර්ශනය පිටුපසින් ඇදගෙන ගියපු ලාංකික යෝධයන් දෙදෙනෙක් තමයි පී.ද.එස්. කුලරත්න හා එල්.එච්. මෙත්තානන්ද කියන්නෙ. මේ රටේ විද්‍යාල ගණනාවක ඉංග්‍රීසීන්ගේ අධ්‍යාපනයට එරෙහිව බෞද්ධකම සිංහලකම උගන්නමින් මේ රටේ ලාංකික ශිෂ්ඨ ජාතියක් බිහිකිරීමට යම් පදනමක් දාපු පුද්ගලයො දෙදෙනෙක් තමයි පී.ද.එස්. කුලරත්න හා එල්.එච්. මෙත්තානන්ද මැතිතුමන්ලා. එනිසා මෙම ඉල්ලීම පිළිබඳව අපි අපේ ගෞරවය සුළුවෙන් හෝ අඩු කරන්න හොඳ නැහැ. අපේ සභාව විසින් මේ ඉල්ලීම වෙන ස්ථානයක කරත් අපි 1098 දි පනවපු අතුරු නීතිය යම් ප්‍රමාණයක ලිහිල් කිරීමක් මේ සභාව විසින් සිදු කල යුතු වෙනවා. ස්මාරකයක් විදියට තිබෙන්නෙ පොල්වත්තෙ ශ්‍රී බුද්ධදත්ත නායක හිමිපාණන් වහන්සේගේ පිළිරුව විතරයි . ඒ අවස්ථාවේදීත් මෙය නොසලකා හැරල තමයි ක්‍රියා කරල තියෙන්නෙ. ඒ හැර කිසිම ස්මාරකයක් නගරය තුල නැහැ. මට මතකයි රණවිරු ස්මාරකයක් ඉදිකරන්න කියල අපේ මල්ලියාවඩු උෂාන් මහත්මා මිය ගිය අවස්ථාවෙ විශාල ඉල්ලීමක් කරා. එවකට ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා පවා මට කතා කරා මේ රණවිරුවා වෙනුවෙන් සුසාන භූමියේ ස්මාරකයක් ඉදිකිරීමට අවසර දෙන්න කියලා. අපි එතුමාට පවා දැනුම් දීම් කරා අම්බලන්ගොඩ නගර සභාව කියන්නෙ 1907 ස්මාරක ඉදිකිරීම තහනම් කරපු නගර සභාවක්. එනිසා අපේ සුසාන භූමියක කිසිම ස්මාරකයක් නැහැ. ඒනිසා මේක කරන්න බැහැයි කියලා. එතුමත් මට කිව්ව හොද තීරණයක් කියල අරගෙන තියෙන්නෙ. ඇත්තටම මේ වන විට වෙනත් නගරවල සුසානභූමි වල ස්මාරක ඉදිකරල ඉදිකරල ඒව කඩල තමයි අළුතින් භූමදානයක් කරන්නෙ. ඉතින් මෙවැනි ශිෂ්ඨ සම්පන්න නීතියක් අපේ නගරයේ මීට වසර 111 කට පෙර ඉඳන් පවත්වගෙන ගිහිල්ලා තියෙනවා. අපිත් මෙය ඉදිරියට පවත්වාගෙන යා යුතුයි. එමනිසා වෙනත් ස්ථානයක මේ කටයුත්ත සිදු කිරීමට කටයුතු කරන ලෙස අපි දැනුම් දෙමු.

<u>තීරණය</u>

☞ **අම්බලන්ගොඩ නගරයේ උපත ලැබූ ශ්‍රේෂ්ඨ අධ්‍යාපනඥයින් වන පී.ද.එස්. කුලරත්න මැතිතුමාගේ ජීවමාන පිළිරුවක් නගර සභා ක්‍රීඩාංගනය ඉදිරිපිට ඉදිකිරීමටත් එල්.එච්.මෙත්තානන්ද මැතිතුමාගේ ජීවමාන ප්‍රමාණයේ ප්‍රතිමාවක් අම්බලන්ගොඩ පුස්තකාල භූමියේ නගර සභාවට මුහුණලා ඉදිකිරීමටත් අම්බලන්ගොඩ දේශප්‍රේමී සංවිධානය විසින් කරන ලද ඉල්ලීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමෙන් අනතුරුව සියලු මන්ත්‍රීවරුන්ගේ මතය අනුව මෙම ප්‍රතිමාවන් වෙනත් ස්ථානයක ඉදිකිරීම සුදුසු බවට දන්වා යවන ලෙසට සභාව ඒකමතිකව තීරණය කරන ලදී.**

**3:2** **" අම්බලන්ගොඩ නගර සංවර්ධනය සඳහා හල්වතුර ව්‍යාපෘතිය යටතේ රජයට අත්පත් කර ගත් ඉඩම් "** මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම්තුමා විසින් 2018-05-18 දාතමින් එවන ලද ලිපිය සභාගතකරන ලදී.

අම්බලන්ගොඩ නගර සංවර්ධනය සඳහා හල්වතුර ව්‍යාපෘතිය යටතේ නගර සභා අවශ්‍යතාවය මත 1989 දී අත්පත් කර ගත් අක්කර 230 කින් අක්කර 30 ක් පමණ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සංස්ථාව වෙත පවරා දී වන්දි පොළී ගෙවා අවසන් බවත්,ඉතිරි අක්කර 200 පමණ භූමි ප්‍රමාණයෙන් බහුතර ඉඩම් සඳහා වන්දි පොළී ගෙවීමටත්, සංවර්ධන කටයුතු සිදු කිරීමටත් ඇති බවත් හිමිකම් පරීක්ෂණ අවසන්ව හිමිකම සනාථ වූ ඉඩම් සඳහා වන්දි පොළී ගෙවීමට නගර සභාවට හැකියාවක් නොමැති බව නගර සභාව විසින් ලිඛිතව දන්වා ඇති අතර ඒ අනුව මෙම ඉඩම් වල භුක්තිය නාගරික සංවර්ධන අධිකාරිය වෙත භාර දීමෙන් අනතුරුව එම වන්දි පොළී ගෙවීමට අධිකාරිය විසින් එකගත්වය පල කර ඇති මුත් තවමත් එම ඉඩම්වල භුක්තිය නගර සභාව විසින් නාගරික සංවර්ධන අධිකාරිය වෙත පැවරීමක් කර නොමැති බවත් ඉඩම් හිමියන් වසර 28 ක් පමණ ගතවී ඇති හෙයින් වන්දි ඉල්ලීම නිතර සිදු කරනු ලබන බවත් එමෙන්ම නගර සභාව විසින් කැළි කසල අපහරණය සඳහා භාවිතයට ගනු ලබන මෙම ඉඩමේ අක්කර 18 ක් පමණ වන ප්‍රමාණය ඒ සඳහා වෙන්කරදී ඉතිරි ඉඩම් ප්‍රමාණයේ නිරවුල් භුක්තිය නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා දීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත් දන්වා තිබුණි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, අපේ කැළි කසල දාන ඉඩමත් ඔතන නේද? මේ ඉඩම සම්පූර්ණයෙන් දුන්නොත් අපට කැළි කසල දාන ප්‍රශ්නෙත් එනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මන්ත්‍රීතුමා ඒ අය කියන්නෙ අපි කැළි කසල දාන අක්කර 18 අපි ගාව තියාගෙන අනික් කොටස භාර දෙන්න කියලා. ඇත්තටම අපි කසල දාන ප්‍රමාණයට අපි වන්දි ගෙවන්න ඕනෙ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>

ඉඩම් වල අයිතිය හදුනගෙන අයිති අයට පමණක් වන්දි ගෙවන්න සභාපතිතුමා. නැති අයට නම් ගෙවන්න එපා. මට මතකයි අපි කුඩා කාලෙ ඔය ඉඩම් වල කට්ටිය වගා කරා එක එක දේවල් කරා. සමහර අයට ඔප්පු නැහැ. එනිසා වන්දි ගෙවද්දි අයිතිය බලන්න.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මන්ත්‍රීතුමා වන්දි ගෙවීම පිළිබද තීන්දු කරන්නෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලෙන්. අපේ අයිති ඉඩම් වගයකුත් තියෙනවා ඔතන. ඔප්පු සොයාගන්න බැරි නිසා අපි වන්දි ඉල්ලුවෙ නැහැ.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි, මේක බලන්න අත්පත් කර ගන්නෙ මොකටද කියලා. මොකක්හරි ප්ලෑන් එකක් ඇතිනෙ. අවු 28 ක් වෙලා තියෙනවා වන්දි ගෙවා ගන්න බැරුව. ඒ අයටත් අසාධාරණයක් වන්දි නොලැබීම. නාගරික සංවර්ධන අධිකාරියෙනුත් ගෙන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙනුත් ගෙන්නල ඔබතුමා පැහැදිලි සාකච්ඡාවක් කරන්න. නගරයේ සංවර්ධනය කරා යන්න තියෙන තැනක් තමයි මේක.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මන්ත්‍රීතුමා මේ ලිපිය අනුව මේ ඉල්ලීම කරන්නෙ සල්ලි ගෙවන්නම් කියල මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය. මම හිතන්නෙ මේක වෙනත් ආයෝජකයෙකුට විකුණන්න හදන්නෙ. අපි හිතන දේ නෙමෙයි මම හිතන්නෙ මෙතන වෙන්නෙ.

**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

සභාපතිතුමනි, මේක පැහැදිලිව නිරවුල් කරල මොනව හරි ක්‍රමවේදයකට යන්න. අයිතිකරුවන් හඳුනාගෙන නගර සභාවටත් කොටසක් ලබා ගත යුතුයි මෙතනදි. මොකද ඔතන නැත්තම් කුණු දාන්න තැනකුත් නැහැනෙ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි මෙහෙම කරමු නාගරික සංවර්ධන අධිකාරියෙනුයි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙනුයි ගෙන්නල අපි මන්ත්‍රී කණ්ඩායමක් දාල විපක්ෂ නායකතුමා, රාහුල මන්ත්‍රීතුමා, ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයෙකුයි, අපේ පක්ෂෙන් මන්ත්‍රීවරයෙකුයි දාල සාකච්ඡාවක් තියමු.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි, අම්බලන්ගොඩ නව නගර සැළැස්ම පිළිබඳව සංවර්ධන කමිටුවේදී නාගරින සංවර්ධන අධිකාරියෙන් ඇවිත් හිටිය නිලධාරියට අපි කිව්ව අදාල නගර සංවර්ධන සැළැස්ම ඉදිරිපත් කරන්නයි කියලා. ඔය නව නගර සැළැස්ම තුල කර්තව්‍යන් කිහිපයකුත් ඔය භූමි භාගය තුල සිදු වෙන්න පුළුවන්. අපේ නිර්මාණ ශිල්පියට කියල මම ඉදිරිපත් කරා සංස්කෘතික මධ්‍යස්ථානයක්. ඒක අගමැතිතුමාට දුන්නා. අගමැතිතුමා ඒක නාගරික සංවර්ධන අධිකාරියට යවල තියෙනවා. මේකත් ඔය සැළැස්ම තුල ඇති. අපි කියමු ඒ අයට ඉදිරිපත් කරන්න කියල මේ ඉඩම් ටිකත් දුන්නහම මේ නගරයේ සංවර්ධන ව්‍යාපෘතිය මොකක්ද කෙරෙන්නෙ කියලා. එතකොට අපි දැනුවත් වෙනවනෙ.

**ගරු නගර සභා මන්ත්‍රී කේ.ජී.පී. දයානන්ද මහතා කතා කරමින්**

සභාපතිතුමනි, මේ ලිපියෙ තියෙනවා නගර සභාවෙ අවශ්‍යතාවයට කියලා පවරා ගත්තෙ ඉඩම් ගොඩකිරීමේ මණ්ඩලය. එහෙමනම් සොයල බලන්න ඕනෙ මොකක්හරි සැළැස්මක් තිබුනද කියලා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේක පවරගෙන තියෙන්නෙ 1989 ජී.එම්.එස්. ද සිල්වා සභාපතිතුමාගෙ කාලෙ. හල්වතුර ව්‍යාපෘතිය කියල වෙනම ව්‍යාපෘතියක් නගර සභාවෙ තියෙනවා. ඔබතුමාට ඒක බලන්න පුළුවන්. මගේ හැඟීම ඒක මහවැලි යෝජනා ක්‍රමය වගේ සැළැස්මක්. ඇත්තටම ප්‍රශ්න රාශියකට මුහුණ දෙන්න වුනා. මේ දේ ගැන ආපසු හැරිල බලන්න කියන දෙයත් එක්ක තමයි අපිට යන්න වෙන්නෙ. ඇත්තටම මේ පවර ගැනීම නගර සභාවට දරන්න අමාරුයි. අක්කර 230 ක වන්දි ගෙවන එක ලෙහෙසි නැහැ. මේක දැන් නාගරික සංවර්ධන අධිකාරිය යම් ව්‍යාපාරික දෙයකට යන්න හදනව අර මිනිස්සුන්ගෙ වන්දි ගෙවන්න ඕන නිසා. ඒගොල්ලන්ගෙ සැළැස්ම අපට ගැලපෙනවද නැද්ද කියන එක අපි සාකච්ඡා කරල බලමු.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි, මේකෙ සම්පූර්ණ අයිතිය තියෙන අය සල්ලි ගත්තා. මේ අය මම දැකල නැහැ සභාවට එනවවත්.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙතන වන්දි මෙච්චරයි කියල තීන්දු කරපු අය ඉන්නවා.

ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්

මෙච්චර වන්දි ප්‍රමාණයක් මේ අය ගෙවනවයි කියන එක පිළිගන්න බෑ සභාපතිතුමා. මේගොල්ලො මේකට වෙළඳ වටිනාකමක් දීල විකුණන්න තමයි මේ හදන්නෙ. එහෙම වුනොත් අම්බලන්ගොඩ මිනිස්සුන්ට තියෙන තැනක් නැති වෙනවා සභාපතිතුමනි.ඔතන වන්දි ඉල්ලන අය 50 කට අඩු ඇති සභාපතිතුමා. අක්කර 50 ක් හෝ නගර සභාවට තියෙන්න ඕනෙ සභාපතිතුමා. ඒ නිසා ඒක තියාගෙන නිදහස් කරන්න.

ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා කතා කරමින්

සභාපතිතුමනි, ඔබතුමා මගේ හිත කියෙව්ව කියල මට හිතෙනවා. ඔබතුමා කිව්ව මේක ආයෝජකයෙකුට විකුණලා මුදල් කරල එහෙම දෙයක් ගැන. මටත් කියන්න තියෙන්නෙ එහෙම තමයි. මේ වෙලේ පිහිටීම අනුව ප්‍රදේශයෙන් ගලා එන ජලධාරාව රැකගන්න ටැංකියක් තමයි මේ. වන්දි මුදල් ගෙවන්න ඕනෙ කියන කාරණය ඉස්සරහට දාගෙන මේක කාටහරි විකුණල කඳු කපල ගෙනත් දාල මේක ගොඩකරල ගෙවල් ගහල විනාශකරන්න දෙන්න ඉඩ දෙන්න එපයි කියල මගේ අදහස. එහෙම කළොත් ඒ අවට ගෙවල් දොරවල් ගංවතුරෙන් යට වෙනවා. ඒ නිසා ඒ විනාශය වෙන්න ඉඩ දෙන්න එපා කියලා මම යෝජනා කරනවා. මේ රටේ වෙන දේවල් බැලුවම ඉඩම් විකුණනවා මහා පරිමාණයෙන්. එහෙත් කැළෑ කපනවා. එනිසා ස්වභාවික විනාශයන් වෙන්න ඉඩ නොදී මේක රැකගන්න කියල මම ඉල්ලා සිටිනවා.

ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්

මන්ත්‍රීතුමා මේකෙ ව්‍යාපෘතියෙ මැද තියෙනවා අක්කර ගානක ජලය එක්රැස් වන වැවක්. ඒ වැව සම්බන්ධ වෙනවා දූවෙ ගගට. එතනින් මෙහෙට බහින විදියට තියෙන්නෙ. ඒකයි මම කිව්වෙ අපි දන්නෙ නැති නිසා මේකෙන් කරනදේ අපි ඉල්ලමු මොකක්ද කරන්නෙ කියලා. නැත්තම් අපට පස්සෙ මේවට උත්තර දෙන්න වෙනවා.

ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්

සභාපතිතුමා, දූව ප්‍රදේශයේ පවුල් 30 ක් විතර පදිංචි වෙලා ඉන්නවා. ඒ අයට මේ වෙනතෙක් ඔප්පු ලැබිල නැහැ. ඒ අය අනවසර කියල කියන්න බැහැ. නගර සභාව මගින් ගොඩනැගිලි අයදුම්පත් අනුමත කරල තියෙනවා. අවුරුදු 20 ක විතර පදිංචියක් තියෙනවා. ඒනිසා ඒ හල්වතුර සීමාවෙ ජීවත් වන අයට ඔප්පු ලබා දීම පිළිබඳව අපි සභාව තීරණයක් ගන්න ඕනෙ. ඒ අය අමානුෂික විදියට එලවන්න බැහැ. ඒ පිළිබඳව මෙම සභාවට කටයුතු කරන්න කියා ඉල්ලීම් කරමින් ඒ සඳහා සභාපතිතුමාගේ සහ සියළුම මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

ගරු නගර සභා මන්ත්‍රීනී ඒ.ජී.ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්

සභාපතිතුමනි, මෙම ගෙවල් සඳහා අනුමැතිය නගර සභාවෙන් දුන්නද කියන එක ගැන මට ලොකු විශ්වාසයක් නැහැ.

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

මෙතනදි මේ ඉඩම් අයිති අය වෙනම ඉන්නවා. ඒ අය අපි ලගට එනවා වන්දි ඉල්ලගෙන. පදිංචිවෙලා ඉන්න අය එනවා ඔප්පු ඉල්ලගෙන. ඔප්පු දෙන්න ඉස්සෙල්ලා අයිතිකාරයන්ට සල්ලි දෙන්න ඕනෙ. ඔය දෙකම ඉෂ්ඨ කරල තමයි කරන්න පුළුවන්.

ගරු නගර සභා මන්ත්‍රීනී ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්

සභාපතිතුමනි, අපි තල්ගස්ගොඩ ඉඩම් ප්‍රශ්නෙදි කිව්ව පූර්වාදර්ශයක් කර ගන්න එපා කියලා. නමුත් ඉතින් මන්ත්‍රීතුමියත් කිව්ව වගේ මිනිස්සු ගැන හිතල ....මම කියන්නෙ මෙතනදි මිනිස්සුත් මානුෂික වුනේ නැහැබලහත්කාරයෙන් තමයි පදිංචි වුනේ. නමුත් සභාපතිතුමනි, යම් ක්‍රමවේදයක් යොදල

මේකට පිලියමක් යොදන්න කියලයි මම කියන්නෙ. සභාවට යම් ආදායමක් එනවනම් සහනයක් එනවනම් එතනදි ඔබතුමාල ගන්න තීරණයත් එක්ක මම ඉන්නව කියලයි මම කියන්නෙ.

__ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්__

සභාපතිතුමනි, ප්‍රාදේශීය ලේකම් තුමිය ඉල්ල තියෙන්නෙ මේ භූමිය නාගරික සංවර්ධන අධිකාරියට පවරනවද නැත්තම් වන්දි ගෙවනවද කියනවග. අපි වන්දි මුදල් ගෙවන්න බැහැ කියල තියෙන නිසා අපිට සිදු වෙනවා මේ තීරණ දෙකෙන් එකකට යන්න. මේ වන විට මේ අක්කර 230 වූ ඉඩමේ සඳහා ගෙවිය යුතු කුමන හෝ වන්දි ප්‍රමාණයක් තක්සේරු කරල ඇති. වන්දි ගෙවිය යුතු අය හඳුනාගෙන ඇති. අපේ නගර සභාව වෙනුවෙන් මේ ඉඩම අත්පත් කර ගන්නෙ ප්‍රාදේශීය ලේකම්තුමිය. ප්‍රාදේශීය ලේකම්තුමියට වගකීමක් තිබෙනවා ඒ වන්දි මුදල් ගෙවන්න. නමුත් අපි දන්නෙ නෑ මේ මුදල් කී දෙනෙක් ඉල්ලල තියෙනවද, කවුද ඉල්ලල තියෙන්නෙ කියලා. කාටද අයිතිය තියෙන්නෙ කියලා. මේ පිළිබඳව අපි ලිඛිතව දැනගත යුතුයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඒව ඉල්ලන්න. ඒවගේම මේ ඉඩම අපි පවර ගන්නෙ 1989 ජී.එම්.එස්. මහත්මයගෙ සභාපති කාලෙදි නගර සංවර්ධනයට. මේ අනුව නාගරික සංවර්ධන අධිකාරිය 10 අවුරුදු සැළැස්මක් හදනවා. ඒක අපිට ඉදිරිපත් කරල තියෙනවා. මේ සභාවෙ අනුමත කරල තියෙනවා. නාරික සංවර්ධන අධිකාරිය විසින් මෙහි සියළුම ක්‍රියාකාරකම් හඳුන්වා දීල තියෙනවා. 10 අවුරුදු සැළැස්ම යටතේ විශාල ව්‍යාපෘති යෝජනා කරල තියෙනවා. එතකොට මේ ඉල්ලන ඉල්ලීමට අනුව අපි බැහැර කරොත් අපිට කිසිදු අයිතියක් නැති වෙනවා කතා කරන්න අම්බලන්ගොඩ නගරයේ සංවර්ධනයට භාවිතා කිරීම පිළිබඳව. එදා ජී.එම්.එස්. මහත්මය මේ හල්වතුර ඉඩම ගොඩකරද්දි විරුද්ධ පක්ෂෙන් විරුද්ධ වෙලා අධිකරණයට ගියා. අධිකරණෙන් තීන්දුව දුන්නා මේ ඉඩම සංවර්ධනය කරනව නම් අඩි 30 ක් පළලට අඩි 10-12 ගැඹුරට ඇල සංවර්ධනය කරල අක්කර 10 ක වතුර රඳවනය වැව නිර්මාණය කරන්න කියලා. ඒ අක්කර 10 තමයි ඉතුරු කරල තියෙන්නෙ. ඉතුරු ටික තමයි 10 ක් නේවාසිකත් 10 ක් සංවර්ධන කටයුතු සඳහාත් කියල ගොඩකරේ. 10 ක් වික්කා. අනික් ටික තමයි මෙතුමා සභාපති වුන වෙලාවෙ ඉඩම් නැති අයට ගෙවල් සාදා ගැනීමට වෙන් කරල දුන්නෙ. එතනින් එහාට පහත් බිම් සංවර්ධන මණ්ඩලයවත් නාගරික සංවර්ධන අධිකාරියවත් ඒ සඳහා කටයුතු කලේ නැහැ. එදා ඉඳල තමයි මේ හිරවීම තියෙන්නෙ. වර්තමාන අපි නගර සභාව විදියට මේ භූමිය මෙහෙම්ම බැහැර කරනවද කියල ප්‍රශ්නය තියෙනවා. මට මතක හැටියට මේකෙ වන්දිය කෝටි දෙකයි. මෙය අපිට ගෙවීමට බැරි කමක්ම නැහැ. මේ භූමිය අපට අවශ්‍යයි සභාපතිතුමනි. නාගරික සංවර්ධන අධිකාරියෙන් කාටමහරි සංවර්ධන කටයුත්තක් සඳහා තමයි මේක දෙන්නෙ. ඒ අයටත් සංවර්ධනය කරන්න වෙන්නෙ උසාවි තීන්දුවට අනුව. හැබැයි සභාපතිතුමනි, නගරය මෙයින් එහාට සංවර්ධනය කරනවනම් කරන්න තියෙන්නෙ වර්ග කිලෝ මීටර් 2 ක් 3 ක් වත් නැහැ. තව අවුරුදු 20 ක් ඉදිරියට අපි මේ නගරය ගැන කල්පනා කල යුතුයි. මීට පෙර සම්මත කරපු අණ පනත් තියෙනවා අදටත් වලංගුයි. අපිටත් වගකීමක් තියෙනවා අනාගත පරපුරට මේව ඉතිරි කරන්න. මේ ඉඩම මේ ආකාරයෙන් බැහැර කරොත් ප්‍රදේශයේ තියෙන සියළු ඉඩම් ටික කැබලි වෙනවා.මම පුද්ගලිකව ඔය ප්‍රදේශයේ ඇමතිවරයෙක් එක්ක බලන්න ගියා. ධීවර ඇමති මහින්ද විජේසේකර මහත්මය ඉන්න කාලෙ. අඩි 4 ක් කැපුවහම තියෙන්නෙ වැල් වගේ. මේකෙ කිසිම වගාවක් කරන්න බැහැ. මේකෙ කරන්න තියෙන්නෙ ගොඩකරල ඉදිකිරීම් කරන එක විතරයි. අපි මේක මෙහෙම බැහැර කරොත් ගෙවල් හදන්නෙ තල්ගස්ගොඩ ඉතිරි වෙලා තියෙන කුරුදු ඉඩම් ටිකේ. එතකොට ඒ සම්පතත් නැති වෙනවා. අඩු වශයෙන් මේ ඉඩම අපි සංවර්ධනය කලොත් අක්කර තිහ තිහ හරිඅපට පුළුවන් ආකාරයට මේ නගරයට යම් ඉඩම් ප්‍රමාණයක් එකතු වෙනවා. ඒක අපේ යුතුකමක්. අපිට වන්දි මුදල එකවර ගෙවන්න වුවමනාවක් නැහැ. ඔය ඉඩම් වලින් බොහොමයක් අයිතිකරුවන් නැහැ. ඔප්පු තිරප්පු නැහැ. අනිත් එක ගරු මන්ත්‍රීවරියන් කිව්ව වගේ අහිංසක මිනිස්සු 100 ක් 200 ක් ඔය අයින් වල ගෙවල් හදාගෙන තියෙනවා. ඒනිසා අපි ප්‍රාදේශීය ලේකම්තුමියගෙන් මේ පිළිබඳ සම්පූර්ණ විස්තර අරගෙන සභාවක් විදියට අපි ගන්න තීරණය ඉස්සෙල්ලා තීරණය කරමු. ඊට පස්සෙ අර විද්වත් කතිකාවතට යමු. අපි ස්ථාවරයක ඉඳගෙන.

__තීරණය__

**අම්බලන්ගොඩ නගර සංවර්ධනය සඳහා හල්වතුර ව්‍යාපෘතිය යටතේ රජයට අත්පත් කරගත් ඉඩම් මැයෙන් ප්‍රාදේශීය ලේකම් විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සම්බන්ධයෙන් සාකච්ජා කළ සභාව මේ පිළිබඳව නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා ,ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර මහතා,එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා සහ ඩෙනට් පනියන්දුවගේ මහතා ප්‍රමුඛව අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් සහ නාගරික සංවර්ධන අධිකාරිය සමඟත් සාකච්ජා**

**කොට එම තීන්දුවෙන් පසු මේ සම්බන්ධ ඉදිරි තීන්දුවක් ගැනීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව සභාව විසින් ඒකමතිකව තින්දු කරන ලදි.**

**3:3** **" අම්බලන්ගොඩ අන්තර් යෞවන සමාජ ප්‍රාදේශීය ක්‍රීඩා උළෙල - 2018 "** මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම්තුමා විසින් එවන ලද 2018-06-20 දිනැති ලිපිය සභාගතකරන ලදී.

අම්බලන්ගොඩ අන්තර් යෞවන සමාජ ප්‍රාදේශීය ක්‍රීඩා උළෙල 2018-06-24 වන දින පැවැත්වෙන බවත් ඒ සඳහා කොඩි කණු 30 ක්, කැනපි 05 ක් හා පුටු 40 ක් මුදල් අය කිරීමකින් තොරව ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **2018.06.24 වන දින අම්බලන්ගොඩ ප්‍රජාපතී ගෝතමී බාලිකා විද්‍යාලයෙහි පැවැත්වෙන අම්බලන්ගොඩ අන්තර් යෞවන සමාජ ප්‍රාදේශීය ක්‍රීඩා උලෙල සඳහා කොඩි කණු 30 ක් , කැනපි 05 සහ පුටු 40 ක ප්‍රමාණයක් මුදල් අයකිරීමකින් තොරව ලබා දෙන ලෙස අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් කරන ලද ඉල්ලීමට අනුව මෙම භාණ්ඩ සභා අනුමැතියට යටත්ව ලබාදීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.**

03**:04** **' විහාරස්ථානයේ පිංකම් මාලාව සඳහා දායකත්වය ලබා ගැනීම'** මැයෙන් අම්බලන්ගොඩ පටබැඳිමුල්ල සිරි නිකේතාරාම විහාරස්ථානයේ විහාරාධිපති හිමියන් විසින් 2018-06- 22 දාතමින් එවන ලද ලිපිය සභාගත සභාගත කරන ලදී.

විහාරස්ථානයේ වැඩ විසූ අපවත් වී වදාළ මාදම්පේ සිරිනන්ද හිමියන්ගේ 9 වන ගුණ සමරු පිංකම 2018-07-04 දින සිට 2018-07-16 වන දින දක්වා පැවැත්වෙන බවත් ඒ සඳහා ගාලු පාර සිට විහාරස්ථානය දක්වා මාර්ගය පිරිසිදු කිරීම, කොඩි යෙදූ බට කණු මාර්ගය දෙපස සිටුවා ගැනීම සඳහා සේවක මහතුන් ලබා දීම, නගරය අවට දැන්වීම් පුවරු ප්‍රදර්ශනය සඳහා අවසර ලබා දෙන ලෙසත් ඉල්ලීම් කර තිබුණි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි, මෙම ඉල්ලීම උන්වහන්සේ මම දැනුවත් කරේ නැහැ. ගියවර වෙසක් පෝයට පැවැත්වුන ධාතු පිංකම අවස්ථාවේ නායක හාමුදුරුවො මටත් ඉල්ලීමක් කරා, ඔබතුමාටත් කරා පාර සකස් කරන්න කියලා. අපි ඒක කරා. කුණු ඇදලා දුන්නා. ඊට පස්සෙ ඔබතුමාගෙන් වැලි ලබා දෙන්න වාහනයක් ලබා දෙන්න කියල නායක හාමුදුරුවෝ ඉල්ලීමක් කරා. ඒකෙදී ඔබතුමා ලබා දෙන්න පොරොන්දු වුනා. පර්මිට් එකේ ප්‍රශ්නයක් නිසා ඒක කරන්න බැරි වුනා. ඉතින් මට කියන්න තියෙන්නෙ මේ ලිපිය සම්බන්ධව මගෙන් කිසි ඉල්ලීමක් කරේ නැහැ. එනිසා සභාවට අවශ්‍ය පරිදි කටයුතු මේකට කටයුතු කරන්න කියල මම ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මෙතනදි මාර්ගය සුද්ධ කරල දෙන එක අපි කරන්නම්. මන්ත්‍රීතුමා කොඩි කණු හිටවන්න සේවකයන් දෙන්න අමාරුයි. දැන්වීම් පුවරු ප්‍රදර්ශනයට අවසර දෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි, මේ විහාරස්ථාන වල උත්සව නිසා විශාල වශයෙන් බාධා ඇතිවෙලා තියෙනවා 5 වසර ශිෂ්‍යත්වෙ ගන්න දරුවන්ට, සාමාන්‍ය පෙළ, උසස් පෙළ විභාග ගන්න දරුවන්ට. රාත්‍රී දොළහ එක වෙනකම්ම මුළු ප්‍රදේශයටම ඇහෙන්න මේ ශබ්දය දානවා. දේවාලයකින් මේ දේ කරත් පන්සලකින් වෙන්න බැහැ. මේ සඳහා නගර සභාවෙන් අවසර නොගත්තත් පොලීසියෙන් අවසර ගතු යුතු වෙනවා. එනිසා මේව අඩුම වශයෙන් රාත්‍රි 10 ට වත් මේව ටිකක් අඩු කරන්න. මොකද දරුවන්ට

විශාල කරදරයක් මේ කරන්නෙ. ඊ වෙනකන් තියෙන්න පුළුවන් සංගීතයක් වගේ දෙයක් විතරයි. ඒක නිතරම නැහැනේ. වෙසක් පෝයට පොසොන් පෝයට පිරිතක් බණක් තිබුණට ප්‍රශ්නයක් වෙන්නෙ නැහැ. ඒ දේවල් තියෙන්න ඕනෙ. මේ විදියට සම්මාදම් කරනවා උත්සව තියෙනවා ඇත්තටම හරිම පීඩාවක්. එනිසා පොලිසිය දැනුවත් කරල අඩුම තරමේ මේ උත්සව රාත්‍රී 10 න් පස්සෙ පාලනයක් කරන්න බලන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. අයිරාංගනී ද සිල්වා මහත්මිය කතා කරමින්</u>

සභාපතිතුමනි, සිරි නිකේතාරාමය කියන්නෙ අපි අගය කල යුතු පන්සලක්. මමත් අවුරුදු ගානක් මේ පන්සලත් එක්ක කටයුතු කරා. සිරිනන්ද හාමුදුරුවොත් අපේ වැදගත් භික්ෂූන් වහන්සේ නමක්. හිටපු සීලානන්ද ලොකු හාමුදුරුවොත් වැදගත් භික්ෂූන් වහන්සේ නමක්. ඒ නිසා මම කියනවා සභාපතිතුමනි මේ පිංකම් මාලාව ඉතා වැදගත් දෙයක්. ඒ නිසා පිංකම් මාලාවට අවශ්‍ය සියළුම දේවල් සපයා දෙන්න. විභාග කරන ළමයින්ට කරදර වෙනවනම් ශබ්දෙ අඩු කරන්න ඕන වේලාවක් දාල දෙන්න. අපි මෙතන සියළු දෙනාම බෞද්ධාගම්කාරයො ඉන්නෙ. එනිසා මෙම ඉල්ලනු ලබන සියළු දේවල් මේ සඳහා ලබා දෙන්න කියල මම ඉල්ලා සිටිනවා.

<u>තීරණය</u>

**අම්බලන්ගොඩ සිරිනිකේතනාරාමයේ 2018.07.04- 2018.07.06 දින දක්වා පැවැත්වෙන ගුණ සමරු පිංකම් මාලාව සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂක වෙත විශේෂ අවධානයක් යොමු කර ගාලු මාර්ගයේ සිට විහාරස්ථානය දක්වා අවට මාර්ග පිරිසුදු කිරීමටත් ,බස්නැවතුම්පල හැර නගරය අවට දැන්වීම් පුවරු නොමිලයේ ප්‍රදර්ශනය කිරීම සඳහාත් අවසර දීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**3:5** **‘ ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ වාර්ෂික සාමාජික මුදල පිළිබඳවයි ’** මැයෙන් ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ ප්‍රධාන විධායක නිලධාරී විසින් එවා තිබූ ලිපිය සභාගතකරන ලදී.

ශ්‍රී ලංකාවේ සියළු පළාත් පාලන ආයතන එකමුතුව පිහිටුවා ඇති ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ 2018 වසරට අදාල සාමාජික මුදල වන රු. 10000/- ක් මුදලක් ගෙවීමට කටයුතු කරන ලෙස ඉල්ලා තිබුණි.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි, මේකෙන් පළාත් පාලන ආයතන වලට වැඩක් කෙරෙන්න ඕනෙ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

කරල තියෙනවනෙ.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

ඒ කරපු දේවල් මේ නවක මන්ත්‍රීවරුන්ට දැනගැනීමට කියන්න ඕනෙ. ඒකයි මම මතක් කරේ.

<u>තීරණය</u>

☞ **2018 වසර සඳහා ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයෙහි වාර්ෂික සාමාජික අරමුදල වන රු.10,000.00 ක මුදල ගෙවීම සඳහා ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**03:06** ‘ **අසරණ මළවුන් උදෙසා පිං පැමිණවීමේ පත්තානුමෝදනා දෙවනි පිංකම සඳහා පොල්වත්ත - ඕකන්ද සුසාන භූමිය සඳහා අවසර ලබා ගැනීම**’ මැයෙන් අම්බලන්ගොඩ කළුවඩුමුල්ල ශ්‍රී විජයාරාම විහාරස්ථානයේ විහාරාධිපති හිමියන් විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

කළුවඩුමුල්ල ශ්‍රී විජයාරාම විහාරස්ථානය හා ඕකන්ද ජයබෝධි විහාරය මැදිහත්ව පවත්වනු ලබන දෙවනි පත්තානු මෝදනා මහා පිංකම සඳහා සුසානභූමිය ලබා දීම සහ එය පිරිසිදු කර දීම, පුටු 200 ක් හා වතුර බවුසරය ලබා දෙන ලෙසත් ඉල්ලීම් කර තිබුණි.

<u>තීරණය</u>

**අම්බලන්ගොඩ ,කළුවඩුමුල්ල,ශ්‍රී විජයාරාම විහාරස්ථානයේ පැවැත්වෙන අම්බලන්ගොඩ අන්තර් යෞවන සමාජ ප්‍රාදේශීය ක්‍රීඩා උළෙල සඳහා කොඩි කණු 30 ක් ,කැනපි 05 සහ පුටු 40 ක ප්‍රමාණයක් මුදල් අයකිරීමකින් තොරව ලබා දෙන ලෙස අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් කරන ලද ඉල්ලීමට අනුව මෙම භාණ්ඩ සභා අනුමැතියට යටත්ව ලබාදීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**

**03:07** ‘ **ප්‍රචාරක පුවරු සඳහා අවසර ලබා ගැනීම** ’ මැයෙන් අම්බලන්ගොඩ, පෝරඹ, නො 82 හි පදිංචි අයි.බී. පසන් උදාර මහතා විසින් එවා තිබූ ලිපිය සභාගතකරන ලදී.

තමා හිරු නාලිකාව මගින් පවත්වන හිරු ස්ටාර් ගායනා තරගයට සහභාගී වන බවත් එහි ප්‍රචාරක දැන්වීම් පුවරු කීපයක් නොමිලේ ප්‍රදර්ශනය කර ගැනීම අවසර ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

**හිරු නාලිකාව මගින් පවත්වනු ලබන හිරු ස්ටාර් ගීත ගායන තරඟයේ ඉදිරියට යාම සඳහා ජනතා මතය ලබා ගැනීමේ අරමුණෙන් මුදල් අයකිරීමකින් තොරව ප්‍රචාරක පුවරු කිහිපයක් අම්බලන්ගොඩ නගරය තුල ප්‍රදර්ශනය කිරීම සඳහා පෝරඹ පදිංචි අයි.බී.පසන් උදාර මහතා විසින් කරන ලද ඉල්ලීමට අනුව මොහු අම්බලන්ගොඩ පදිංචිකරුවෙකු බවත් තරුණ ගායකයෙකු හට අතදීම වැදගත් බවත් සලකා මෙය සභා අනුමැතියට යටත්ව ඉටු කිරීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**

**3:8** ‘ **අම්බලන්ගොඩ නගරයේ අලංකරණය සඳහා ගාලු පාර දෙපස මල් වැවීමේ ව්‍යාපෘතිය** ’ මැයෙන් සංවර්ධන සහකාර (පරිසර) පී.එච්.එල්.සී. පුෂ්පරාණි මිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ නගරය අලංකරණය කිරීම සඳහා ධර්මාශෝක හන්දියේ සිට දුම්රියපොළ හන්දිය දක්වා වැටෙන් ඇතුළු පැත්තේ සහ දුම්රියපොළ හන්දිය සිට හිරේවත්ත පාලම දක්වාත්, ධර්මාශෝක හන්දියේ සිට පොලිස් ස්ථානය දක්වාත් පාර දෙපස මල් වැවීම සුදුසු බව දන්වා තිබුණි.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි, මුදල් කොහොමද? ඕකට

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මුදල් තියෙනවා ඒකට.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි, අතුරු පාරවල් දෙපැත්තත් සුද්ධ කරානම් හොදයි. කැලේ වැව්ල හොදටම. වලවල් තියෙනවා. යන්න බැහැ. කුලරත්න ඉස්කෝලෙට යන පාරෙ කොටසක් හදල කොටසක් හදල නැහැ. ඒ වගේම ඒ ගැන අවධානය යොමු කරන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අවුරුදු 3 ක් කරපු නැති ඒව දැන් අපි කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

ඔබතුමා තල්ගස්ගොඩ ඒව විතරයිනෙ හදන්නෙ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සභාපතිතුමා, මේව ගිහිල්ල බලල කියනව නම් කමක් නැහැ. මම හැමදාම සභාපතිතුමාට කියනවා මගේ පාරවල් හදන්න කියලා. ඒත් තාම කෙරිල නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත්චන්ද්‍ර ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමනි මේ මල් වැවීම රෝගයක්. ඉඩමෙ තාප්පෙ ගහනවා හරියට දශමෙට. ඊට පස්සෙ තාප්පෙට එහාපැත්තෙ මල් වවනවා. පාර කියන්නෙ සීමිත භූමි ප්‍රමාණයක්. නමුත් දැන් වාහන වැඩියි. එතකොට වෙන්නෙ මිනිස්සුන්ට කාණුවට බහින්න. දැන් කාණුවට බහින්නත් බැරි වෙනවා මල් වැවුවහම. ඒනිසා ජනතා විමුක්ති පෙරමුණ වශයෙන් මම ඉල්ලා සිටිනවා මේ රෝගයට ගොදුරු වෙන්නෙ නැතුව අම්බලන්ගොඩ නගර සභාව පවත්වගන්න කියලා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා කතා කරමින්**

සභාපතිතුමනි, මම හිතනවා මල් වැවීම නගරයට අලංකාරය ඇති කරන දෙයක් කියලා. එනිසා මෙම කටයුත්ත සිදු කරන එක හොදයි කියලා මම ප්‍රකාශ කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි මේව තියන්න පුළුවන් තැන් තියෙනවා. ජනතා විමුක්ති පෙරමුණු මන්ත්‍රීතුමා කිව්ව වගේ මේ තියෙන පටු ඉඩේ මල් පෝච්චි තිබුබොත් අඩු ගානේ මෝටර් සයිකලේවත් තියන්න බැරි වෙනවා. එනිසා සුදුසු තැන් බළල උදාහරණයක් ලෙස බස් නැවතුම්පොලේ වැටෙන් ඇතුලෙ. ඒවගේම රීගල් එකට එහා රේල් පාරයි මහ පාරයි අතර තීරුව. ඒ වගේ මිනිස්සුන්ට අවහිර නොවන තැන්වල වවන්න. ඒකට අපේ විරුද්ධතාවක් නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්**

සභාපතිතුමනි, අම්බලන්ගොඩ නගරය මල් වවල ලස්සන වෙනවනම් අපිත් කැමතියි. මම පොඩි යෝජනාවක් කරනවා අපේ ආදාහනාගාර වලත් මල් ටිකක් වවල අලංකාර කරනවනම් හොදයි. අපි යන අනෙක් ප්‍රදේශවල ආදාහනාගාර වල ලස්සනට මල් වවල තියෙනවා. එනිසා මම ඉල්ලීමක් කරනවා ආදාහනාගාර මල් වවල අලංකාර කරන්න කියලා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

සරත් මන්ත්‍රීතුමාගෙත්, ඩෙනට් මන්ත්‍රීතුමාගෙත් අදහස් අනුව අපි කටයුතු කරන්නම්. මේ සම්බන්ධයෙන් මම මතක් කරන්න ඕනෙ මීට අවුරුදු 10 කට පමණ පෙර නගර අලංකරණ ගිණුමක් ආරම්භ කරල තියෙනවා. ඒ මුදලින් තමයි අපි මේ කටයුතු කරන්නෙ.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමනි නගර අලංකරණය ඉතා වැදගත්. කොළඹ නගරය අද ඒ තැනට ගිහිල්ලා තියෙනවා. නමුත් අපි මේ කරන්න ගියහම අපිට සේවකයො 7 දෙනයි ඉන්නෙ. ඉතින් මේක කරන්න පුළුවන්ද? මම දකිනව ඔබතුමාගෙ යෝජනාව ඉතාම හොදයි. ක්‍රියාත්මක වීමේදීත් මේක ප්‍රායෝගික විය යුතුයි. නැතිනම් අපිට තමයි ජනතාවගෙන් බැනුම් අහන්න වෙන්නෙ. එනිසා සභාපතිතුමනි බස් ස්ටෑන්ඩ්

එකේ ඉදිරිපිට තිබෙන ගස් වගේ දේවල් හොදයි. අව්වටත් ඔරොත්තු දෙනවා. කැනාස් වගේ දේවල් අමාරුයි හදන්න සභාපතිතුමනි. අපි කමිටුවේදි යෝජනා කරේ රීගල් එකට එහා තියෙන බිම් තීරුවෙ මල් විකුණන අයට ස්ථාන ලබා දෙන්න. එතන ස්ථිර දෙයක් කරන්න බැහැ. මේ කටයුත්ත සිදු කරන කොට උද්‍යාන අලංකරණ කෙනකුගෙන් අහල මේ අධික තාපයට ඔරෝත්තු දෙන දූහුවිලි වලට ඔරොත්තු දෙන දේවල් ඕනෙ අපි අලංකාරය එන විදියට පැල කරන්න. ඒවගේම මෙතුමා කතා කරපු සුසාන භූමියේ තියෙන්නෙ වෙනත් ගැටළුවක්. මම ඒ අයට කතා කරා. ඒ අය කිව්වෙ වාරකන් කාලයට පැල ඔරොත්තු දෙන්නෙ නැහැ කියලා. නමුත් ඒවගෙත් වැවෙන ගස් තියෙනවා. එනිසා ඒවටත් කාගෙහරි උපදෙස් අරගෙන අවශ්‍ය විදියට කරන්න කියල ඉල්ලීම කරනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මෙහිදී මත දෙකක් තිබෙන බැවින් ඔබතුමන්ලාගේ කරුණු සැලකිල්ලට ගෙන කටයුතු කරන්නම්.

<u>තීරණය</u>

**අම්බලන්ගොඩ නගරයේ අලංකරණය වෙනුවෙන් ගාලු පාර දෙපස මල් වැවීම සඳහා පරිසර නිලධාරී විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කළ සභාව සියලු අදහස් සැලකිල්ලට ගෙන නගර අලංකරණය අවශ්‍ය කටයුත්තක් බැවින් සුදුසු තැන් තෝරා මහජනතාවට අවහිරයක් නොවන පරිදි මෙම කටයුත්ත ඉටු කිරීම සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුව මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**

3:9 ‘ **ස්වාභාවික පිහිනුම් තටාකය සඳහා ප්‍රේක්ෂකාගාරය ඉදිකිරීම - අම්බලන්ගොඩ** ’ මැයෙන් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් එවා තිබූ ලිපිය සභාගතකරන ලදී.

ස්වාභාවික පිහිනුම් තටාකය සඳහා ප්‍රේක්ෂකාගාරයක් ඉදිකිරීමට යෝජනා වී ඇති අතර එම භූමිය නගර සභාව සතු බවට අයිතිය තහවුරු කර ගැනීම අවශ්‍ය බවත් එය තහවුරු කර දීම සහ ප්‍රේක්ෂකාගාරය ඉදිකිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මෙහිදී නගර සභාව අවුරුදු 50 කට විතර උඩදි මෙතන තිබුන චේන්ජින් රූම් එකක්. සුනාමියෙන් පසු මෙතන පොඩි දූපතක් වගේ හැදුනා. එම ස්ථානයේ තමයි අපි දැන් චේන්ජින් රූම් එක ඉදි කරල තියෙන්නෙ. එතනින් තමයි ස්විමිං පූල් එකට යන්නත් තියෙන්නෙ. මේක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් මැනුම් කටයුතු කරල ගඟේ තියෙන ස්විමිං පූල් එකත් ඒ ආශ්‍රිත තිබෙන භූමියත් රජයේ පැවරුම් නියෝගයක් මගින් අම්බලන්ගොඩ නගර සභාවට පවරන්න කියල ඉල්ලීමක් කරන්න ඕනෙ.ඒ සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>

සභාපතිතුමනි, මේකට තීරණයක් ගන්න කලින් සාකච්ඡාවක් කරන්න මොකද රුහුණු සංචාරක කාර්යාංශය මලින් ප්‍රධාන අමාත්‍යතුමාගෙ ප්‍රතිපාදන මගින් ගොඩනැගිල්ලක් හදල තියෙනවා. කමිටුවක් මගින් කතා කරන්න මගේ නමත් ඇතුලත් කරන්න කියල මම ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

දැනට මේ කරන්නෙ මේ ඉඩමේ අයිතිය සනාථ කර ගැනීම සඳහා කටයුතු කිරීමයි. මෙතන පළාත් සභාවත් මුදල් වියදම් කරල තියෙනවා, අපිත් වියදම් කරල තියෙනවා. කවුරු කරත් අයිතිකාරයෙක් නැති ස්ථානයක තමයි වැඩ කරල තියෙන්නෙ. එනිසා මේකට අපි ඔප්පුවක් ලබා ගන්න ඕනෙ. ඒකයි මේකෙ මැනුම් කටයුතු කරල ඒ දේ කරන්න හදන්නෙ.

<u>තීරණය</u>

**අම්බලන්ගොඩ මාදම්පා ගඟ අසල ඇති ස්වාභාවික පිහිනුම් තටාකය සඳහා ප්‍රේක්ෂකාගාරයක් ඉදි කිරීම සම්බන්ධයෙන් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීමට සමබන්ධයෙන් සාකච්ඡා කළ සභාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් මැනුම් කටයුතු කර පිහිනුම් තටාකය සහ ඒ ආශ්‍රිත ප්‍රදේශය රජයේ පැවරුම් නියෝගය මත අම්බලන්ගොඩ නගර සභාවට පවරා දෙන ලෙස ඉල්ලීමක් කරන ලෙසටත් ඒ සම්බන්ධයෙන් සභාවට මැනුම් කටයුතු කර පැවරුම් කිරීම සඳහාත් අනුමැතිය ඉල්ලීම ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් සිදු කළ අතර ඒ සඳහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.**

3:10 **"සභාවේ ප්‍රධාන කළමනාකරණ සහකාර එස්.එන්.පී.ද සිල්වා මිය විශ්‍රාම යාම හේතුවෙන් චෙක්පත් සඳහා අත්සන් කිරීමේ බලය සහ ඉතිරි කිරීමේ ගිණුම සඳහා මුදල් ආපසු ලබා ගැනීමට අත්සන් කිරීම සඳහා බලය ලබා ගැනීමට"**ලේකම්තුමිය විසින් ඉල්ලීම් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

සභාවේ ප්‍රධාන කළමනාකරණ සහකාර එස්.එන්.පී. ද සිල්වා මිය විශ්‍රාම යාම හේතුවෙන් චෙක්පත් සඳහා අත්සන් කිරීමේ බලය සහ ඉතිරි කිරීමේ ගිණුම සඳහා මුදල් ආපසු ලබා ගැනීමට අත්සන් කිරීම වෙනුවෙන් 1 වන අත්සන සඳහා ලේකම් බී.ඒ. ධම්මිකා මිය නිවාඩු දිනවල ප්‍ර.ක.ස. මිහිරි ද සිල්වා මියටත් 2 වන අත්සන සඳහා ගිණුම් අංශ ප්‍රධානී එම්.එච්. රෝෂිණී මිය නිවාඩු අවස්ථාවලදී එස්. සී. දයාරත්සි මියටත් බලය ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

**ලේකම්තුමියවිසින්ඉදිරිපත්කරනලදඉල්ලීමවනනගරසභාවේප්‍රධානකළමණාකරණසහකාරඑස් .එන්. පී. දසිල්වාමියවිශාමයාමහේතුවෙන් චෙක්පත්අත්සන්කිරීමේබලයසහඉතිරිකිරීමේසහජංගමගිණුම්වලින්අවශ්‍යඅවස්ථාවලදීමුදල්ආපසුල බාගැනීමේබලයපළමුවනඅත්සනලේකම්බී.ඒ .ධම්මිකාමියසහඑමමහත්මියනිවාඩුඅවස්ථාවලදීප්‍රධානකළමනාකරණ සහකාර එච්. ජී. මිහිරි කාන්ති ද සිල්වාමියවෙතලබාදීමසහදෙවනඅත්සනගිණුම්අංශප්‍රධානිඑම්.එච්.රෝෂිණීමියසහඑමමහත්මියනිවාඩු අවස්ථාවලදීඑස්.සී.දයාරත්සිමියවෙතලබාදීමසඳහාගරුසභාපතිඇම්.ඩබ්.අරුණප්‍රදීප්මහතාවිසින්යෝජ නාකරනලදඅතරගරුඋපසභාපතිකමල්වැල්ලගේදසිල්වාමහතාවිසින්ස්ථිරකරනලදුවඒකමතිකවසභා සම්මතවිය.**

**(04)** යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න

**(05)** යථා පරිදි කල් දී ඇති යෝජනා

**05:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනා**
**(නිළධාරීන් විසින් සකස්කරන ලද පරිපාලන යෝජනා) :-**

**05.01.01** <u>නගර සභාවේ ලේකම් බී.ඒ. ධම්මිකා මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද පරිපාලන යෝජනාව</u>

අම්බලන්ගොඩ නගර සභාවේ එදිනෙදා පිරිසිදු කිරීම් , මාර්ග සංවර්ධන කටයුතු සඳහා දැනට සේවයේ නියුතු මාර්ග කම්කරු , සෞඛ්‍ය කම්කරු, රියදුරු සේවක මහත්ම මහත්මීන් ප්‍රමාණවත් නොවන බැවින් හා ඔවුන් නිවාඩු ලබා ගන්නා දිනවලදී එම සේවා පවත්වාගෙන යාම විශාල ප්‍රශ්නයක් වන බැවින් හා සංවර්ධන කටයුතු හා පිරිසිදු

කිරීම් නිසි පරිදි නොකිරීම හේතුවෙන් සභාව, මහජනතාවගේ අප්‍රසාදයට පත්වන බැවින් ද එමෙන්ම පරිපාලන කටයුතු වලදී ගැටළු මතුවන බැවින් ද පහත පරිදි පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය ඇතුව අනියම්, ආදේශක හෝ තාවකාලික පදනමෙන් සේවක මහතුන් බඳවා ගැනීමට සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

| | |
|---|---|
| මාර්ග කම්කරු | 10 |
| සෞඛ්‍ය කම්කරු | 10 |
| රියදුරු | 05 |

**ඉහත යෝජනාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනාකළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.**

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි, අදාල තනතුරු වලට තෝරාගත්ත අය ඉන්නව රාජකාරිමය අවශ්‍යතාවන් මත වෙනත් තැන්වලට යොදවල. එතකොට කම්කරුවො ඉන්න ඕනෙ අනුමත 20 නම් 15 ක් හරි 17 ක් හරි ඉදියි. නමුත් රාජකාරියෙ යෙදිල ඉන්නෙ 7 යි. ඉතිරි 10 ඉන්නෙ වෙනත් තනතුරුවල. එතකොට අපට ඉතාම හොදට දැනෙනවා නගර සභාවෙ දෛනික කටයුතු කරගෙන යන්න හොදටම අමාරුයි කියලා. මට ඉල්ලීමක් කරල තිබුණ මේකෙ කම්කරුවො ඉන්නව විවිධ වෘතීන්වල. සෞඛ්‍ය කම්කරුවො ඉන්නව වෙනත් වෘත්තීන් වල. සුමිත් යසරත්න ඉල්ලීමක් කරල තිබුන එයා ඉදපු තැනින් වෙනත් තැනකට මාරු කරල. 2018-02-22 පළාත් පාලන කොමසාරිස්තුමා එවපු ලිපියෙදි කියල තියෙනව අභ්‍යන්තර ස්ථානමාරුවක් සිදු කිරීමේදී සවිස්තරාත්මක වාර්තාවක් මගින් ඉල්ලන්න කියලා. සුමිත් එක්සත් ජාතික පක්ෂයට වැඩ කරපු පුද්ගලයෙක්. මම ඔබතුමාට කියනවා, එක එක පුද්ගලයාට එහෙම කරන්නෙ නැතුව රාජකාරී අවශ්‍යතාවය මත එහෙම කරනවනම් සාධාරනේට කරන්න කියලා. පළාත් පාලන කොමසාරිස්තුමාගේ නියෝගය කඩ නොකර වැරදි දේවල් කරල තියෙනවනම් ඒ දේවල් නොකරන ලෙසත් යම්කිසි පුද්ගලයෙක් රාජකාරියෙදි අයථා ලෙස වංචා කරල හොරකම්කරල නීති විරෝධී වැඩ කරල තියෙනවනම් අනිවාර්යෙන්ම විනයානුකූලවකටයුතු කරන්න පක්ෂ පාට භේද කිසි දෙයක් තියාගන්න එපා. තව තිබුණ ගැටළුවක් ඔබතුමාගෙ නම භාවිතා කරමින් නිලධාරීන්ටත් බැණ වදිනව කියලා ලසන්ත මනෝජ් කියලා කෙනෙක්. මෙහෙම වෙන්න දෙන්න එපා. මොහු කම්කරු වෘත්තියට අරගෙන අපේ වැඩ කරන ලිපිකරුවෙකුට , පරිපාලන සේවයේ ඉන්න කෙනෙකුට නොහොබිනා විදියට කතා කරොත් ඒක විශාල අවුලක්. අපිට කාගෙ සහෝදරය , කාගෙ ඥාතියා මොනව තිබුනත් අපිට වගකීමක් තියෙනවා මන්ත්‍රීවරයෙක් විදියට තීරණයක් ගන්න. මේක විනයානුකූලව පාලනය කර ගත යුතුයි. නැත්තම් ඒක ඔබතුමාටත් හොද නැහැ. අපිටත් හොද නැහැ. නගරෙටත් හොද නැහැ. එනිසා මේ කරුණු පිළිබදව ඔබතුමා අවධානය යොමු කරන්න. අනිවාර්යෙන් අපි සහයෝගය දෙනවා. මොකද අපිට විශාල සේවක පිරිසකගෙ අඩුපාඩු තියෙනවා. අපි වරිපනම් ගන්නව මිනිස්සුන්ගෙන් ඒවට අපි වැඩ කළ යුතුයි. ඒකට අපි ඔබතුමියට සහයෝගය දෙනවා. හැබැයි ඔබතුමා මම මේ කිව්ව කරුණු ගැන අවධානයට ගන්න. පහළ සේවකයන්ට දේශපාලන බලය පාවිච්චි කරල අයථා ලෙස තම නිලය පාගල වැඩ කරන්න ඉඩ තියන්න නම් එපා. මේ සිදුවීම් දිගින් දිගට වුනොත් මේ පිළිබදව අපිටත් බොහොම තදින් ක්‍රියාත්මක වෙන්න වෙනවා. අපිට තියෙන දේශපාලන බලය තුළ අපි ක්‍රියාත්මක වෙනවා බේදයකින් තොරව.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි, කර්මාන්ත අංශයේ ස්ථිර කම්කරුවන් 24 දෙනෙක් හිටියට හැමදාම වැඩ කරන්නෙ 8 ක් 9 ක් විතර. අනික් අය කොහේද ඉන්නෙ. මම හිතන්නෙ ඔබතුමා පහුගිය දවස්වල අදාල තැන් වලට දාල සේවයේ යෙදෙව්ව. ඒකට විරෝධතාවක් ඇවිල්ල තියෙනවා. බස් ස්ටෑන්ඩ් එකේ සිකුරිටි එක නැති කමෙන් එතන අයාලේ ගිය තැනක් වෙලා තියෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි, මේ බඳව ගන්න පිරිසට නගර සභාවෙන්නෙ මුදල් ගෙවන්න ඕනෙ. මේ ගාන පොඩ්ඩක් අඩු කරන්න බැරිද. දැන් ඩෙනට් මන්ත්‍රීතුමා කිව්ව වගේ මාර්ග කම්කරු ගන්නව වෙනත් තැන්වලට දානව. ඒ නිසා ඒ ක්ෂේත්‍රයටම යොදවන්න. වෙන තැන් වලට දාන්න එපා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී කේ.ජී.පී.දයානන්ද මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි, මේ කම්කරුවන් බඳවාගැනීම ගැන අපි විරුද්ධත්වයක් නැහැ. රියදුරන් බඳව ගැනීමේදී සුදුසුකම් බලල පරීක්ෂණයක් කරල ගන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රීතුමා, වෙනත් ආයතන වගේ නෙමෙයි මේවට බඳව ගන්න එක. එකක් තමයි කුණු ට්‍රැක්ටරේ එලවන්න හැම රියදුරාම කැමති නැහැ. හරිම අමාරුවෙන් තමයි අපි කෙනෙක් රඳවගෙන ඉන්නෙ. කුණු ට්‍රැක්ටරේ පටවන්න, අම්බලන්ගොඩ එක්කෙනෙක්වත් වැඩ කරන්නෙ නෑ. දුර ප්‍රදේශවලින් දරිද්‍රතාවය මත ඇවිල්ල තමයි වැඩ කරන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී කේ.ජී.පී.දයානන්ද මහතා කතා කරමින්</u>**
මම අදහස් කරේ යෝග්‍යතාවය ගැන.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අනිවාර්යෙන් ලයිසන් එක බලනවා. ස්ථිර කිරීමක් කරනව නම් සියළු දේවල් බලල තමයි කරන්නෙ. මෙහිදී ඩෙනට් මන්ත්‍රීතුමා දක්වපු කරුණු දෙක ගැන මම උත්තර දෙන්න ඕනෙ. යසරත්න කියන පුද්ගලයා එක්සත් ජාතික පක්ෂයේ ජනිත් මන්ත්‍රීතුමාට තමයි වැඩියෙන්ම වැඩ කරේ. එතුමා ඇවිත් මමත් එක්ක කතා කරා. මේ මාරු කිරීම ඇත්තටම දේශපාලන හේතු මත මාරු කරේ නැහැ. අපි මෙතෙන්ට පත් වෙලා එනකොට අපට මාර්ගවල වැඩ කිරීම සඳහා 5 දෙනෙක්වත් හිටියෙ නැහැ. යම් යම් දේශපාලන වරප්‍රසාද මත වෙන ස්ථාන වලට අනුයුක්ත කරල තිබුණා. අපි මේ මාර්ග සංවර්ධන කටයුතු ඉක්මනින් සිදු කළ යුතු නිසා ඒ අනුයුක්ත කිරීම් වලින් බැහැර කරල ඒ දේ කරා. මම එතුමාට හැබැයි පොරොන්දු වුනා මේ තදබදය අවසන් වුනහම සලකා බලන්නම් ,මෙතන කිසිම දේශපාලනයක් වෙලා නැහැයි කියල. අනික් ලිපිය සම්බන්ධයෙන් ගත්තොත් ඒක නිර්ණාමික ලිපියක්. නමුත් මම ඒ සේවකයා කැඳවල ඇහුවා. ඒ ගැන පැමිණිල්ලක් හරියට ආවොත් කටයුතු කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**
සභාපතිතුමනි, මූලික පරීක්ෂණයක්වත් කරන්න බැරිද?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මූලික පරීක්ෂණයක්වත් කරන්නෙ කොහොමද නිර්ණාමික ලිපියකට. නමක් නැති ලිපියකට මම කොහොමද පරීක්ෂණයක් කරන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි, මේ සේවකයන් බඳවා ගැනීම සම්බන්ධව අපි පූර්ණ එකඟතාවය පල කරනවා. අපේ අනුමත සේවක සංඛ්‍යාවට වඩා අඩුවෙන් තමයි දැනට ඉන්නෙ. එයිනුත් විශ්‍රාම යාමට ආසන්න අයත් ඉන්නවා , අබල දුබල අයත් ඉන්නවා. පැමිණීමේ දුර්වලතාත් තියෙනවා. අපි මන්ත්‍රීවරු 21 ක් සභාපතිතුමා සමග මේ නිලධාරීන්ට නිරන්තරයෙන් කරදර කරනවා මොකද අපි ජනතාවගෙ ඡන්දෙන් ඇවිල්ල ඉන්නෙ අපි පොරොන්දු වෙලා ඉන්නව ජනතාවට සේවය කරන්න. එක පාරක තාර දානකොට අනික් ගමේ කෙනා අහනවා ඇයි අපේ පාරට දාන්නෙ නැත්තෙ කියලා. නිලධාරිනුත් මේක පුළුවන් විදියට කරකවා ගන්න බලනවා. කෝලාස් ගෙනාවොත් දවස් 3 කින් දාන්න ඕනෙ. නැත්තම් හයි වෙනවා. එතකොට ඔක්කොම අනිත් වැඩ නවතිනවා. මේක වෙන්නෙ සේවකයො මදිකම නිසයි. අපිට හැමදාම ජනතාවට කියන්න බැහැ සේවකයන් මදිකම. මම පුද්ගලිකව මගේ මුදලින් සේවකයො ගන්න හෙව්ව. ඒත්

සොයා ගන්න බැරි වුනා. ඒ නිසා මම අපේ නිලධාරීන්ගෙන් ඉල්ලා සිටනවා අපේ සේවකයන් අදාල තැන්වලට යොදවල සේවය ජනතාවට සැපයෙන ආකාරයට කටයුතු කරන්න කියලා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි,අපි මන්ත්‍රීවරු වශයෙන් අපේ වගකීමක් වෙනවා සේවකයන්ගෙ ප්‍රශ්නත් ඔබතුමා දැනුවත් කරල යම් කිසි සාධාරණයක් කිරීම. මම දන්නව සුමිත් මහත්මයා 1991 තමයි නගර සභාවට ඇවිත් තියෙන්නෙ. ඔබතුමා ඒ මහතා සම්බන්ධව ඉදිරියේදී සාධාරණයක් ඉටු කරනව කියල කිව්ව.මම හිතන ඒ දේ ඔබතුමා කරාවි කියලා. ඒවගේම අපේ කලින් ඉදන් ඉන්න සඳුන් මහත්මයත් අළුතින් ආපු ටී.ඕ. මහත්වරු දෙදෙනත් ඇත්තටම ලොකු සේවයක් කරනවා. අපි සභාව දවසට කලින් දවසෙ ඇවිල්ල ඒ අයට ලොකු පීඩනයක් දුන්නොත් ඒ අයට ලොකු ප්‍රශ්නෙකට මුහුණ පාන්න වෙනවා. ඔබතුමාට මම මේගැන විශේෂයෙන් දැනුවත් කරන්න අවශ්‍ය වෙන්නෙ නැහැ ඔබතුමා නීතිඥ මහත්මයෙක්. ඒ නිසා ඒ උසස් තනතුරුවල ඉන්න අයට පීඩනයක් දෙන්න එපා. අම්බලන්ගොඩ ජනතාවට වැඩ කරන්න අපි ඇවිත් ඉන්නෙ. ඔබතුමාටත් ඒ වුවමනාව තියෙනවා. අපිට සභාවෙ ලේකම්තුමියගේ මේ නිලධාරීන්ගේ සහ සේවක සේවිකාවන්ගේ සහාය නැති වුනොත් මේ දේ හරියට කරන්න බැරි වෙනවා. අපි සියළු දෙනා ඉෂ්ඨ කරන්න ඇවිත් තියෙන්නෙ ජනතාවගේ ප්‍රශ්න. ඒ නිසා ඔබතුමා ඉදිරියේදී මේ ගැන සිතාබලා කටයුතු කරාවි කියන විශ්වාසය තබමින් මම නිහඬ වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ.අයිරාංගනී ද සිල්වා මහත්මිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මේ සුමිත් යසරත්න කියන සේවකයා අවුරුදු 28 ක් නගර සභාවට වැඩ කරල තියෙනවා. 2009-11-03 මාසික රැස්වීමෙදි ප්‍රධාන කළමනාකරණ සහකාර මහත්මිය කාර්යාල කාර්ය සහායකුගෙ අඩුවක් තියෙනව කියලා ඉල්ලීමක් කරල තමයි මෙතුමා ඒ තනතුරට බඳවගෙන තියෙන්නෙ. මෙතුමා විතරක් ඇයි මෙහෙම යෙදෙව්ව කියන එකයි මට තියෙන ප්‍රශ්නෙ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙතුමා දැනටත් ඉන්න මාර්ග කම්කරුවෙක්. දේශපාලනය පාවිච්චි කරල තමයි වෙනත් තනතුරකට ගිහිල්ල තියෙන්නෙ. අදාල තනතුරේ පිහිටවල තියෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ.අයිරාංගනී ද සිල්වා මහත්මිය කතා කරමින්**

මම අහන්නෙ මාර්ග කම්කරු තනතුරුවල ඉන්න අය වෙනත් තනතුරු වල නැද්ද.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

සමහර වෙලාවට ඉන්නව. දැනට සියළු දෙනා අනුයුක්ත කරල තියෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ.අයිරාංගනී ද සිල්වා මහත්මිය කතා කරමින්**

මෙයාට විතරක් කරානම් ඒක අසාධාරණයක් කියල මම කියනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙතනදි කිසිම දේශපාලන හේතුවක් මත නෙමෙයි කටයුතු කළේ. අපට මහජනතාවට අවශ්‍ය වැඩ කිරීම මතයි මේක කරල තියෙන්නෙ.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ.අයිරාංගනී ද සිල්වා මහත්මිය කතා කරමින්**

මෙතුමා මේ ලියුමෙ ලියල තියෙනවා ජයලත් ගබඩා සහායක ඉන්නව, ජගත් කුමාර විදුලි අංශෙ ඉන්නවා, සිරිපාල විදුලි අංශෙ ඉන්නවා, ප්‍රදීප් ක්‍රිෂාන්ත බැකෝ යන්ත්‍ර ක්‍රියාකරු, පසන් පුස්තකාලෙ ඉන්නවා, ප්‍රියංකර ආදාහනාගාරෙ ඉන්නව, චමින්ද ආදාහනාගාරෙ ඉන්නව, සහන් ක්‍රීඩාංගණයේ ඉන්නවා.

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

අදාල තනතුරුවල ඉන්නෙ. යසරත්න මහත්තයට බැකෝ එක එළවන්න පුළුවන්ද?

__ගරු නගර සභා මන්ත්‍රී ඊ.අයිරාංගනී ද සිල්වා මහත්මිය කතා කරමින්__

මම කියන්නෙ සභාපතිතුමා මෙතුමා අවු. 28 ක් සේවය කරපු කෙනෙක්. සාධාරණයක් කරන්න කියල මම ඉල්ලා සිටිනවා.

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

මම එතුමාට පොරොන්දු වෙලා තියෙනවා. දිගින් දිගට කරුණු දැක්වීමෙන් වෙන්නෙ අසාධාරණයක්ම තමයි.

__ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත්චන්ද්‍ර ද සිල්වා මහතා කතා කරමින්__

සභාපතිතුමනි, මම අදහසක් දක්වන්නෙ. මේ කම්කරුවන් හැටියට වැඩ කරන්න ඒ අයට මානසිකත්වයක් නැහැ. මාර්ගෙ වැඩ කරන එක පහත් මට්ටමකට වැටීමක් කියල තමයි මේගොල්ලො හිතාගෙන ඉන්නෙ. අපිට පුළුවන්නම් ඔවුන්ගේ මානසික සංවර්ධනයක් කරන්න උදව් වෙන්න අපි මන්ත්‍රීවරු හැටියට ඒ මිනිස්සු වැඩ කරන තැනකට ගිහිල්ලා පැයක් දෙකක් ඒ අයට උදව්වක් කරනවනම් මානසික වර්ධනයක් සිදු වේවි කියල මම හිතනවා.

__*තීරණය*__

**අම්බලන්ගොඩ නගර සභාවේ ලේකම් බී.ඒ.ධම්මිකා මිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව වන නගර සභාවේ එදිනෙදා පිරිසිදු කිරීම්, මාර්ග සංවර්ධන කටයුතු සඳහා දැනට සේවයේ නියුතු මාර්ග කම්කරු , සෞඛ්‍ය කම්කරු ,රියදුරු සේවක මහත්ම මහත්මීන් ප්‍රමාණවත් නොවන බැවින් හා ඔවුන් නිවාඩු ලබා ගන්නා දිනවලදී එම සේවා පවත්වාගෙන යාම විශාල ප්‍රශ්නයක් වන බැවින් හා සංවර්ධන කටයුතු හා පිරිසිදු කිරීම් නිසි පරිදි නොකිරීම හේතුවෙන් සභාව මහජනතාවගේ අප්‍රසාදයට පත්වන බැවින්ද, එමෙන්ම පරිපාලන කටයුතු වලදී ගැටළු මතුවන බැවින්ද පළාත් පාලන කොමසාරිතුමාගේ අනුමැතිය ඇතුව අනියම්,ආදේශක හෝ තාවකාලික පදනමෙන් මාර්ග කම්කරු 10 දෙනෙකු , සෞඛ්‍ය කම්කරු 10 දෙනෙකු සහ රියදුරු 05 දෙනෙකු වශයෙන් සේවක මහතුන් බඳවා ගැනීමට සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ ද සිල්වා මහතා විසින් සථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය .**

**5:2 .re uka;%Sjreka úiska bosßm;a lrk fhdackd(**

**05.02.01** __ගරු නගර සභා මන්ත්‍රී කේ.ජී.පී. දයානන්ද සිල්වා මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව__

**“ අම්බලන්ගොඩ කුලරත්න පාර සහ පොල්වත්ත රෝහල පාර, තල්ගස්ගොඩ සහ කෙරම්ණිය නගර සීමාවන් දක්වා පදිකයින් සහ පාපැදි කරුවන් ගමන් කරන මාර්ග සීමාව තුල තිබෙන බාධා, එනම්, උසට වැවී ඇති වල් තණකොළ, වර්ෂාවට සේදී හැරී ඇති තැන් , අක්‍රමවත් නිවාස පිවිසුම්, වවා ඇති මල් ගස්, සිටුවා ඇති දැන්වීම් පුවරු ආදිය ඉවත් කරන මෙන් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී ඉල්ලා සිටිමුත්**

මෙතෙක් ඉටු නොවීම නිසා එම කාරණය ලිඛිතව පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දන්වා යැවීමට පියවර ගන්නා මෙන් ගරු සභාවට යෝජනා කරමි. ''

**ඉහත යෝජනාව පිළිගත යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී කේ.ජී.පී. දයානන්ද සිල්වා මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත්චන්ද්‍ර ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදී.**

<u>ගරු නගර සභා මන්ත්‍රී කේ.ජී.පී. දයානන්ද සිල්වා මහතා කතා කරමින්</u>

මේ සම්බන්ධයෙන් කතා කරනවනම් ඔබතුමාත් දැකල ඇති පාරෙ සුදු ඉරට මෙහාටත් කැළෑ තණකොල ඇවිල්ලා. ඒව එළි පෙහෙළි කරන්න වැඩි වියදමක් යන්නෙ නැහැ. නඩත්තු කිරීමයි කරන්න ඕනෙ. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී මතක් කරත් දැන් මාස දෙකක් වෙනවා තාම කෙරිල නැහැ. පොල්වත්ත පාර තල්ගස්ගොඩ දක්වා සහ කෙරමිණිය දක්වා. මීට අමතරව මල්ගස් වවල තියෙනවා. මේව පාරෙ ගමන් කරන අයට ලොකු බාධා. කුලරත්න පාරෙම මරණ පවා සිද්ධ වුනා. එවැනි තත්වයක් තියෙන නිසා මේ මාර්ග නඩත්තු කිරීම කළ යුතුයි. ඒවගේම සමහර ව්‍යාපාරවල ඉදිරියේ තිබෙන ප්‍රචාරක පුවරු. පාරෙන් අල්ලල තමයි හිටවල තියෙන්නෙ. කුලරත්න විද්‍යාලෙ ඇරිල එන ළමයින්ට අයින් වෙන්න ඉඩක් නැහැ.පෝරඹ කන්ද මුදුන සම්පූර්ණම සෝදගෙන ගිහිල්ලා. අනිත් එක සභාපතිතුමනි අපි අහල තියෙනවා අනික් රටවල පයින් ගමන්කරන අයටයි පාපැදි කරුවන්ටයි තමයි ප්‍රමුඛතාවය දීල තියෙන්නෙ. මේව වෙනත් ප්‍රශ්නවලට විසඳුම් වෙනවා. ඒ නිසා මේ කාරණය ගැන අවධානය යොමු කරල ඉල්ලීමක් කරන්න මේ කරුණු ගැන සඳහන් කරල.

<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතාකතා කරමින්</u>

මෙම යෝජනාව මීට පෙර සම්බන්ධීකරණ කමිටුවේදි සාකච්ඡා වුන යෝජනාවක්. අපි සම්බන්ධීකරණ කමිටුවෙ අදහස් පල කරත් ක්‍රියාත්මක වෙන පාටක් නැහැ. පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය කරන කිසිම දෙයක් අපට නෙතට ගැටෙන්නෙ නැහැ. එනිසා මෙවැනි යෝජනාවක් දැමීම කාලෝචිතයි කියල මම හිතනවා. පසුගිය කාලයේදී පොල්වත්ත මංසන්ධියේ ඉලුක් වැවී තිබීම නිසා අනතුරු කීපයක් සිදු වුනා. තල්ගස්ගොඩ මාර්ගය, කෙරමිණිය මාර්ගයත් මේ ඉලුක් පදුරු වලින් වසාගෙන. අනාගතේදී මේ ප්‍රශ්න වලින් ජනතාය මුවලකටයුතු කරන්න පුළුවන්නම් වඩා හොඳයි.සභාවේ අවධානය යොමු කරල ඒ අය අවධි කරන්න කියලා ඉල්ලා සිටිනවා. දයානන්ද මන්ත්‍රීතුමාට ස්තුතිය පල කරනවා මෙවැනි යෝජනාවක් කිරීම සම්බන්ධව.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේමහතා කතා කරමින්</u>

සම්බන්ධීකරණ කමිටුවෙදි කිහිප වතාවක්ම අපි පී.ආර්.ඩී. එකේ නිලධාරීන්ට කිව්ව. ඒ අය පාලනය කරන පාරවල් වල අනතුරු රාශියක් සිදු වුනා. ඊලගට තියෙන කමිටුවට ලියුම ඇරියහම එතෙන්ට එනව පී.ආර්.ඩී. එකේ නිලධාරියත්. අනිවාර්යෙන්ම මේව විය යුතුයි කියල බලපෑම් සහිතව කියන්න ඕනෙ. මම දැක්කා කුලරත්න පාරෙ යනකොට හීන්ඇලට හැරෙන තැන පාරෙ ඉතාලියා කියල බෝඩ් එකක් ගහල. ඒකට නගර සභාවට සල්ලි ගෙවලද. මේව වලින් ප්‍රශ්න ඇති වෙනවා. අපි සභාපතිතුමනි මේක ඉදිරිපත් කරමු පී.ආර්.ඩී. එකට බලපෑම් කරන්න කියල කෙටි කාලයක් තුලදි මේක කරන්න කියලා. නැත්තම් කතා කරා විතරක් වෙනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

මම දයානන්ද මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා මේ යෝජනාව සම්බන්ධව. මෑතක දවසක් පොල්වත්ත මංසන්ධියේ තිබෙන ගරා වැටුන ගෙදරෙ තිබුණ යටලීයක් එක්ක කෙලින්ම කඩා වැටුන පාරට. එවෙලේ ආපු මෝටර් බයිසිකලයක් බේරුනේ ඉතාමත්ම අමාරුවෙන්. මමත් ඒ වෙලාවෙ එතන හිටියා. මටත් කට්ටිය ටිකක් දොස් කිව්වා. අපේ බැකෝ යන්ත්‍රයෙන් වැටුනු කොටස උස්සල තිබ්බා. ඒ ගොඩනැගිල්ල හරිම අවධානම්. එනිසා මම ඉල්ලීමක් කරනව මේකෙ අයිතිකරුවන්ටත් දැනුම් දෙන්න. මේක පාර අයිනෙන් ඉවත් කරල දෙන්න කියලා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වාමහතා කතා කරමින්</u>

මෙම යෝජනාව ඉතා කාලෝචිතයි. පළාත් සභාවට අයත් පාරවල් විශේෂයෙන්ම කුලරත්න හංදියේ ඉදල පෝරඹ හන්දිය දක්වා පාරෙ දෙපැත්තම බැවුම්. පොල්වත්ත, බටපොල මේ හැම පැත්තටම යන අය ගමන් කරන පාර මේක. පාසල් තියෙනවා , ටියුෂන් පංති විශාල සංඛ්‍යාවක් තියෙනවා පාර විශාල වශයෙන් පාවිච්චි වෙනවා. මම රාහුල මන්ත්‍රීතුමා එක්කත් කිව්වා මහ ඇමතිතුමාට කියල ඒ ප්‍රමාණෙවත් දෙපැත්ත පේමන්ට් හදන්න කියලා. අපි මේ යෝජනාවත් එක්කම ඒ ඉල්ලීමත් කරමු.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ පාරවල් වල සංවර්ධන කටයුතු වලට මුදල් වියදම් නොකර ඉන්නෙ නැහැ. මුදල් දෙනවා. මේවට ඒ අය කොන්ත්‍රාත් කාරයෙකු පත් කරනවා. මීට අවුරුදු 5 කට විතර කලින් අපට ඒක භාරගන්න කිව්වා. අපේ තියෙන වැඩත් එක්ක භාර ගැනීමේ හැකියාවක් තිබ්බෙ නැහැ. ගෙවන්නෙ රු.6000 වගේ ගානක්. දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියෙන් මේ ගෙවීම කරනවා. මේ වගේ ගාණකට කොන්ත්‍රාත්කරුවන් එන්නෙ නැහැ. මේ සල්ලි කවුරුහරි ගන්නව ඇති. එනිසා මේ ගැන සොයා බැලීමක් කරන්න. මේ යෝජනාව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට යොමු කරන්න.

<u>තීරණය</u>

**අම්බලන්ගොඩ කුලරත්න පාර සහ පොල්වත්ත රෝහල පාර, තල්ගස්ගොඩ සහ කෙරමිණිය නගර සීමාවන් දක්වා පදිකයින් සහ පාපැදි කරුවන් ගමන් කරන මාර්ග සීමාව තුල තිබෙන බාධා,එනම් ,උසට වැවී ඇති වල් තණකොළ ,වර්ෂාවට සේදී හැරී ඇති තැන් ,අක්‍රමවත් නිවාස පිවිසුම් ,වවා ඇති මල් ගස් , සිටුවා ඇති දැන්වීම් පුවරු ආදිය ඉවත් කරන මෙන් පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දන්වා යැවීමට පියවර ගන්නා ලෙස ගරු නගර සභා මන්ත්‍රී කේ.ජී.පී.දයානන්ද මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**මේ සම්බන්ධයෙන් සාකච්ජා කල සභාව 2018 ජූලි මස 09 වන දින පැවැත්වෙන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම වෙත මෙය ඉදිරිපත් කිරීම අවශ්‍ය බවට ද දැනුම් දෙන ලදි.**

**තව දුරටත් සාකච්ජා කළ සභාව මාර්ගයන්හි සිදුවන අනතුරු සම්බන්ධයෙන් විශේෂයෙන් මෑතකදී අනතුරක් සිදුවූ පොල්වත්ත මංසන්ධියේ ඇති ගරා වැටුණු ගොඩනැගිල්ල හේතුවෙන් ප්‍රධාන මාර්ගයට සිදුවී ඇති බාධක ඉවත් කිරීමට පියවර ගත යුතු බවට සභාව විසින් තීරණය කරන ලදි"**

**05.02.02** <u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව</u>

**" අම්බලන්ගොඩ හිරේවත්තේ පිහිටා ඇති මෝදර දේවාලය වැද පුදා ගැනීමට පැමිණෙන බැතිමතුන්ගේ ප්‍රයෝජනය උදෙසා වැසිකිළි පද්ධතියක් ගොඩ නැංවීමට මෙම සභාවට මම යෝජනා කර සිටිමි."**

**ඉහත යෝජනාව පිළිගත යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රීනීර්. අයිරාංගනී ද සිල්වා මහත්මිය විසින් ස්ථිර කරන ලදී.**

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතාකතා කරමින්</u>

මේක මීට පෙර සංවර්ධන කමිටුවකදි වැඩ බලන ලේකම් තුමිය හිටියෙ මෝදර දේවාල කමිටුවෙන් ඉල්ලීමක් කරා. දේවාලෙට යාබද ඉඩමක් තියෙනවා. ඒක නගර සභාවට අයිති. ඒ භූමියේ කාන්තා සහ පිරිමි වැසිකිළි පද්ධතියක් ඉදිකරන්න කියලා. පෙරහැර කාලෙට මෙය අත්‍යාවශ්‍ය දෙයක්. නගර

සභාවෙන් කරන්න පුළුවන් නම් කරන්න. නැත්තම් ගම්පෙරළිය හරහා අපි මේක කරමු. නගර සභාවෙ අනුමැතිය ඇතිව.

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්**

සභාපතිතුමනි,මෝදර දේවාලය කියන්නෙ වසර 70 ක් පමණ පැරණි දේවාලයක්. මෙතන අපි අවුරුද්දකට සැරයක් සති දෙකක පමණ කාලයක් උත්සවයක් පවත්වනවා. මෙතනට විශාල පිරිසක් පැමිණෙනවා. එනිසයි මේ ඉල්ලීම කරේ. මම මතක් කරන්න ඕනෙ මේ ඉඩම පී.එච්. විලියම් සිල්වා මහතා දේවාලෙට මේ ඉඩම දුන්නෙ. මම දේවාල කමිටුවේ සභාපති ඉන්න කාලෙ ඉල්ලීමක් කරා දේවාල භූමියේ ඉන්න අයට ඉඩම් ලබා දෙන්න කියලා. ඊට පස්සෙ ඒක කෙරුණෙ නැහැ. වර්තමාන නගර සභාවෙ සභාපතිතුමා තමයි දේවාල භූමියේ හිටපු අයට හල්වතුරෙන් ඉඩම් දීල ඒ භූමිය නගර සභාවට පවරා ගත්තෙ. භූමිය නගර සභාවට අයිති නිසා සභාව මගින්ම මේ වැසිකිළි පද්ධතිය හදල දෙන්න කියලා ඉල්ලනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත්චන්ද්‍ර ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමනි, මට අදහස් දෙකක් දක්වන්න තියෙනවා. මේක පුණ්‍යායතනයක් විදියට මම හිතන්නෙ මේක පවත්වගෙන යන්නෙ. එහෙම වුනොත් ඉදිරියේදී අපට වෙනත් පුණ්‍යායතන පන්සල් වලින් එහෙම ප්‍රශ්නයක් ආවොත් මොකද කරන්නේ?මම මේ සෝභිත මන්ත්‍රීතුමාට විරුද්ධව යනව නෙමෙයි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නෑ මේ භූමිය නගර සභා භූමියක්.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මේක නගර සභා දේපලක්. නගරයට තියෙන ලොකුම දේවාලය. විශේෂයෙන්ම ධීවර ජනතාව වැද පුදා ගන්න ස්ථානය. එනිසා අපේ වගකීමක් වෙනවා මේක හදල දෙන එක. ඒ නිසා මේ දේ ඉෂ්ට කරල දෙන්න.

**ගරු නගර සභා මන්ත්‍රීනීඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**

සභාපතිතුමනි, ඔබතුමා ඇහුව මේ ඉඩමෙ කවුරුහරි ඉන්නව නේද කියල. බැලුවහම හැම තැනම කවුරුහරි ඉන්නව. මේවට පිලියමක් නැද්ද. අර ළිදෙයි මේ ළිදෙයි හැම තැනම කවුරුහරි. ලගදිම ගෑස් කඩේ ඉඩමෙත් කවුරුහරි ගහනව ගෙයක්. ඒත් අපිට කතා කරන්න බැහැ. ඔය ලලිත් හැළඹගේ මහත්මයාලාගේ ගේ ඉස්සරහ තියෙන ඒ ඉඩම හොඳ වටිනාකමක් තියෙන තැනක්. ඒ නිසා වහාම මේ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගන්න. සභාපතිතුමා, තව පාලන කාලයක් එනකන් මේක ලිස්සල ගියහම මිනිස්සු අපිට දොස් කියාවි. ඒ එන අයටත් වදයක්. නගර සභාව සතු ඉඩම් තහවුරු කරගෙන දම්වැල් වැටක්වත් ගහල මෙය නගර සභාව සතු ඉඩමකි ඇතුල්වීම තහනම් කියල ගහන්න. මම වෙනත් නගරවල දැකල තියෙනවා එහෙම. මම යෝජනා කරනවා සභාපතිතුමා දැනවත් අපි වැරදුනු තැනින් නැවතත් පටන්ගෙන මේ ප්‍රශ්නෙ විසදන්න කියලා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතාකතා කරමින්**

සභාපතිතුමනි, ලක්ෂ්මි මන්ත්‍රීතුමියගේ යෝජනාව මම ස්ථිර කරනවා. අපි නගර සභාව සතු ඉඩම් කිසිම පක්ෂ භේදයකින් තොරව නිලධාරීන් යවල ඒව තහනුරු කරගෙන වැටවල් ගහලා ඉඩම් වෙන් කර ගන්න කියල ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ සම්බන්ධයෙන් කතා කරනවනම් මේ දේවාල භූමිය මේ තත්වයට පත් කරන්න අපි අම්බලන්ගොඩ නගර සභාවෙන් සුවිශාල පරිශ්‍රමයක් දැරුව. අපේ පාලනය කාලෙදි ඒ දේ කලේ. ඒ කාලෙ විලියම් සිල්වා මහත්මය විසින් පෞද්ගලිකව දේවාල කමිටුවට කියල එදිරිසිංහ මහත්මයත් ,

ඒවගේ තුන්දෙනෙක්ගෙ නමට ලියල තිබුණ. ඒ අනුව සියළු දෙනා එකතුවෙලා අම්බලන්ගොඩ නගර සභාවට දේවාල භූමිය තිබෙන ස්ථානය ඔප්පුවකින් පවරල දුන්නා. ඒ ස්ථානයේ ඒ වෙනකොට පවුල් 14 ක් පදිංචි වෙලා හිටියා. අපි මුලින්ම ඒ අය හල්වතුර ව්‍යාපෘතියේ පදිංචි කරල තමයි අද වෙනකොට දේවාල භූමිය මේ විදියට පත් කරේ. ඊට පස්සෙ සුනාමි ආවට පස්සෙ අපට ලෝක බැංකු ව්‍යාපෘතිය යටතේ වැසිකිළි 3 ක් හදන්න මුදල් ලැබුනා. එහිදි එකක් හදන්න යෝජනා කලේ මෙම ස්ථානයේ තමයි.ඒ කාලෙ මෙතන වැසිකිළියක් හදනවට ගමේ මිනිස්සු විරුද්ධ වුනා. දේවාලෙක වැසිකිළියක් හදන්න එපා කියලා. ඒක දැනට හදල තියෙන්නෙ ප්‍රජාපතියෙ ග්‍රවුන්ඩ් එකේ. ලක්ෂ 24 ක් ගියා මේ වැසිකිළි පද්ධති 3 හදන්න. දැනටත් ගමේ ඒ තත්වය තියෙනවද කියල සොයා බලන්න. එහෙම නැත්නම් අපි ඒක කරමු.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>

සභාපතිතුමනි, මගෙත් විශ්වාසය තියෙන්නෙ නගර සභාව සතු ඉඩම් තිබෙනව නම් අපේ මන්ත්‍රීතුමිය කිව්ව වගේ දැන්වත් ඔබතුමා මැදිහත් වෙන්න. විශේෂයෙන්ම නගර සභාව සතු ළිං දැන් පරිහරණය කරන්නෙ නැහැ කියන විශ්වාසෙන් ගොඩක් අය ඒ ප්‍රදේශවල ඉදිකිරීම් කරගෙන පදිංචි වෙනවා. ඒ නිසා අම්බලන්ගොඩ නගර සභාව සතුව තිබෙන භූමි මිනුම් කරල දම්වැල් ගහල ක්‍රියාත්මක වෙන්න කියල ඉල්ලීම මම කරනවා. ඒවගේම වැසිකිළි ගැන කතා කරනකොට මම ඊයේ ප්‍රධාන අමාත්‍යතුමා හමුවෙන්න පොල්වත්තෙ ගිය වෙලාවෙ මම ගියපු ත්‍රීරෝද රථයේ රියදුරු මහතා පෙන්නුව පොල්වත්ත වෙළඳ සංකීර්ණයේ ඇති වැසිකිළිය. අපි මෙතන අළුතින් වැසිකිළි පද්ධතියක් හදන්න හදනව. නමුත් මේව හරියට නඩත්තු වෙන්නෙ නැහැ. හරිම අපවිත්‍රයි. බට කැඩිල උතුරනව. මම ඒවෙලාවෙම පී.එච්.අයි. මහත්මයට කතා කරල එතුමව එතෙන්ට එක්කගෙන ආව. එතුමා ඒක දැක්කා. එතුමා ඔබතුමාට වාර්තා කරනව කිව්වා. ඇත්තටම අපි බදු ගන්නව නම් කඩ වැසියන්ට ඒව පාවිච්චි කරන්න පුළුවන් විදියට සාදල දෙන්න ඕනෙ. මම මේ වෙලාවෙ ඔබතුමාගෙන් ඉල්ලනව සෝභිත මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉටු කරන්න කියන ගමන්ම පොල්වත්ත ප්‍රදේශයේ තියෙන ඒ අඩුපාඩුව ඉක්මනින්ම හරිගස්සන්න කියන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රීනීඊ. අයිරාංගනී ද සිල්වා මහත්මිය කතා කරමින්</u>

සභාපතිතුමනි, වැසිකිළි ගැන කතා කර නිසා මම කියන්නෙ ප්‍රධාන බස් නැවතුම්පොලේ තියෙන වැසිකිළිය අයහපත් තත්වයේ තියෙන්නෙ. ඒක ප්‍රතිසංස්කරණය කරන්න ඕනෙ. හැම පළාතෙන්ම එන ජනතාව මේකට යනවා. මම ළඟදි මගේ යාළුවෙක් එක්ක ගියා. මට එයා කිව්ව බලන්න මේ වැසිකිළි පද්ධතිය දිහා කියලා. මේක ප්‍රතිසංස්කරණය කිරීම ඉතාම වැදගත්. මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා මෙය අළුත්වැඩියා කරන්න කියා.

<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ  මහතාකතා කරමින්</u>

සභාපතිතුමනි, මම මීට කලින් පොල්වත්තෙ වැසිකිළි පද්ධතිය ගැන ඔබතුමා දැනුවත් කරා. මම හිතන්නෙ අපේ තාක්ෂණික නිලධාරී මහතුන් ගිහිල්ල බලල තියෙන්නෙ. ඒ මහත්වරුන්ට මතක් කිරීමක් කරන්න කියල මම ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි, මේ වැඩ කරලද කියල මාස තුනෙන් තුනට හරි පසු විපරමක් කරල බලන්න. ඒකයි මේ වෙලා තියෙන්නෙ. මේ පොල්වත්තෙ එක ලොකු වියදමක් යන එකක් නෙමෙයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ  මහතාකතා කරමින්</u>

සභාපතිතුමනි, පොල්වත්තෙ වෙළඳ සංගමයේ එහා පැත්තෙ වැහිපීලි ගැලවිලා. තාක්ෂණ සේවා නිලධාරීතුමා මම දැනුවත් කරා. ඒ වතුර ඔක්කොම යන්නෙ එහා පැත්තෙ ගෙවල් වලට.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා  මහතාකතා කරමින්</u>

සභාපතිතුමනි, මෝදර දේවාලය දෙනෝදාහක් දෙනා වැඳුම් පිදුම් කරන ස්ථානයක්. එතනට වැසිකිළි පද්ධතියක් නිර්මාණය කිරීම අත්‍යාවශ්‍ය වෙනවා. හැබැයි සභාපතිතුමනි, මෙහිදී ප්‍රායෝගිකව ඇතිවන කාරණාවක් තමයි මේවා නඩත්තු කරන්නෙ කවුද කියන එක. ඒ නිසා මෝදර දේවාල කමිටුවට හෝ ඒක භාර දෙන්න කියන ඉල්ලීම මම කරනවා. ඊට අමතරව මම කෙටියෙන්ම දෙයක් කියන්නම් ළිං 33 ක් අයිතියි මේ නගර සභාවට.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතාකතා කරමින්</u>

සභාපතිතුමනි, අපි මේක පාවිච්චි කරන්නෙ දවස් දෙකයි. ගමේ කාටවත් පාවිච්චි කරන්න දෙන්නෙ නැහැ. ඒකෙ වගකීම මම භාර ගන්නවා.

<u>තීරණය</u>

☞ **අම්බලන්ගොඩ හිරේවත්ත පිහිටා ඇති මෝදර දේවාලය වැඳ පුදා ගැනීමට පැමිණෙන බැතිමතුන්ගේ ප්‍රෙයෝජනය උදෙසා වැසිකිලි පද්ධතියක් ගොඩනැංවීමට ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සඳහා ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**05.02.03** <u>ගරු නගර සභාමන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව</u>

**"අප ග්‍රාමයේ පිහිටි මහජන පුස්තකාලය පිහිටි භූමිය ප්‍රදේශයේ දානපතියෙකු වන කේ. ජී. පීටර් සිල්වා මැතිඳු විසින් පරිත්‍යාග කරනු ලදුව පරිත්‍යාගශීලීන්ගේ ආධාරෝපකාරයෙන් ගොඩනැංවූවකී.එම දේපල ප්‍රදේශයට අමිල සම්පතකි. මෙම සද් මෙහෙවර අනාගත පූර්වාදර්ශ සැපයීම සඳහා යොදාගනු පිණිස එම පුස්තකාලය දානපති කේ.ජී. පීටර් සිල්වා පුස්තකාලය නමින් නාමකරණයට ලක් කිරීම සුදුසුයැයි මේ ගරු සභාවට යෝජනා කර සිටිමි. "**

**ඉහත යෝජනාව පිළිගත යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදී.**

<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතාකතා කරමින්</u>

සභාපතිතුමනි, මේ පුස්තකාලය ඔබතුමාට මතකයි ආචාර්ය රිචඩ් පතිරණ මැතිඳුන්ගේ සුරතින් ඔබතුමන්ගේ පාලන කාලය තුලදී විවෘත වුනා. මේ භූමිය අක්කර ¼ කට ආසන්නයි. ඒවගේම කිසිදු පුවරුවක මේ පරිත්‍යාගය පිළිබඳව සඳහන් වෙන්නෙ නැහැ. මම දකිනව මේ දරුවන්ගෙත් තියෙනවා දූර්මතයක්. නගර සභාවට මෙය වටිනාකමක් නැහැ කියලා. ඔවුන් දැන් ඉදිරියේදී අපට ඊට ආසන්නතම භූමියක් නුදුරේදි පරිත්‍යාග කරා අපේ ග්‍රාමයේ තවත් වැසියෙක් ක්‍රීඩා පිටිය සඳහා. මේ ක්‍රීඩා පිටිය සඳහා යාමට ඒමට අඩි 12 ක පමණ මාර්ගයකුත් අවශ්‍ය වෙනවා. ඒ දරුවො ඒකටත් යම් නම්‍යතාවක් දක්වල තියෙනවා. මේ මාර්ගය දෙන්න. නමුත් මේ අඩුපාඩුව විටින් විට අපට මතුකරනවා. ඒ නිසා ඒකත් නිවැරදි කිරීම සඳහා එතුමන්ගේ නාමය පුස්තකාලයට යොදල ඒ අඩුව පුරවන්නයි කියල ඉල්ලා සිටිනවා.

<u>තීරණය</u>

☞ **කෙරමිණිය පින්නඳුව ග්‍රාමයේ පිහිටි මහජන පුස්තකාලය පිහිටි භූමිය ප්‍ර දේශයේ දානපතියකු වන කේ.ජී.පීටර් ද සිල්වා මැතිඳුන් විසින් පරිත්‍යාග කරන ලදුව පරිත්‍යාගශිලීන්ගේ ආධාරෝපකාරයෙන් ගොඩනැංවූවකි.එම දේපල ප්‍රෙදශයට අමිල සම්පතකි.මෙම සද් මෙහෙවර අනාගත පූර්වාදර්ශ සැපයීම සඳහා යොදාගනු පිණිස එම පුස්තකාලය දානපති කේ.ජී.පීටර් සිල්වා පුස්තකාලය නමින් නාමකරණයට ලක් කිරීම සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් කරන ලද යෝජනාව සභාව විසින් ඒකමතිකව සම්මත කරන ලදී.**

**05.02.04** <u>ගරු උප සභාපති කමල් වැල්ලගේ ද සිල්වා මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව</u>

**" හල්වතුර කසල අංගනයේ කසල තුනී කිරීම සඳහා වරින් වර විශාල මුදලක් වැය කිරීමට සිදු වන බවත් මෙවර එම මුදල ලක්ෂ 19 ට ආසන්න වන නිසාත් රු.ලක්ෂ 30 ක් පමණ ලබා දීමේදී D4E යන්ත්‍රයක් මිලදී ගත් හැකි බැවින් මහ ඇමතිතුමාගේ සහ කොමසාරිස්තුමාගේ විශේෂ අනුමැතිය යටතේ භාවිතා කරන ලද D4E යන්ත්‍රයක් මිලදී ගැනීමට යෝජනා කරන ලදී. "**

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

භාවිතා කරන ලද යන්ත්‍ර මිලදී ගැනීමට අපට අවසර දෙන්නැ.ඒකයි ගැටළුව.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ ද සිල්වා මහතා කතා කරමින්**</u>

මිලදී ගන්න පුළුවන් සභාපතිතුමා.එහෙම ගනිපු ආයතන තියෙනවා.මහ ඇමතිතුමාගේ විශේෂ අනුමැතියකින් ගන්න පුළුවන්.මම කතා කරන්නම් සභාව වෙනුවෙන් මහ ඇමතිතුමත් එක්ක.අපි කොමසාරිස් පාලනය කාළේ ලක්ෂ 60 පමණ මේ සඳහා යොදා ගෙන තියෙනවා.දැන් ලක්ෂ 19ක් වියදම් කරනවා.තව මාස 06 න් තව 19 ලක්ෂ ගාණක් වියදම් කරන්න වෙනවා.එනිසා භාවිතා කරන ලද යන්ත්‍රයක් මිලදී ගෙන අපි වසර 05 ක් භාවිතා කරත් ගැටළුවක් නෑ මෙහෙම බලන කොට. අපිට වෙ වැඩත් මේකෙන් කරගන්න පුළුවන්නේ සභාපතිතුමා.

**ඉහත යෝජනාව පිළිගත යුතු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ ද සිල්වා මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කරන ලදී.**

<u>**ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

සභාපතිතුමනි, මේ සඳහා අවසර ලබා ගන්න අපට විශේෂ හේතුවක් තියෙනවා.අපි කුණු දමන භූමිය තවමත් තියෙන්නේ අධිකරණ තීන්දුවක් මත.අධිකරණ තීන්දුව තියෙන්නේ මධ්‍යම පරිසර අධිකාරියෙත් පොලිසියෙන් සහය ඇතිව තාවකාලිකව එතන කුණු දානන් කියලා.මේ තාවකාලික අවසරයට වසර 10 ක් වෙනවා.ඒක තමයි ඇත්ත කතාව.D4E එකක් අපට අවශ්‍ය වෙන්නේ කුණු ගොඩ ගැහුනට පස්සේ.එතකොට පරිසරය දූෂණය වෙලා ඉවරයි.මොකද අද දාන කුණු අද තුනී වෙන්නැනේ.මාස 06 ට පස්සේ තමයි තුනී කරන්නේ.එතකොට තමයි මිනිස්සුන්ට ඉන්න බැරි වෙන්නේ.අපට D4E යන්ත්‍රයක් තියෙනව නම් දිනපතා කසල තුනී කරන්න පුළුවන්.ඒ අවශ්‍යතාවය බරපතලව තියෙනවා.ඒක පෙන්වා දීලා මහ ඇමතිතුමාගේ අනුමැතිය ලබා ගෙන භාවිතා කරන ලද D4E යන්ත්‍රයක් මිලදී ගන්න කියලා මං ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රමමහතා කතා කරමින්**</u>

සභාපතිතුමනි, 20 ලක්ෂ ගණනක් වැය කරලා හැදුවේ කොම්පෝස්ට් පොහොර හදන්න වැඩ පිළිවෙලක් නේද?

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මේ හදලා තියෙන්නේ යකඩ වීදුරු ප්ලාස්ටික් වෙන් කරලා ගබඩා කරන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

මේ දේ අපි අතින් කෙරෙන්නැනේ නිසියාකාරව.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මේක අපි තාම හදාගන යන ගමන් ඉන්නේ.මේ සඳහා තවත් ලක්ෂ 20 ක් අනුමත වෙලා තියෙනවා.ඒකට ඇස්තමේන්තු ඉල්ලූවට තවම ලැබුනේ නෑ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මේ යටතේම මැෂින් එකකුත් ලබා දෙන්න තියෙනවා මං හිතන්නේ.මේ කරපු දේ නිසියාකාරව කරන්නනම්. මේ යන්ත්‍රයත් ඕන වෙනවා.එනිසා මගේ විරුද්ධත්වයක් නෑ ඒ පිළිබඳ.කුණු තේරීම ඉතාම වැදගත්. ඇලවත් විනාශවෙලා තියෙන්නේ.සභාපතිතුමා වැඩ ටෙන්ඩර් කරලා කරන කොට නිසියාකාරව කරනවද කියලා බලන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී කේ.ජී. පද්මසිරි දයානන්ද මහතා කතා කරමින්</u>**

සභාපතිතුමා, කසල තේරීම මේ ක්‍රියාවලියේ අවසාන අදියර නෙවෙයි.දිරන කසල කොම්පෝස්ට් කිරීමටත් නොදිරන කසල ප්‍රතිචක්‍රීකරණය කිරීමටත් ක්‍රම වේදයක් තියෙනවද?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ සඳහා මූලික වැඩ සටහන විදියට තමයි මේක කරලා තියෙන්නේ.නොදිරන ඒවා තියෙන්නේ වීදුරු කටුයි,ප්ලාස්ටික් සහ යකඩ.ඒ දේවල් ගබඩා කරන ස්ථාන තමයි මේ හදලා තියෙන්නේ.ඒවා ක්‍රමයෙන් දියුණු කරගෙන අපි යන්න ඕන ඉදිරියට.පලමු පියවර අපි මේ ආරම්භ කරලා තියෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

කසල වෙන් කිරීම සිදු කරන්න ඕන ගෙවල් වලින්.ඒ දේ සිදු නොවීම තමයි ගැටළුව.ඒ සඳහා නිවැසියන් පෙළඹවීම නගර සභාවේ යුතුකමක්.කොළඹ නම් වෙන වෙනම කසල එකතු කරන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**
කුණු තුනී කිරීමේ අධීක්ෂණ කටයුතු කරන්නේ කර්මාන්ත අංශයෙන් ද සෞඛ්‍ය අංශයෙන්ද?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සෞඛ්‍ය අංශයෙන්

**<u>ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

නමුත් අධීක්ෂණය වෙලා තියෙන්නේ කර්මාන්ත අංශයෙන්

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මුල් කාලයේදී කළේ සෞඛ්‍ය අංශයෙන්.පසුව ඒක කර්මාන්ත අංශයෙන් භාර ගෙන තියෙනවා.ගෙවීම් පිළිබඳත් ගැටළුවක් මතුවුණා.දැන් නැවත සෞඛ්‍ය අංශයට පවරලා තියෙන්නේ.

*<u>තීරණය</u>*

**කසල ව්‍යාපෘතිය යටතේ කුණු තල්ලු කිරීමට අවශ්‍ය D4Eයන්ත්‍රය සඳහා අධික වියදමක් වැය වන බැවින් නගර සභාවට පාවිච්චි කරන ලද D4Eයන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ සහ ගරු දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතිය යටතේ ලබා ගැනීමට සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ ද සිල්වා මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුව මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(6)** **ාරක සභාවාර්තාසලකාබැලීම**

**6: 1 2018-06-20 දිනඅම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව**

## 2018 ජුනි මස 20 වන දින පුස්තකාල කමිටු වාර්තාව

| | |
|---|---|
| ▪ ගරු සභාපති | ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා |
| ▪ ගරු නගර සභා මන්ත්‍රී | ග්‍රේෂන් කෙරමිණියගේ මහතා |
| ▪ ගරු නගර සභා මන්ත්‍රී | ඩී.ධර්මදාස මහතා |
| ▪ ගරු නගර සභා මන්ත්‍රී | නන්දන රාජපක්ෂ මහතා |
| ▪ ගරු නගර සභා මන්ත්‍රී | ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා |
| ▪ ගරු නගර සභා මන්ත්‍රිනී | ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මිය |
| ▪ ගරු නගර සභා මන්ත්‍රිනී | එච්. ඉනෝකා ක්‍රිෂාන්ති මිය |
| ▪ ගරු නගර සභා මන්ත්‍රි | ධනසේන මාදුවගේ මහතා |
| ▪ කමිටු සාමාජික | එන්.එච්.ඩන්කන් ද සිල්වා මහතා |
| ▪ කමිටු සාමාජික | සුගත් හෙට්ටිආරච්චි මහතා |
| ▪ කමිටු සාමාජික | එම්.ඒ.ජයවීර මහතා |
| ▪ කමිටු සාමාජික | ජිනේන්ද්‍රවංශ ද සිල්වා මහතා |
| ▪ කමිටු සාමාජික | ටී.ඩබ්ලිව්. පියසිරි මහතා |
| ▪ කමිටු සාමාජික | ජී.ඩබ්ලිව්.ගුණසිරි මහතා |
| ▪ කමිටු සාමාජික | ටී.ඩබ්ලිව්. හරිස්චන්ද්‍ර මහතා |
| ▪ කමිටු සාමාජික | හර්බට් වීරක්කොඩි මහතා |
| ▪ ප්‍රජා සංවර්ධන නිලධාරී | ඩී.වී.තරංගි මිය |
| ▪ පුස්තකාලයාධිපති | කේ.ඩබ්ලිව්.රංජනී මානෙල් මෙනවිය |
| ▪ පුස්තකාලයාධිපති | ඩී.මහේෂා තාබ්‍රේව් මෙනවිය |
| ▪ පුස්තකාල සහායිකා | ඒ.ජී.ලක්ෂ්මී පෙරේරා මෙනවිය |
| ▪ පුස්තකාල සහායිකා | ජී.එච්.එල්.පියන්ති මෙනවිය |
| ▪ පුස්තකාල සහායිකා | ඩී.එම්.ජී.එස්.දිල්රුක්ෂි මිය |
| ▪ පුස්තකාල සහායිකා | එම්.ඩබ්ලිව්.ජිනෝකා සුමංගලි මිය |
| ▪ පුස්තකාල සහායිකා | එස්.එම්.මනෝරි චන්ද්‍රවංශ මිය |
| ▪ පුස්තකාල සහායිකා | මාලති සමන්තා ආරියසිංහ මිය |
| ▪ පුස්තකාල සහායක | ඒ.ඩබ්ලිව්.ඉන්ද්‍රදාස මහතා |

### අම්බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමා මූලාසනය දැරූ 2018/06/20 දින පැවති පුස්තකාල කමිටු වාර්තාව

- ගරු සභාපතිතුමා කමිටුවට පැමිණීමෙන් පසුව ප.ව. 2.30 ට පුස්තකාල කමිටුවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

- එතුමා විසින් කමිටුවට පැමිණි ගරු නගර සභා මන්ත්‍රීවරු කමිටු සාමාජික මහතුන් සහ ප්‍රජා සංවර්ධන නිලධාරීතුමිය සහ පුස්තකාලයාධිපතිවරියන් ඇතුළු සියලුම මහත්ම මහත්මීන් පිළිගන්නා ලදී.

- සිරිපාල මාදුවගේ මහතා කමිටුවට සහභාගී වීමට නොහැකි බව දන්වා ලිපියක් එවා තිබූ අතර සභාපතිතුමා විසින් එය කමිටුවට ඉදිරිපත් කරන ලදී.

- පුස්තකාල ප්‍රගති වාර්තා කමිටුවට ඉදිරිපත් කිරීම පළමුව සිදු කරන ලදී.

- ප්‍රධාන පුස්තකාලයේ ප්‍රගති වාර්තාව පුස්තකාලයාධිපතිනිය විසින්ද ශාඛා පුස්තකාල වල ප්‍රගතිය ඒ ඒ ශාඛා භාර පුස්තකාල සහායිකාවන් විසින් කමිටුවට ඉදිරිපත් කරන ලදී. විද්‍යුත් පුස්තකාලයේ ප්‍රගති වාර්තාව ජී.එච්. එල් .පියන්ති මෙනවිය විසින් ඉදිරිපත් කරන ලදී.

- ප්‍රගති වාර්තා වල ඇති දත්ත අනුව ඕකන්ද ශාඛා පුස්තකාලය භාවිතා කරන පාඨක පිරිස වැඩිවී ඇති බව සභාපතිතුමා කමිටුවට දන්වන ලදී.

- ජාතික කියැවීම් මාසය අරමුණු කර ගනිමින් පවත්වනු ලබන විශේෂ වැඩ සටහනේ ප්‍රධාන ආරාධිත දේශනයට ආරාධනය කරන ලද මහාචාර්ය ජේ.බී.දිසානායක මහතා ඒ සඳහා ඔක්තෝම්බර් මස 04 වන දින ලබාදුන් බව ජිනේන්ද්‍රවංශ ද සිල්වා මහතා විසින් කමිටුවට දන්වන ලදී. එහිදි ප්‍රජා සංවර්ධන නිලධාරීතුමිය විසින් ඔක්තෝම්බර් 04 වන දින වනවිට උත්සව කටයුතු සංවිධානය කිරීමට අපහසු බව කමිටුවට පැහැදිලි කරන ලදී. එනම් අගෝස්තු මාසය පාසැල් නිවාඩු කාලය බැවින්, තරග පැවැත්වීමට සිදුවන්නේ සැප්තැම්බර් මස දෙවැනි සතියේ සිට බවත්, එම තරග වලට අදාල ප්‍රශ්ණ පත්‍ර බැලීමට සහ සහතිකපත් ලිවීමටත්,තරග ප්‍රතිඵල පිළිබඳ පාසැල් දැනුවත් කිරීමට කාලය අවශ්‍ය බව පෙන්වා දෙන ලදී.

  ඒ අනුව ඒ සඳහා වෙනත් දිනයක් ලබා ගැනිමට මහාචාර්ය ජී.බී. දිසානායක මහතා සමග නැවත සාකච්ඡා කරන ලෙස ජිනේන්ද්‍රවංශ ද සිල්වා මහතාගෙන් ඉල්ලීමක් කරන ලදී.

- ජාතික කියැවීමේ මාසයේ වැඩ සටහන සංවිධානයට අවශ්‍ය ප්‍රතිපාදන සොයා ගැනීම සඳහා මේ මස සිටම ක්‍රියාත්මක වීම සුදුසු බවත් ඒ සඳහා දැනට යොදා ගෙන ඇති ක්‍රමවේදය පිළිබඳවත් සභාපතිතුමා ප්‍රජා සංවර්ධන නිලධාරීතුමියගෙන් කරුණු විමසන ලදී.

  ඒ අනුව එතුමිය පවසා සිටියේ සියලුම බැංකු හා පෞද්ගලික ආයතන වලට ලිපි මඟින් දැනුම්දීමට සුදානම් කර ඇති බවය.

- පසු ගිය මාසයේ පැවැත්වූ කමිටුවේ ප්‍රගති සමාලෝචනය කමිටුවට ඉදිරිපත් කිරීම සභාපතිතුමා විසින් සිදු කරන ලදී.

- ධර්මාශෝක විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් ප්‍රාථමික අංශයේ විෂයන්ට අදාල පොත් 43 ක ලැයිස්තුවක් එවා ඇති බව සභාපතිතුමා කමිටුවට දැන්වීමෙන් පසුව එම පොත් මිළදී ගැනීම සුදුසු බව කමිටුවේ තීරණය විය.

- ප්‍රධාන හා ශාඛා පුස්තකාල වලට අලුතින් මිළදී ගන්නා ලද පොත් බැදීමට අවශ්‍ය කටයුතු සලසන ලෙස සභාපතිතුමා දන්වන ලදී.

- හෙප්පුමුල්ල ශාඛා පුස්තකාලයේ ඇති අඩුපාඩු පිළිබඳව ගරු නගර සභා මන්ත්‍රී ඩී.ධර්මදාස මහතා කමිටුවට දන්වන ලදී. එම ශාඛා පුස්තකාලයේ ඇති අඩුපාඩු සොයා බලා ඉක්මනින් ඒවාට විසඳුම් ලබා දෙන ලෙස සභාපතිතුමා ප්‍රජා සංවර්ධන නිලධාරීතුමියට උපදෙස් ලබා දෙන ලදී.

- ඕකන්ද ශාඛා පුස්තකාලයේ ඇති අඩු පාඩු දැනට ක්‍රියාත්මක වී ඇති බවත් තිබෙන අඩුපාඩු ඉදිරියේදී අවසන් කිරීමට හැකි බව ප්‍රජා සංවර්ධන නිලධාරීතුමිය කමිටුවට දන්වන ලදී.

- පොල්වත්ත ශාඛා පුස්තකාලයේ අඩුපාඩුවක් ලෙස පවතින ජලය සහ වැසිකිලි පහසුකම් පිළිබඳ ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා සහ කමිටු සාමාජික ජී.ඩබ්ලිව්.ගුණසිරි මහතා කමිටුවට දන්වන ලදී .

- ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා පුස්තකාල කමිටුවට යෝජනාවක් ලෙස ඉදිරිපත් කලේ කෙරමිණිය ශාඛා පුස්තකාලය සහ කෙරමිණිය පෙර පාසල් ගොඩනැගිල්ල සඳහා කෙරමිණියේ පදිංචි කේ.ටී.පීටර් සිල්වා මහතා එම ගොඩනැගිලි සෑදීමට භූමිය පරිත්‍යාග කර ඇති බැවින් එම පුස්තකාලය කේ.ටී.පීටර් සිල්වා අනුස්මරණ පුස්තකාලය ලෙස නම් කරන ලෙසය.ගරු සභාපතිතුමා මේ පිළිබඳ මාසික සභා රැස්වීමට යෝජනා කර අනුමැතිය ලබා ගැනීම සුදුසු බවත් ඒ පිළිබඳ යෝජනාව මහ සභාවට ඉදිරිපත් කරන ලෙසට ගරු සභාපතිතුමා,ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතාට පවසන ලදී.

- කමිටු සාමාජික හර්බට් වීරත්කොඩි මහතා පසුගිය කමිටුවේදී තීරණය වූ පරිදි රාක්ක සෑදීමේ කටයුතු සිදුවන්නේදැයි විමසන ලදී. ඉදිරියේදී පැවැත්වෙන ටෙන්ඩර් කමිටුවට මේ පිළිබඳ යොමු කර ඇති බව සභාපතිතුමා කමිටුවට දන්වන ලදී.

- කමිටු සාමාජික ජිනේන්ද්‍රවංශ ද සිල්වා මහතා තමන් විසින්ම රචනා කරන ලද ග්‍රන්ථ දහසයක් මහජන පුස්තකාලයේ පරිහරණය සඳහා ,ගරු සභාපතිතුමා වෙත පරිත්‍යාග කරන ලදී. ගරු සභාපතිතුමා විසින් එම පොත් කට්ටලය පුස්තකාලාධිපතිතුමියට භාර දෙන ලදී.

- වෙනත් කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්වෙච්ඡාවෙන් කමිටුවට පැමිණි සියලුම මහත්ම මහත්මීන්ට ස්තූතිය ප්‍රකාශ කරමින් කමිටුවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.

.....................................
කමිටු ලේකම්
නගර සභාව අම්බලන්ගොඩ

| | |
|---|---|
| ....................................... | .................................. |
| ලේකම් | අත්සන් කළේ සභාපති |
| නගර සභාව අම්බලන්ගොඩ | නගර සභාව අම්බලන්ගොඩ |

**2018-06-20 දින පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදී.**

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතාකතා කරමින්</u>

සභාපතිතුමනි, පොල්වත්ත ශාඛා පුස්තකාලෙන් ඉල්ලීමක් කරල තියෙනවා වැසිකිළි පහසුකම් හදන්න කියලා. ඒක මේ වෙනකොට ඒක කෙරිලද?

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

පල්ලෙහා එකක් තියෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතාකතා කරමින්</u>

සභාපතිතුමනි, රාක්ක සම්බන්ධයෙන් තත්වෙ කොහොමද?

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ටෙන්ඩර් කරල තියෙන්නෙ

**ඒ අනුව2018-06-20 දින පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේවිරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය'**

**6: 2 2018-06-19දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව**

<u>පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව</u>

**<u>2018.06.19 ප.ව.2.30</u>**

__සහභාගීත්වය__

| | |
|---|---|
| **1.** ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප්. | ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව. |
| **2.** ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගරසභාව. |
| **3.** ඒ.ඩබ් ජගත් කුමාර. | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| **4.** ශ්‍රේෂන් කෙරමිණියගේ | ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව. |
| **5.** ජී.ජී රුවිනි පේෂලා | ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගරසභාව. |
| **6.** බී.ඒ ධම්මිකා. | ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව. |
| **7.** වෛද්‍ය හිමාලි විජයසිංහ | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, අම්බලන්ගොඩ. |
| **8.** එල්.එච්.බී මංජුල. | මහජන සෞඛ්‍ය පරීක්ෂක,බරවා මර්දන ඒකකය. |
| **9.** බී.එම්.යු.කේ ප්‍රනාන්දු (මහේෂ්) | මහජන සෞඛ්‍ය පරීක්ෂක ,අම්බලන්ගොඩ උතුර. |
| **10.** ඩී.එස්.ඊ ගමගේ. | පවුල් සෞඛ්‍ය සේවිකා, සෞ.වෛ.නි කාර්යාලය. |
| **11.** එම් සෙනරත්. | ප්‍රාදේශීය පරිසර නිලධාරී, මධ්‍යම පරිසර අධිකාරිය |
| **12.** ආර්.එම්.ඩබ් බන්දුල. | උ.පො. පරීක්ෂක,පොලිස් ස්ථානය,අම්බලන්ගොඩ. |
| **13.** සෝමසිරි ජයසේකර. | වරාය කලමනාකරු, ධීවර වරාය, අම්බලන්ගොඩ |
| **14.** එස්.එන් මානවඩු | ග්‍රාම නිලධාරී, 82 ඒ,හිරේවත්ත. |
| **15.** පී.එම් විජේසිංහ | තා. සේවා නිලධාරී.අම්බලන්ගොඩ නගර සභාව |
| **16.** පී.එච්.එල්.සී පුෂ්පරාණි | සංවර්ධන සහකාර.අම්බලන්ගොඩ නගර සභාව |
| **17.** එම්.ඩබ් හිරාන් සංජීව. | සෞඛ්‍ය පරිපාලක.අම්බලන්ගොඩ නගර සභාව |
| **18.** ඒ.අයි සාරංග | සෞඛ්‍ය පරිපාලක.අම්බලන්ගොඩ නගර සභාව |

**පිළිගැනීම**

ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා.සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව සඳහා පැමිණි ගරු නගර සභා මන්ත්‍රීවරුන් ඇතුළු සියළු නිලධාරී මහත්ම මහත්මීන් හා නගර සභා ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලය ඉතාමත් ගෞරවයෙන් පිළිගනුලබන බව පවසන ලදි.

| මාතෘකාව | ප්‍රකාශය කවුරුන් විසින් ද යන වග. | සාකච්ඡා වූ කරුණු. | තීරණය. |
|---|---|---|---|
| **2018.04.26දින පැවති රැස්වීමේ සාකච්ඡා වූ කරුණු සමාලෝචනය.** | | | |
| පටබැඳිමුල්ල ග්‍රාම නිලධාරී කාර්යාලයට හා වැසිකිළියට ජල පහසුකම් ලබා දීම. . | . | ජල සම්බන්ධතා ලබා දී ඇති බව. | |
| පටබැඳිමුල්ල ප්‍රජාශාලාව සඳහා පුටු 50ක් ලබා ගැනීම. | . | පුටු ලබා දී ඇති බව. | . |
| වෙරළ උද්‍යානයට වාහන ඇතුල් කිරීම වලක්වාලීම සඳහා බාධක සැකසීම. | | ඉටු කර ඇත. | |

| | | | |
|---|---|---|---|
| කළුවඩුමුල්ල ග්‍රාමීණ විද්‍යාල ක්‍රීඩා පිටියේ දැල් ආවරණ අළුත්වැඩියා කිරීම. ළමා උද්‍යානය අළුත්වැඩියා කිරීමට අදාළ ඇස්තමේන්තු සැකසීම. | | ඉටු කර නැත. | . |
| පාරට අපද්‍රව්‍ය බැහැර කරන අයට එරෙහිව නඩු පැවරීමට කටයුතු කිරීම. | | නිවේදන යැවීම ආරම්භ කර ඇති බව මහේෂ් මහතා පවසන ලදි. | |
| කොන්ක්‍රීට් කොම්පෝස්ට් බඳුන් මිලදී ගැනීම සඳහා පරිපාලන යෝජනාවක් සභාවට ඉදිරිපත් කිරීම. | | කොන්ක්‍රීට් කොම්පෝස්ට් බඳුන් මිලදී ගැනීම සඳහා සභාවේ අනුමැතිය ලැබී ඇති බව. | . |
| කසල දැමීම තහනම් දැන්වීම් පුවරු සකස් කිරීම. | | .දැන්වීම් පුවරු සැකසීමට අවශ්‍ය ද්‍රව්‍ය මිල ගණන් කැඳවා ඇත. | . |
| පටබැඳිමුල්ල සායන මධ්‍යස්ථානය අලුත්වැඩියා කිරීම. | . | එහි ඇති බඩු බාහිරාදිය ආයුර්වේද ගොඩනැගිල්ලට දමා ඇති අතර වැඩ .ආරම්භ කර නොමැත. | |
| කසල අවසන් බැහැරලන භූමියට ප්‍රවේශ මාර්ගය සකස් කිරීම. | . | කොරි පස් හා පස් සඳහා මිල ගණන් කැඳවා ඇති බව. | |
| ටැක්ටරයක බැටරිය පුපුරා ඇති බව. | ගරු සභාපති, ඇම්.ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා | බැටරිය පුපුරා ඇති බැවින් අලුතින් බැටරියක් ඉක්මණින් ලබා දෙන්න. | |
| පටබැඳිමුල්ල වෙරළ උද්‍යානයේ වැටකෙයියා පඳුරු පහළින් මුහුද පෙනෙන ආකාරයට ශුද්ධ නිරීම. | . | එම කාර්යය ඉටු කර ඇත. | |
| මුහුදු වෙරළ පවිත්‍ර කිරීම. | | මුහුදු වෙරළ පවිත්‍ර කිරීම සඳහා දිනපතා සේවකයෙක් යෙදවීම සිදු කරන බව. | |
| තානායම් භූමිය පවිත්‍ර කිරීම සඳහා දිනපතා ගැහැණු කෙනකු යෙදවීම | | ඉටු කර ඇත.. | . |

| | | | |
|---|---|---|---|
| ස්වාභාවික නාන තොටුපල යථා තත්ත්වයට පත් කර දෙන ලෙස වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යැවීම. | | ලිපිය යවා ඇත. | |
| කලුවඩුමුල්ල නාන ළිඳ අසල ජලය එක් රැස් වී තිබීම යථා තත්ත්වයට පත් කරන ලෙස ජල සම්පාදන මණ්ඩලය දැනුවත් කිරීම. | .පුෂ්පරාණි මහත්මිය | ජල සම්පාදන මණ්ඩලයේ සම්බන්ධයක් නොමැති බව ස්ථානීය පරික්ෂණයේ හෙළිදරව් වී ඇති බව. | |
| දේවානන්ද විද්‍යාලය අසල කාණුවේ අනතුරුදායක තත්ත්වය ඉවත් කිරීම සඳදහා ස්ලැබ් කැලි දැමීම.. | | .ඉටු කරමින් පවතී. | |
| හෙප්පුමුල්ලසේවාපියස දැල් ආවරණ සැකසීම, කැලෑව ශුද්ධ පවිත්‍ර කිරීම. | | .ඉටු කර නැත. | . |
| කසල දැමීම සදහාඑක් නිවසකට ප්‍රමාණවත් දැල් පෙට්ටියක් සඳහා ඇස්තමේන්තු සකස් කිරීම. | | ඉටු කර නැත. | |
| නිවාඩු දිනවල ටැක්ටරයක සුළු නඩත්තුවක් සිදු කිරීමට අවශ්‍යා උපකරණ පිළිබඳ ලැයිස්තුවක් සභාවට යොමු කිරීම | . | .ඉටු කර නැත. | . |
| අදහස් හා යෝජනා | | . | . |
| | ගරු සභාපති, ඇම්.ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා | කසල බැහැරලන ඉඩම අවට ප්‍රදේශයේ බොහෝ සෙයින් මැස්සන් සිටින බව. | |
| | මහජන සෞඛ්‍ය පරීක්ෂක මහේෂ් මහතා. | මැස්සන් සඳහා සෝල් පැක් සුදුසු බවත් හේලිස් ආයතනය වෙතින් ලබා ගතහැකි බව | සභා අරමුදල් යටතේ හේලිස් ආයතනයෙන් සෝල් පැක් ගෙන්වීම. |
| | ගරු නගර සභා මන්ත්‍රී, ජී සරත් ශ්‍රලාල් ද සිල්වා මහතා. | මාළු අපද්‍රව්‍ය සඳහා වැඩිපුර මැස්සන් බෝ වන නිසා ඒවා වෙනම වල දැමීමේ ක්‍රමයක් තිබේ නම් එමගින් කසල වෙන් කිරීමේ ආරම්බයක් ගත හැකි බව | |
| | ගරු සභාපති, ඇම්.ඩබ්ලිව්. | කු.ප.නි.ස සනත් මහතාගේ තිලකපුර පිහිටි ගොවිපලට භාර ගැනීමට ඒ | ටැක්ටර් රථ නගර සීමාවෙන් පිට යාම සඳහා සභා |

| | | | |
|---|---|---|---|
| | අරුණ ප්‍රදීප් මහතා | මහතා කැමැත්ත ප්‍රකාශ කර ඇති බැවින් එහි ගෙනා යා හැකි බව. | අනුමැතියන් ලබා ගැනීම. |
| | ගරු නගර සභා මන්ත්‍රී, ජී සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා. | ටැක්ටර් රථ සඳහා නලා සවි කිරීම අවශ්‍ය බව | නලා මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම |
| | ගරු නගර සභා මන්ත්‍රී, ඒ ඩබ් ජගත් කුමාර මහතා. | මහ අම්බලන්ගොඩ ප්‍රදේශයේ යන ටැක්ටර් රියදුරු ගලි බවුසරයේ සේවය සඳහා යෙදවීම නිසා එම ප්‍රදේශයේ කසල ගැනීම නිසි පරිදි සිදු නොවන බව. | |
| පල්ලියබඩවත්ත කසල ගැනීම නිසියාකාරව සිදු නොවන බව | | පල්ලියබඩවත්ත කසල ගැනීම නිසියාකාරව සිදු නොවන බැවින් එම ප්‍රදේශයේ කසල ගොඩ ගැසි ඇති බව.. | |
| | ගරු සභාපති, ඇම්.ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා | අත් කරත්ත යවන්නේද යන වග | |
| | සෞඛ්‍ය පරිපාලක ඒ.අයි සාරංග මහතා. | අත් කරත්ත කැඩී ඇති බව. | |
| | ගරු නගර සභා මන්ත්‍රී, ජී සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා. | අත් කරත්ත මිල දී ගැනීම සුදුසු බව. | වත්තෙගම නගර සභාවේ අත් කරත්ත හදන බැවින් එම සභාවෙන් අත් කරත්ත 5ක් මිල දී ගැනීමට කටයුතු කිරීම. |
| ධර්මාශෝක විද්‍යාලය ඉදිරිපිට පාළුවට ගිය ඉඩමේ ඇති කසල ගොඩ සම්බන්ධව. | උප පොලිස් පරීක්ෂක, ආර්. එම්. ඩබ් බන්දුල මහතා. | ධර්මාශෝක විද්‍යාලය ඉදිරිපිට පාළුවට ගිය ඉඩමේ ඇති කසල ගොඩ වරින් වර ගිනි ගන්නා බවත් එවැනි අවස්ථාවලදී ගින්න අවට ගොඩනැගිලිවලට පැතිරිය හැකි බව. | |
| | | එම ඉඩමේ අයිතිය පිළිබඳ නඩුවක් පවතින බව. | |
| | ගරු නගර සභා මන්ත්‍රී, ජී සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා | මෙම ඉඩම ධර්මාශෝක විද්‍යාලයට විශාල බලපෑමක්, ඒනිසා මෙම ඉඩම නගර සභාවට පවරා ගැනීමට අවශ්‍ය මූලික නීතිමය කටයුතු සිදු කිරීම සුදුසු බව | පවරා ගැනීමට අවශ්‍ය මූලික නීතිමය කටයුතු සිදු කරන්න. එවිට අයිතිකරුවන් ඉදිරිපත් වේවි. |
| කාණු පද්ධතිය නිතර නිතර අවහිර වන බව | සෞ.වෛ.නි වෛද්‍ය හිමාලි විජයසිංහ මිය. | කාණු පද්ධතිය නිතර නිතර අවහිර වීම නිසා ඩෙංගු අවධානමක් ඇතිවන බව. | |
| | උප පොලිස් පරීක්ෂක, ආර්. එම්. ඩබ් බන්දුල මහතා | පසුගිය වසරේ මා.සං.අධිකාරිය හා ප.මා.සං.අධිකාරියට අයත් කාණු එම ආයතනවල සහාය ඇතිව පවිත්‍ර කළ බව. | සභාව සතු වාහන හා සේවකයන් යොදාගෙන කාණු පවිත්‍ර කිරිමට කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| | ගරු නගර සභා මන්ත්‍රිනී, ජී.ජී රුවිනි පේෂලාමිය. | මහ වීදිය රාජපක්ෂ ස්ටෝර්ස් අසල කාණු ඌරු මීයන් හාරා ඇති බැවින් කාණු අවහිර වන බව. | ඌරු මීයන් හාරන ලද ස්ථාන පිළිසකර කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගෙන එම ස්ථාන ශුද්ධ කර වසා දමන ලෙස. |
| | සෞඛ්‍ය පරිපාලක හිරාන් සංජීව මහතා | විශේෂ ව්‍යාපෘති සේවක සංඛ්‍යාව 15 සිට 20 දක්වා වැඩි කිරීමට අනුමැතිය ලබා දෙන ලෙස. | |
| | | දැනට සපයන සේවාවේ ගුණාත්මකභාවය වැඩි කළ හැකිනම් හා රාත්‍රී වැඩමුරයක් සිදු කර නගරය පිරිසිදු කිරීම කළ හැකිනම් පමණක් ඉල්ලීම ඉටු කළ හැකි බව. දිනකට පැය 6ක අතිකාල ලබා දිය හැකි බවත්, පසුදා නැවත සේවයට පැමිණිය යුතු බැවින් තම රාජකාරිය නිමවූ වහාම නිවෙස්වලට යා හැකි බවත්, පසු ගිය කාල පරිච්ඡේදය තුළ වැඩිපුර අතිකාල ලබා ගෙන ඇති බැවින් ඒවා වැටුපෙන් අඩු කරන ලෙස උපදෙස් දී ඇති බව. | |
| බෝක්කු අලුත්වැඩියා කළ යුතු බව. | ගරු නගර සභා මන්ත්‍රී, ශ්‍රේෂන් කෙරමිණියගේ. | කෙරමිණිය ප්‍රදේශයේ පළාත් සභා මාර්ගයේ සිට පතහ පාර, දිස්නි පාරයන මාර්ගවලට හැරෙන ස්ථානවල පිහිටි බෝක්කු අලුත්වැඩියා කළ යුතු බව. | |
| | ගරු නගර සභා මන්ත්‍රී, ජී සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා | කරිත්තකන්ද පන්සල අසල මාර්ගයේ සිට සක්වා ප්‍රින්ටර්ස් දෙසට යන මාර්ගයට හැරෙන ස්ථානයේ පිහිටි බෝක්කුව අලුත්වැඩියා කළ යුතු බව. | එම බෝක්කු අලුත්වැඩියා කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කළ යුතු බව. |
| වරාය භූමිය තුළ විශාල වලවල් සෑදී ඇති බව හා පයිබර් කැබලි විශාල වශයෙන් ගොඩගැසී ඇති බව. | වරාය කලමනාකරු සෝමසිරි ජයසේකර මහතා. | වරාය භූමිය තුළ විශාල වලවල් සෑදී ඇති බවත්, එමගින් ඩෙංගු අවධානමක් පවතින බවත්, ඒවා වැසීමට අවශ්‍ය වැලි නොමැති බව. හා පයිබර් කැබලි විශාල වශයෙන් ගොඩගැසී ඇති අතර ඒවා බැහැර කිරීමට ක්‍රම වේදයක් නොමැති බව. | වරායට වැලි ලබා දිය හැකි නම් කසල බැහැරලන භූමියේ වල දමා වැසිය හැකි බව. |
| පටබැඳිමුල්ල පොදු නාන ළිඳ පවිත්‍ර කිරීම. | ගරු නගර සභා මන්ත්‍රිනී, ජී.ජී රුවිනි පේෂලා මිය. | පටබැඳිමුල්ල ග්‍රාම නිලධාරී වීමා ගාල්ලගේ මෙනවියගේ නිවස අසල පිහිටි නිවාස 10ට අයත් පොදු නාන ළිඳ පිරිසිදු කර මායිම් නිරවුල් කර නෑමට හා රෙදි සේදීමට පමණි යනුවෙන් බෝඩ් සවි කිරීම අවශ්‍ය බව. | තාක්ෂණ සේවා නිලධාරී මේ පිළිබඳීව අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස. |
| | වරාය කලමනාකරු සෝමසිරි ජයසේකර මහතා | තොග මාළු වෙළඳාම ධීවර වරාය ඇතුළත සකස් කර ඇති ස්ථානයට ගෙනයාම සුදුසු බව. | |
| | උප පොලිස් | ධීවර වරාය හා ප්‍රාදේශීය ලේකම් | නගර සභාවෙන් මෙය |

| | | | |
|---|---|---|---|
| | පරීක්ෂක, ආර්. එම්. ඩබ් බන්දුල මහතා | කාර්යාලය සමග සිදු කරන ලද සාකච්ඡාවේදී දේව් මන්ත්‍රීතුමා එයට විරුද්ධ වූ බව. වෙළඳුන් ඉවත් කිරීමට අවශ්‍ය පසුබිම සකස් කර දෙන්නේ නම් අවශ්‍ය සහාය ලබා දිය හැකි බව. | නැවැත්වීමට කිසිදු බලපෑමක් සිදු කර නොමැති බවත්, වරාය තුළට ගැනීම සඳහා එකග බව. |
| | උප පොලිස් පරීක්ෂක, ආර්. එම්. ඩබ් බන්දුල මහතා | මාකට් එකට හැරෙන තැන මාළු ලෑල්ල ඉවත් කිරීම පිළිබඳව අදහස කුමක්ද යන වග. | එම ස්ථානයේ තිබෙන සියළුම මාළු ලෑලි ඉවත් කරන්න. |
| ස්තුති කතාව | ගරු නගර සභා මන්ත්‍රී, ජී සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා. | කමිටුවේදී ගන්නා වූ තීරණ ක්‍රියාත්මක කරන බවට අප වග බලා ගන්නවා. අද ගත් තීරණ ක්‍රියාත්මක කිරීම තුළින් ජනතාව බලාපොරොත්තුවන සේවය ඉටු කිරීමට ගතහැකි ක්‍රියා මාර්ග ගැනීමට උත්සුක වන ලෙස නිලධාරීන් වෙතින් ඉල්ලීමක් කරනවා. අද දින කමිටුවට සහභාගී වූ මන්ත්‍රී තුන්පලට සහ සියළුම නිලධාරී මහත්ම මහත්මීන්ට ස්තුතිය පුද කරමි. | |
| නිමාව | | ප.ව 4.30 | |

සකස් කළේ,
සංවර්ධන සහකාර(පරිසර)

නිර්දේශ කරමි,
ලේකම්,
අම්බලන්ගොඩ නගර සභාව.

අනුමත කරමි.
සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

**2018-06-19දින පවත්වන ලද පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රීජ්.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ඒ අනුව2018-06-19දින පවත්වන ලද පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**6: 3 2018- 06- 21දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව**

<u>ක්‍රීඩා කමිටු වාර්තාව</u>

**<u>2018.06.21</u>**

**සහභාගිත්වය-**

ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.
ධම්මික කොඩිකාර මහතා ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.

| | |
|---|---|
| ඒ.ඩබ්ලිව්.ජගත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව. |
| ඩබ්ලිව්.ඒ.සෝභිත රංජිත් මහතා | ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව. |
| එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මිය | ගරු නගර සභා මන්ත්‍රිණී,අම්බලන්ගොඩ නගර සභාව. |
| ඊ.එම්.ඉන්ද්‍රා අයිරාංගනී මිය | ගරු නගර සභා මන්ත්‍රිණී,අම්බලන්ගොඩ නගර සභාව. |
| එම්.ඩබ්ලිව්.ෂර්ලි චන්ද්‍රසිරි මයා | ක්‍රීඩා කමිටු සාමාජික පනියන්දූව,අම්බලන්ගොඩ. |
| මහේන්ද්‍ර වික්‍රමසිංහ මයා | ක්‍රීඩා කමිටු සාමාජික පෝරඹ.අම්බලන්ගොඩ. |
| එස්.එම්.තිලකසිරි සිල්වා මයා | ක්‍රීඩා කමිටු සාමාජික මහ වීදිය,අම්බලන්ගොඩ. |
| ඉඳුනිල් එදිරිවික්‍රමසූරිය මයා | දකුණු පළාත් පා පන්දු පුහුණුකරු |
| එච්.එල්.ද සිල්වා නිලමුණි මෙ.වි | තාක්ෂණ සේවා නිලධාරි,අම්බලන්ගොඩ නගර සභාව. |
| පී.එම්.විජේසිංහ මයා | තාක්ෂණ සේවා නිලධාරි,අම්බලන්ගොඩ නගර සභාව. |
| ජී.අශෝක කුමාර මයා | ක්‍රීඩා භූමි උපදේශක,අම්බලන්ගොඩ නගර සභාව. |
| ඩී.වී.තරංගි මිය | ප්‍රජා සංවර්ධන නිලධාරි,අම්බලන්ගොඩ නගර සභාව. |

**පිළිගැනීම.-ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මයා ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව..**
**අද දින ක්‍රීඩා කමිටුව සඳහා පැමිණි සියළු දෙනා පිළිගනිමින් ක්‍රීඩා කමිටුවේ කටයුතු ආරම්භ කරන ලදි.**

**පසුගිය කමිටුවේ දී සාකච්ඡා කරන ලද කරුණු සමාලෝචනය**

- **මහජන ක්‍රීඩාංගණයේ ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳව..**

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා- ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

මේ සම්බන්ධව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සමග සාකච්ජා කරන ලද අතර, මෙය විධායක සභාවේ ලිඛිතව යෝජනාවක් ලෙස තිබේද යන්න ගැටළුවක්ව පවතින බැවින් නව ක්‍රීඩා අමාත්‍ය වරයාගේ අනුමැතිය ද ලබා ගැනීමට අවශ්‍යව තිබෙනවා. ඒ වගේම ක්‍රිකට් ආයතනය පවසනවා දැනට ක්‍රීඩා පිටියට දමා ඇති පස් ප්‍රමාණවත් නොවන බව හා ඒවායේ බොරළු තිබෙන බව. පස් හලල දාන්න අවශ්‍යයි කියල කියනවා. ඒ සඳහා ඇස්තමේන්තු මුදලට වඩා තවත් ලක්ෂ 20-30 වියදම් කරන්න වෙනවා. ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ තමයි මේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදුවුනේ. ඒ අය පවසන්නේ පස් ප්‍රමාණවත් කියල.මෙය ගැටළුවක්,ඒක නිසා ක්‍රිකට් ආයතනයේ මෙම ඉල්ලීම පිළිබඳව ක්‍රීඩා ආමාත්‍යාංශයත් දැනුවත් කළයුතුයි. ක්‍රිකට් ආයතනය මේ වැඩය කරන්නේ නැතිනම් අපි හරි කරමු. ක්‍රීඩා ආමාත්‍යවරයා මේ පිළිබඳව දැනුවත් කිරීමට අවස්ථා කිහිපයක දී සම්බන්ධ කරගන්න හැඳුවත් බැරිවුණා.ඉදිරි සතිය තුළ මේ පිළිබඳව සාකච්ඡා කරන්න උපරිම උත්සහයක් ගන්නවා.

**ඩබ්ලිව්.ඒ.සෝභිත රංජිත් මයා- ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.**
**ඊ.එම්.ඉන්ද්‍රා අයිරාංගනී මිය - ගරු නගර සභා මන්ත්‍රිණී,අම්බලන්ගොඩ නගර සභාව.**
ලබන අවුරුද්දේ බිග් මැච් එක මෙහේ තියන්න පිට්ටනිය හදල දෙන්න කියල අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

- **ක්‍රීඩා මණ්ඩපය ඉදිරිපිට Inter locksඇල්ලීමට අදාළ ඇස්තමේන්තුව සභාවට ඉදිරිපත් කිරීම.**
  2018.06.05 දින පැවති මහ සභාවට ඉදිරිපත් කරන ලදි.

- **පොල්වත්ත ක්‍රීඩාංගණයේ වොලිබෝල් පිටිය සහ මීටර් 100 ධාවන පථය සකස් කිරීමට අදාළ ඇස්තමේන්තු සකස් කිරීම.**

**පී.එම්.විජේසිංහ මයා -තාක්ෂණ සේවා නිලධාරි,අම්බලන්ගොඩ නගර සභාව.**
මේ සඳහා ක්‍රීඩා නිලධාරිතුමාසම්බන්ධ කර ගැනීමට උත්සහ කරනු ලැබුවත් නොහැකි වූ බැවින් ලබන සභාවට අදාළ ඇස්තමේන්තු ඉදිරිපත් කරන බව.

- **පොල්වත්තක්‍රීඩා පිටියමැදින්යනකාණුවේනිරාවරණයවීඇතිකොටසසකස්කිරීම.**
  **පී.එම්.විජේසිංහ මයා -තාක්ෂණ සේවා නිලධාරි,අම්බලන්ගොඩ නගර සභාව.**
  මෙම ස්ථානය පරික්ෂා කළ බව හා අදාළ ඇස්තමේන්තුව ලබන සභාවට ඉදිරිපත් කරන බව.

- **පොල්වත්තක්‍රීඩාංගණයෙන්පන්සලටපන්දුයැමවළක්වාගැනීමටදැල් එලිමට අදාළ ඇස්තමේන්තුව සකස් කිරීම.**
  **පී.එම්.විජේසිංහ මයා -තාක්ෂණ සේවා නිලධාරි,අම්බලන්ගොඩ නගර සභාව.**
  අදාළ ඇස්තමේන්තුව ලබන සභාවට ඉදිරිපත් කරන බව.

- **පොල්වත්ත ක්‍රීඩාංගණයේ පළුදු තැන් පිළිසකර කිරීම.**
  **ජී.අශෝක කුමාර මයා -ක්‍රීඩා භූමි උපදේශක,අම්බලන්ගොඩ නගර සභාව.**
  90% වැඩ අවසන් බව හා තව එක් දිනයක් තුළ සියළු වැඩ අවසන් කළ හැකි බව.

- **කළුවඩුමුල්ලක්‍රීඩාංගණයේදුරපනිනවලසැදිමටඅදාළඇස්තමේන්තුවසකස්කිරීමහාආරක්ෂිතවැටසැදීම ටඅවශ්‍යබඩුඇණවුම්කරදීම.**
  **පී.එම්.විජේසිංහ මයා -තාක්ෂණ සේවා නිලධාරි,අම්බලන්ගොඩ නගර සභාව.**
  දුර පනින වලට අදාළ ඇස්තමේන්තුව හදල තියෙන්නෙ ලබන සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්.

  **ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා- ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව**
  බඩු ඇණවුම් කරන වැඩේ තවම ඉවුවෙලා නැහැ, කොඩිකාර මන්ත්‍රීතුමා ගමේ අය එකතු කරගෙන වැඩේ කරාවි. ඉක්මනින් අවශ්‍ය බඩු ඇණවුම් කරල දෙන්න, සභාවේ අනුමැතියත් ලැබිල තියෙන නිසා.

- **මානානක්‍රීඩාංගණය වල්බිහිවි ඇති තැන් ශුද්ධ කිරීම.**
  **ඒ.ඩබ්ලිව්.ජගත් කුමාර මයා -ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.**
  වැස්සට පිට්ටනිය හොඳටම මඩවෙලා බැකෝ එක දැම්මොත් තවත මඩ වෙන නිසා මම එපා කිව්වා. ලබන සතියේ බැකෝඑකයි,ගල්රෝලත් එක්ක සේවකයෝ දෙන්නෙක් දෙන්න. ප්‍රජා ශාලාව පැත්තට වෙන්න ආරක්ෂිත වැට කපල දාල. ඒකත් හදල දෙන්න.

  **ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා- ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව**
  Toමහත්තයා මේ ගැන සොයාබලා අවශ්‍ය කටයුතු කරල දෙන්න.

  **එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මිය -ගරු නගර සභා මන්ත්‍රිණී,අම්බලන්ගොඩ නගර සභාව.**
  ඊයේ උදේ 11.30ට පමණ මම දැක්කා කාර් එකක් පිට්නිය මැද්දේ පුරුදු වෙනවා පිච් එකටත් ගියා . වාහනවලට ඇතුල් වෙන්න බැරිවෙන්න ගේට්ටුව හදල දෙන්න.

  **ඒ.ඩබ්ලිව්.ජගත්කුමාරමයා -ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.**
  ක්‍රිකට් මැච් වලට පිට්ටනිය බුක් කරන අයත් තමන්ගේ වාහන පිට්ටනියට දා ගන්නවා ඒක නිසා ගේට්ටුව හදන එක හොඳයි.

  **අදහස් හා යෝජනා**
  **මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා -ක්‍රීඩා කමිටු සාමාජික**
  ක්‍රීඩාමණ්ඩපය පිටුපස වතුර රැඳෙන එක නවත්වන්න තවම මොකුත් කරල නැහැ.

  **ජී.අශෝකකුමාරමයා-ක්‍රීඩා භූමි උපදේශක,අම්බලන්ගොඩ නගර සභාව.**
  මම Toමහත්තය එක්කගෙන ගිහින් පෙන්නුවා.

  **ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් -ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
  ඒ ගැන හොයල බලල අවශ්‍ය කටයුතු කරන්න.ගාලු පාර අයින දිගේ ගල් බැම්මට උඩින් යකඩ වැටක් සැදීමට ද ඇස්තමේන්තුවක් ලබා දෙන්න

  **මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා -ක්‍රීඩා කමිටු සාමාජික**
  ප්‍රජාපතිය පිට්ටනිය ඉදිරිපිට කොන්ක්‍රීට් එක කැඩිලා පාරේවත් යන්න බැහැ වතුර ,සභාපතිතුමා ඒක හදල දෙන්න.

  **ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් -ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

අපි ඒ වැඩේ කරල දෙන්නම්, To ඇස්තමේන්තුව සභාවට දෙන්න.

**මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා -ක්‍රීඩා කමිටු සාමාජික**
සභාපතිතුමනි, හල්වතුර නගර සභාවට අයිති ඉඩම් නිකන් තියෙනවා වාහන පාර්ක් කරන්න යොදාගන්න පුළුවන්නේ,අඩු ගානේ ට්‍රැක්ටර් ටිකවත් හෝදල මෙහේ නවත්තන්න පහසුකම් හදල දෙන්න.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් -ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
අපි ඒක සැලසුම් කරල පිඹුරුපත් හදලත් ඉවරයි. නමුත් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය එම ස්ථානයේ සැදිමට එම ඉඩම ලබාගන්න අදහසක් තියෙනවා. ප්‍රාදේශිය ලේකම් කාර්යාලය කියන්නේ අපි හැමෝටම පොදු තැනක්, එම ඉල්ලීම ආවොත් අපට ඒකට එකඟ වෙන්න වෙනවා.

**ධම්මික කොඩිකාර මයා - ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.**
මගේ යෝජනාවක් තියෙනවා එළිමහන් ව්‍යායාම උපකරණ සවිකරන ලද මධ්‍යස්ථාන සෑදිමට, කළුවඩුමුල්ල ප්‍රදේශයේ අනුග්‍රහක දායකත්වයක් ඇතිව මම ඒක කරන්න බලාපොරොත්තු වෙනවා.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් -ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව**
ඒක හොඳ යෝජනාවක් නගරයේ තවත් ස්ථාන කිහිපයකත් ස්ථාපිත කරන්න, ඊට ආදාළ සැලැස්ම හා ඇස්තමේන්තුව සභාවට ඉදිරිපත් කරන්න.

ගිය සතියේ දවසක යෞවන සමාජයක නිලධාරි මහත්මයකු පැමිණියා මා හමුවීමට ඒ අවස්ථාවේ දී එතුමා පැවසුවා යෞවන සමාජ අතර ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට අදාළව තරගයක් රජයෙන් සංවිධානය කර ඇතිබව. ජයග්‍රාහක යෞවන සමාජයට රුපියල් කෝටියක ත්‍යාගයක් හිමිවන බව හා එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ලක්ෂ තුනක ප්‍රතිපාදනයක් හිමිවන බව. මම එම අවසථාවේ දී එතුමාට යෝජනා කළා පුළුවන්නම් ස්වභාවික පිහිනුම් තටාකයේඑකේ වැලි පිරෙන එක නතර කරල පෙර පැවති විධියට සකස් කිරීමට අදාළ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්න කියල. මේක අපේ රටටම වටින දෙයක් ඒ වගේම අළුත් වැඩක්, අපට මේක කරන්න පුළුවන් , ඒ වුණාට අපි තරුණයන්ට අවස්ථාව දීල බලමු.

**ස්තුති කථාව-ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා**
අද දින ක්‍රීඩා කමිටුවට පැමිණීමේඅඩු බවක් පෙනෙනවා. කෙසේ නමුත්තමන්ගේ වටිනා කාලය කැප කරමින් අද දින ක්‍රීඩා කමිටුවට පැමිණි සියළු දෙනාට ස්තුතිය පුදකරමින් ක්‍රීඩාකමිටුවේ කටයුතු අවසන් කරන ලදි.

සකස් කළේ,

........................................
ප්‍රජා සංවර්ධන නිලධාරි,
නගර සභාව- අම්බලන්ගොඩ.

| | |
|---|---|
| ........................................ | ........................................ |
| ලේකම්, | සභාපති, |
| නගර සභාව- අම්බලන්ගොඩ. | නගර සභාව-අම්බලන්ගොඩ. |

**2018- 06- 21දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. අයිරාගනී ද සිල්වා මහත්මිය විසින් ස්ථිර කරන ලදී.**

**ඒ අනුව2018 -06- 21දින පවත්වන ලද ක්රීඩා කමිටු වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය'**

**6: 4 2018- 06 - 22දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ටෙන්ඩර් කමිටු වාර්තාව**

## 2018.06.22 ටෙන්ඩර් කමිටු වාර්තාව

01. විදුලි උපාංග සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට සලකුණු කර ඇති අවම මිල ගණන් පිළිගැනීම සුදුසු බව තීරණය කර ඇත.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | [illegible] | ඒෂියන් ඉලෙක්ට්‍රිකල්ස් | [illegible] ඉලෙක්ට්‍රිකල්ස් | |
|---|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| 01 | ආම් | 50 | | 780.00 | 240.00 | 450.00 | |
| 02 | ආම් ෂේඩ් | 50 | | - | 285.00 | 450.00 | |
| 03 | 1GANස්විච් | 100 | | 145.00 | 12.00 | 139.00 | |
| 04 | CG හෝල්ඩර් | 100 | | 80.00 | 70.00 | 24.00 | |
| 05 | 40Aට්‍රිප් ස්විච් | 05 | | 3000.00 | 1850.00, 2800.00 | 3200.00 | |
| 06 | 40Aමේන් ස්විච් | 05 | | 1000.00 | 850.00, 450.00 | 900.00 | |
| 07 | 125W මර්කරි බල්බ් | 100 | | 595.00 | 650.00 | 450.00 | |
| 08 | 400Wමර්කරි චෝක් | 50 | | 1600.00 | 1700.00, 2850.00 | 2250.00 | |
| 09 | TOFකනෙක්ටර් | 100 | | 290.00 | 200.00, 120.00 | 350.00 | |
| 10 | බීගන් ලාම්පු සෙට් | 01 | | 6500.00 | 9500.00 | 12500.00 | |
| 11 | බීගන් බල්බ 400W | 05 | | 1850.00 | 1900.00 | 1250.00 | |
| 12 | බීගන් බල්බ් චෝක් 400W | 05 | | 800.00 | 2850.00 | - | |
| 13 | බීගන් බල්බ් හෝල්ඩර්(ස්කෲ) | 10 | | 300.00 | 175.00 | 390.00 | |
| 14 | ඉන්ජෙක්ටර් 400W | 10 | | 900.00 | 750.00, 450.00 | - | |

02. විදුලි කාර්මික සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති ඒෂියන් ඉලෙක්ට්‍රිකල්ස් ආයතනයේ මිල ගණන් පිළිගැනීමට තීරණය කර ඇත.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | [illegible] | [illegible] ඉලෙක්ට්‍රික් ල්ස් | ඒෂියන් ඉලෙක්ට්‍රික් ල්ස් | |
|---|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| 01 | සේෆ්ටි කටර් අඬු | 03 | | 1375.00 | 1400.00 | 1350.00 | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 02 | උල් අඩු | 03 | | 1425.00 | 1425.00 | 1350.00 | |
| 03 | ටෙස්ටර් | 03 | | 400.00 | 410.00 | 350.00 | |
| 04 | සේෆ්ටි රින්ච් | 01 | | 3100.00 | 3800.00 | 3000.00 | |

03.රාක්ක සෑදීම පුස්තකාල පොත් තැබීමට,ලෑලි ඉරීම සදහා ලී වල අවම අපතේ යාමක් ඇති වුඩ් මාර්ක් යන්ත්‍රය මිල ගණන් ඉදිරිපත් කර ඇති තුෂාන් ලී මෝලෙන් මිල ගණන් පිළිගැනීමටත් සහ රාක්ක සෑදීමට තුෂාන් ලීමෝල මිල ගණන් පිළිගැනීමට සුදුසු බව තීරණය කර ඇත.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | ලී තුෂාන් මෝල | පෙරේරා ලී මෝල | ශාරා ලී මෝල | |
|---|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| 01 | රාක්ක සෑදීම සදහා (පුස්තකාල පොත් තැබීමට) | | | | | | |
| | වුඩ් බැක් යන්ත්‍රය | | | 225.00 | | | |
| | බැන්සෝ | | | 200.00 | 200.00 | 200.00 | |
| | බංකුව | | | 140.00 | 140.00 | | |
| | 5'x3' රාක්කය සාදා නිම කිරිම | | | 4500.00 | - | 15000.00 | |
| | 3 1/2'x3' රාක්කය සාදා නිම කිරීම | | | 3500.00 | - | 12000.00 | |

04. වැල් කැඩී ඇති පුටු විවීම.

අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති එල් . හිල්ඩා ප්‍රේමවතී පීරිස් මියගේ මිල ගණන් පිළිගැනීම සුදුසු බව තීරණය කර ඇත.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | එල්. හිල්ඩා ප්‍රේමවතී පීරිස් | ඩී. වමුනා | ඩී.ඩී. සාමින්ද | |
|---|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| 01 | පොඩි පුටු විවීම සදහා | | | 400.00 | 425.00 | 450.00 | |

05. ගබඩාව (සෞඛ්‍ය අංශය සදහා අවශ්‍ය උපකරණ ) මිල ගණන් ඉදිරිපත් කර ඇති රජයේ වානිජ (විවිධ) නීතිගත සංස්ථාවේ මිල ගණන් පිළිලැනීමට තීරණය කර ඇත.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | රජයේ වානිජ (විවිධ) නීතිගත සංස්ථාව | තයන රංජිත් පොළ | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| 01 | සවල් | 10 | | යකඩ 537.26 | 550.00 | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 02 | බූට්ස්(ගම් බූට්ස්) | 25 | | 2560.00 | 1350.00 | | |
| 03 | රේක්ක | 05 | | 230.00 | 400.00 | | |

06. ලිපි ද්‍රව්‍ය සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව මිල ගණන් පිළිගැනීමට තීරණය කර ඇත.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| 01 | CR පිටු 80 පොත් | 25 | SPC | 65 | 35 %වට්ටමක් | | |
| 02 | CR පිටු 120 පොත් | 25 | SPC | 74.75 | | | |
| 03 | CR පිටු 160 පොත් | 25 | SPC | 113.75 | | | |
| 04 | CR පිටු 200 පොත් | 25 | SPC | 143.00 | | | |
| 05 | කාබන් කොළ දෙපැත්ත | | | - | | | |
| 06 | කාබන් කොළ තනි පැත්ත | | | 315.00 | | | |
| 07 | හාෆ් ෂීට් පැකට් | | 60 gsm | 440.00 | | | |
| 08 | නිල් පෑන් | | ඇට්ලස් චූටි | 12.50 | | | |
| 09 | රතු පෑන් | | ඇට්ලස් චූටි | 12.50 | | | |
| 10 | 4 කොළ | 50 | 80 gsm | 560.00 | | | |
| 11 | අඩි රූල් | 25 | | 15.00 | | | |
| 12 | සෙලෝටේප් 2" | 50 | | 40.00 | | | |
| 13 | සෙලෝටේප් 1" | 50 | | 20.00 | | | |
| 14 | ෆයිල් කටු පැකට් | 50 | | 22.00 | | | |
| 15 | කැල්කියුලේටර් | | Casio | 1350.00 | | | |
| 16 | පන්චර් | | කැන්ගරු | 360.00 | | | |
| 17 | ස්ටෙප්ලර් | | කැන්ගරු | 300.00 | | | |
| 18 | ස්ටෙප්ලර් කටු | | නො.369 | 25.00 | | | |
| 19 | ඇල්පෙනෙති | | | 30.00 | | | |

07. ගබඩාව සඳහා අවශ්‍ය ආකෘතිපත්‍ර සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මිල ගණන් පිළිගැනීමට තීරණය කර ඇත.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | රජයේ මුද්‍රණාලය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| 01 | නිවාඩු කොළ | | පොදු 125අ | 40.00 | | | |
| 02 | ගමන් වියදම් වවුචර් | | 177 | 75.00 | | | |

08.ගංහා වැලි සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති පූර්ණා වෙළඳ ආයතනයෙන් මිලදී ගැනීමට තීරණය කරන ලදි.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | පූර්ණා වෙළඳසැල | ලයින් ස්ටාර් හාර්ඩ්වෙයාර් | බිශාකා ද ශිල්වා එන්ටර්ප්‍රයිසස් | |
|---|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| 01 | ගංගා වැලි කියුබ් | 05 | | 13000.00 | 16500.00 | 16400.00 | |

09. ත්‍රීරෝද රථයේ ටයර් හා ටියුබ් සඳහා ශ්‍රී ලංකා රජයේ වානිජ (විවිධ) නීතිගත සංස්ථාව ඉදිරිපත් වූ මිල ගණන් පිළිගැනීමට තීරණය කරන ලදි.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | | රජයේ වානිජ (විවිධ නීතිගත සංස්ථාව) | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| 01 | 4.00x8 ප්‍රමාණයේ ටයර් | 03 | | 2540.00(vat 15%) 381.00 =,2921.00 | | | |
| 02 | 4.00*8 ප්‍රමාණයේ ටියුබ් | 03 | | 640.00 (vat 15%) 96.00 = 736.00 | | | |

10. සෞඛ්‍ය අංශය සඳහා නාම පුවරු සඳහා අවශ්‍ය අයිතමයන් 1,2,3JATහාර්ඩ්වෙයාර් ආයතනයෙන් 4,5,6 අයිතමයන් පූර්ණා වෙළඳ සැලෙන්ද මිලදී ගැනීමට තීරණය කරන ලදි.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | පූර්ණා වෙළඳසැල | ලයින් ස්ටාර් හාර්ඩ්වෙයාර් | ජූ හාර්ඩ්වෙයාර් | |
|---|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| 01 | 1"x1" බොක්ස් බාර් IRON | | | 950.00 | 1160.00 | 1100.00 | |
| 02 | 1 1/2"GI බට | | | 4350.00 පකිස්තාන් | 4050.00 | 4200.00 | |
| 03 | 1/8" ගැල්වනයිස් තහඩු | | | - | - | 24000.00 | |
| 04 | 2/8"x1/2"POPRIVERT | | | 1.10 | 1.50 | 2.00 | |
| 05 | NO.12 වැල්ඩින් කූරු | | | 560.00 | 575.00 | 590.00 | |
| 06 | 4 1/2" කටින් වීල් | | | 80.00 | 140.00 | 80.00 | |

11. ජල නල උපාංග සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති පූර්ණා වෙළඳසැලෙන් මිලදී ගැනීමට තීරණය කරන ලදි.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | පූර්ණා වෙළඳසැල | B.K.S. ඛාම්පැණී | ස්ටාර් ලයින් හාඩ්වෙයාර් | |
|---|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| 01 | 1/2" වතුර බට | | | 140.00 LON | 140.0 | 160.00 SLON | |
| 02 | 1/2" එල් බෝ | | | 20.00 SLON | 20.00 | 18.00 SLON | |
| 03 | 1/2" T | | | 24.00 SLON | 25.00 | 22.00 SLON | |
| 04 | 1/2" වැල්ෂොකට් | | | 24.00 SLON | 22.50 | 24.00 SLON | |
| 05 | 1/2" ස්කෲෂොකට් | | | 23.00 SLON | 25.00 | 24.00 SLON | |

12. එන්ජින් ඔයිල් බැරල් එකක් සඳහා සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමූපකාර සමිතිය මිල ගණන් පිළිගැනීමට තීරණය කරන ලදි.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | විවිධ සේවා සමූපකාර සමිතිය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| 01 | එන්ජින් ඔයිල් බැරල් | 210 L | | 84000.00 | | | |
| 02 | බැරල් | 01 | | 500.00 | | | |

13.ලෝක ළමා දින උත්සවය සඳහා අවශ්‍ය විනෝද උපාංග සැපයීමට මිල ගණන් ඉදිරිපත් කර තිබූ අතර අදාල උපාංග පරීක්ෂා කර බලා තීරණය කිරීමට සුදුසු බව තීරණය කර ඇත.

| | අයිතමය | | | KIDS JUMP | WONDER WORLD | LAKSHAN ENTERTAINMENTS |
|---|---|---|---|---|---|---|
| | | | | එකක්තොගය | එකක්තොගය | එකක්තොගය |
| | 40'x40' ft MERRY – GO-ROUND (40SEAT)ADULT AND KIDS WITH TRANSPORT | | | 155000.00 | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 50x50x25 JET RIDE(24SEAT) WITH TRANSPORT | | | 205000.00 | | | | |
| | 40x40 ft INFLATABLE SWIMMING POOL WITH KIDS PADDLE BOATS (10 BOATS)WITH OUT WATER WITH TRANSPORT | | | 105000.00 | | | | |
| | 40x30 ft TRAIN RIDE (20 SEAT) ADULT AND KIDS WITH TRANSPORT | | | 105000.00 | | | | |
| | DINO BOUNCER | | | | | EXTRA HOURS | | |
| | | | | | | 500.00 | | |
| | PRINCESS CASTLE | | | | | 500.00 | | |
| | SPIDER MAN LARGE | | | | | 1000.00 | | |
| | SIMPSONS BOUNCER | | | | | 500.00 | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |
| | RING MASTER | | | | | 500.00 | | |
| | TRANSPORT | | | | 16000.00 | | | |
| | | | | | **75500.00** | | | |
| | ජෙට්යානය | | | | | | | 200000.00 |
| | මැරිගෝරවුන්ඩ් | | | | | | | 150000.00 |
| | බෝට්ටුසවාරි(40x40) | | | | | | | 100000.00 |
| | බවුන්සරය(40x20) | | | | | | | 50000.00 |
| | සමනලයානය | | | | | | | 125000.00 |
| | කතුරුඔංචිල්ලාව | | | | | | | 150000.00 |
| | පුංචිකෝච්චිය | | | | | | | 100000.00 |
| | ඩබල්ෆ්ලයින්යානය | | | | | | | 230000.00 |

**2018- 06- 22දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ටෙන්ඩර් කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රමමහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි, මේ වාර්තාවෙ අවසානයේ අත්සන් කරල නැහැ. මේව නිලධාරීන්ට හරියට එවන්න කියන්න. මේපළමුවෙනි එකේ ආයතන කොහේද කියල සටහන් වෙන්න ඕනෙ. මේ ගොඩක් ඒවගෙ අඩුපාඩු තියෙනවා. පැහැදිලි නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතාකතා කරමින්</u>**

සභාපතිතුමනි අපිට ටෙන්ඩර් එකක් දැම්මට පස්සේ අයිටම් බයි අයිටම් යන්න බැහැ. සාමාන්‍ය නීතිය තියෙන්නෙ එකකට දැම්මනම් අයිටම් 10 ක් දහයෙ එකතුවේ අඩුම එකට තමයි අපිට යන්න වෙන්නෙ. වෙන වෙනම කඩ 10 කින් ගිහිල්ල ඒ අයිටම් 10 ගන්න බැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රමමහතා කතා කරමින්</u>**
ඒක හරි. මෙතන ඒ බව ලියවෙන්න ඕනෙ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
නිලධාරින් වාර්තාව හරියට ලියන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතාකතා කරමින්</u>**

මේකෙ තියෙනවා බීගන් ලාම්පු එකක 6500/-යි අනෙක් ආයතනයේ 12500/- යි. එතකොට බ්‍රෑන්ඩ් එක මොකක්ද කියන එක ප්‍රශ්නයක්. සාධාරණව බඩු විකුණන කෙනාට අසාධාරණයි. අනෙක් පැත්තෙන් බාල බඩුව සභාවට එනවා. අපිට ප්‍රශ්නයක් නැහැ 12500/- එක පිළිගත්තට. හැබැයි මේකට බ්‍රෑන්ඩ් එකක් නැහැ.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ටී.ඕ. මහත්මය මේවගෙ දැඩි අවශ්‍යතාවක් මේවන විට නැහැ. සැප්තැම්බර් මාසෙන් පස්සෙ මුහුදු යාම සඳහා අවශ්‍ය වෙනවා. බීගන් ලාම්පු 3 ක් තියෙනවා. තුනම අළුත්වැඩියා වෙන්න ඕනෙ. මේ වෙනස සසඳල නිවැරදි එක නිර්දේශ කරල ඊලග ටෙන්ඩර් කමිටුවට ඉදිරිපත් කරන්න.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

සභාපතිතුමනි, මේ රාක්ක වලට ලී ඉරීමේදී අපි මේක තෝර ගත්තෙ වැඩිය ලී අපතේ යන්නෙ නැති නිසා. සභාපතිතුමනි, විශේෂයෙන්ම නිලධාරීන් දැනුවත් කරන්න ටෙන්ඩර් කමිටු තීරණ නිවැරදිව ලියන්න කියලා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතාකතා කරමින්**</u>

මේකෙ තියෙනවා.ඒවගේම සභාපතිතුමා මේ බල්බ් වලත් එහෙමයි. මේවගේ පිළිගත් බ්රෑන්ඩ් වලින් ඉල්ලන්න ඕනෙ. නැත්තම් බාල බඩු තමයි අපි ගන්නෙ. මේව ආයෙත් ටෙන්ඩර් කරත් කමක් නැහැ. බාල බඩුගත්තහම පාවිච්චි කරන්න බැහැනෙ සභාපතිතුමා. ඒ නිසා ටී.ඕ. මහත්තරු පොඩ්ඩක් සොයා බලල කටයුතු කරන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඊ.අයිරාංගනී ද සිල්වා මහත්මිය කතා කරමින්**</u>

සභාපතිතුමනි මේ ලෝක ළමා දිනය සම්බන්ධව මිල ගණන් ඉදිරිපත් කරල තියෙනවා. මම අහනව ටෙන්ඩර් කීපයකින්ද , එක ටෙන්ඩරයකින්ද මේ මිල තෝරගෙන තියෙන්නෙ කියලා. වියදම ලක්ෂ 11 කට අධික ප්‍රමාණයක් මෙතන පෙන්නනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

කීපයකින් තෝරගෙන තියෙන්නෙ.

**ඒ අනුව2018 -06- 22දින පවත්වන ලද ටෙන්ඩර් කමිටු වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය'**

**6: 5 2018- 06- 28දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මූල්‍ය කමිටු වාර්තාව**

<u>මූල්‍ය කමිටුව</u>

**2018-06-28 දින ප.ව.2.30**

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1 | ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව |
| 2 | ධම්මිකකොඩිකාරමහතා | ගරුනගර මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව |
| 3 | ඒ.ඩබ්.ජගත්කමාරමහතා | ගරු නගර මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව |
| 4 | බී.ඒ.ධම්මිකා මිය | ලේකම්,අම්බලන්ගොඩ නගර සභාව |

<u>**පිළිගැනීම**</u>

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා මූල්‍ය කමිටුව සඳහා පැමිණි ගරු නගර සභා මන්ත්‍රීවරුන් ල නගර සභා ලේකම්ල ඇතුලු සියලු නිලධාරී මහත්ම මහත්මීන් ඉතාමත් ගෞරවයෙන් පිළිගන්නා ලදී. අනතුරුව එදිනට කමිටුව සඳහා ඉදිරිපත් කරන ලද පහත විස්තර ඇතුලත් ගෙවීම් වවුචර් පත් සඳහා කමිටු සාමාජිකයින් විසින් අනුමැතිය ලබා දෙන ලදී.

| අනු අංකය | ගෙවීම් ලබන්නාගේ නම | **මිලදී ගෙන ඇති භාණ්ඩ පිලිබද විස්තර** | මුදල (රු.) |
|---|---|---|---|
| 0 | සරසවිපොත්හල පෞද්ගලික සමාගම | ප්‍රධාන පුස්තකාලය හා ශාඛා පුස්තකාල සදහා පොත් මිලදී ගැනීම. | 81066.50 |
| 02 | එම්.ඩී.ගුණසේන සහ සමාගම | ප්‍රධාන පුස්තකාලය හා ශාඛා පුස්තකාල සදහා පොත් මිලදී ගැනීම. | 144360.00 |
| 03 | සුමිත් මාකටින් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් | ඇ.අංක 1845 යටතේ 252-0730 රථය සදහා ටයර් ගැනීම.(1 ක් රු.15447 බැගින් ටයර් 04ක් හා රබර් වැල්ව් 1ක් රු.60 බැගින් 04 ක්) | 62078.00 |
| 04 | සභාපති,නගරසභාව,අ/ගොඩ ගි අ. 035- 1001-46-6295638 බැර | විශ්‍රාමික ඇල්ටන් මහතා හා ජී.කේ. ද සිල්වා මයාගේ සේවක ණය මුදල්විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් වෙනත් ගිණුමකට බැරවීම හේතුවෙන් නිවැරදි ගිණුමවූ සේවක ණය ගිණුමට මාරු කිරීම. | 112000.00 |
| 05 | මිලිදු එන්ටර්ප්‍රයිසස් | ඇ.අංක 1864 යටතේ 1 ක් රු.5445 .00 බැගින් ගෑස් සිලින්ඩර් 08 ක් | 43560.00 |
| 06 | ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය | පළාත් පාලන සංසදය සදහා මුදල් ගෙවීම | 10000.00 |
| 07 | මිලිදු එන්ටර්ප්‍රයිසස් | ඇ.අංක 1860 යටතේ 1 ක් රු.5445 .00 බැගින් ගෑස් සිලින්ඩර් 08 | 43560.00 |
| 08 | සාමාන්‍යාධිකාරී, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | ගලි බවුසර් ලෝඩ් 25 ක් සදහා අදාල ගාස්තු | 25875.00 |
| 09 | ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී | කාර්යාලයේ ස්ථාපිත දුරකථනයන්හි 2018 අප්‍රේල් දුරකථන බිල් | 30968.26 |
| 10 | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | මැයිමසNBT කොටසක්ගෙවීම | 20000.00 |
| 11 | ශ්‍රී ලංකා රජයේ වාණිජ නීතිගත සංස්ථාව | ඇ.අංක 1795 යටතේ 1 ක් රු.9453.00බැගින්ටයර් 02 ක් රු.713.00බැගින් ටයර් 02 | 20332.00 |
| 12 | පූර්ණා වෙළඳ සැල | ඇ.අංක 1826 යටතේඉබි යතුරු මිලදී ගැනීම (අගල් 1-5 එකක්රු160බැගින් 05,අගල් 2-12 එකක් රු.700 බැගින් 12,අගල් 3-8 එකක් 900 බැගින් 08 ) | 16400.00 |
| 13 | සක්වා ප්‍රින්ටර්ස් | ඇ.අංක1850 යටතේ ඒ/4 ලිපි ශීර්ෂ 5000. | 12500.00 |
| 14 | එම්.එස්. වීරසිංහ | පුස්තකාල සදහා පුවත්පත් මිලදී ගැනීම. | 44820.00 |
| 15 | තරූ සේල් සෙන්ටර් | ඇ.අංක 1845 යටතේ කසල බඳුන් 06 ක් ගැනීම. | 16500.00 |
| 16 | ඉසුරු මෝටර් ට්‍රේඩර්ස් | සභාව සතු 49-9436 දරණ ටැක්ටරයට ස්ටීරියන් ජැක් 02 ක් හා ටයර් රෝඩ් අලුතින්යොදා එම පද්ධතිය සෑදීම. | 43500.00 |
| 17 | සුමල් කලුතර | ඇ .අංක 1853 යටතේ දික් අඩි 80 , මුදුන් තහඩු ගැනීම (1ක් රු.147 බැගින් ) | 11760.00 |
| 18 | ටී.එච්.ඩී.එච්.එල් ද සිල්වා | ඇ.අංක1846 යටතේ එකක් රු.100 බැගින් කොසු 100 ක් හා ඉදල් 100 ක් හා එකක් රු.55 බැගින් ටොයිලට් බ්‍රෂ් 06 | 20330.00 |
| 19 | ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය | පටබැදිමුල්ල ආදාහනාගාරයේ චිමිනිය සුදු යකඩ වලින් සෑදීම සදහා අදාල ඇස්තමේන්තු මුදලින් 50% ක් ගෙවීම | 1030306.12 |

පැමිණි සැමට ස්තුති කරමින් ප.ව.3.45 ට පමණ කමිටුවේ කටයුතු නිම කරන ලදී.

.............................. .................................................. ..................................................

| | | |
|---|---|---|
| සකස් කලේ | ලේකම්, | ගරු සභාපති, |
| එම්.එච්. රෝෂිණී | බී.ඒ. ධම්මිකා , | ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් |
| කළමණාකරණ සහකාර | නගර සභාව , අම්බලන්ගොඩ | නගර සභාව , අම්බලන්ගොඩ |

**2018- 06- 28දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මූල්‍ය කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ඒ අනුව2018 -06- 28දින පවත්වන ලද මූල්‍ය කමිටු වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

## (07) ටෙන්ඩර්හාමිළගණන්

**7:1** **ටෙන්ඩර්(-** නැත

**7:2** **මිළගණන්(-** නැත

## (08) වීම

8.1 අම්බලන්ගොඩ නගර සභාව මගින් පාලනය වන පුස්තකාල සඳහා 2018 මැයි මාසය සඳහා සපයන ලද පුවත්පත් වෙනුවෙන් රු. 44820.00 ක මුදලක් එම්. එස්. වීරසිංහ මහතා වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8. 2 මිය ගිය පට්ටිදුර ඩේලින් නෝනා මහත්මිය සමෘද්ධිලාභියෙකු වන බැවින් ආදාහනාගාරය වෙන් කිරීමේදී ලබාදෙන රු. 2000.00 ක සහන මුදල ඇයගේ දියණිය වන අම්බලන්ගොඩ, ගාලු පාර, අංක 468 හි පදිංචි ඩබ්. නාලිකා ද සිල්වා මහත්මිය වෙත ආපසු ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8. 3 අම්බලන්ගොඩ නගර සභාව සතු සියළුම වාහන හා යන්ත්‍රෝපකරණ සඳහා 2018 මැයි මාසය වෙනුවෙන් ලබා ගත් ඉන්ධන වෙනුවෙන් රු. 356483.00 ක මුදලක් අම්බලන්ගොඩ විවිධ සේවා සමූපකාර සමිතිය වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| <u>අනු අංකය</u> | <u>වාහනයේ අංකය</u> | <u>මාසික බිල්පත</u> |
|---|---|---|
| 01 | 252 – 0730කැබ් රථය | රු. 5200.00 |
| 02 | PF – 7424කැබ් රථය | රු. 38457.00 |
| 03 | QL – 6618ත්‍රීරෝද රථය | රු. 5477.00 |
| 04 | RA – 3709ට්‍රැක්ටර් රථය | රු. 23463.00 |
| 05 | RA – 8796ට්‍රැක්ටර් රථය | රු. 17475.00 |
| 06 | SL –3731අත්ට්‍රැක්ටරය | රු. 999.00 |
| 07 | SL - 3942 අත්ට්‍රැක්ටරය | රු. 2465.00 |

| | | |
|---|---|---|
| 08 | SL – 5694 අත්ට්‍රැක්ටරය | රු. 2200.00 |
| 09 | GL – 9369 ගලි රථය | රු. 33633.00 |
| 10 | RF – 0022ට්‍රැක්ටර් රථය | රු. 11871.00 |
| 11 | RF – 0031 ට්‍රැක්ටර් රථය | රු. 15788.00 |
| 12 | RF – 0970 ට්‍රැක්ටර් රථය | රු. 14727.00 |
| 13 | RF – 0986 ට්‍රැක්ටර් රථය | රු. 16335.00 |
| 14 | 49 – 9436 ට්‍රැක්ටර් රථය | රු. 5106.00 |
| 15 | මාර්ග තලනය | රු. 4700.00 |
| 16 | LL – 7642කෘ කැබ් රථය | රු. 14958.00 |
| 17 | LL – 6406 ඩම්ට්‍රක් රථය | රු. 24753.00 |
| 18 | RA – 2509 ට්‍රැක්ටර් රථය | රු. 5217.00 |
| 19 | LL – 7286 | රු. 10767.00 |
| 20 | ZA – 5185බැකෝ ලෝඩරය | රු. 73188.00 |
| 21 | තණ කොල කපන යන්ත්‍රය | රු. 5370.00 |
| 22 | පොල්වත්ත ආදාහනාගාරය (තණකොළ කැපීමට) | රු. 1315.00 |
| 23 | පටබැදිමුල්ල ආදාහනාගාරය (තණකොළ කැපීමට) | රු. 1315.00 |
| 24 | SA – 2806හාඩිමෙක් රථය | රු. 2576.00 |
| 25 | කසල බැහැරලන ස්ථානයේ ඇබේට් ඉසීමට (මදුරු කීටයන් විනාශ කිරීමට) | රු. 1008.00 |
| 26 | ධූමායන කටයුතු සඳහා | රු. 18120.00 |
| | මුළු එකතුව | රු. 356483.00 |

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි, RA – 3709ට්‍රැක්ටරය මැයි මාසෙ ඩීසල් බිල රු. 23463.00 යි. ඊට ඉස්සෙල්ලා මාසෙ 10000/-යි. වෙනස 13463/- යි. පී.එච්.අයි. මහත්තයා ඇයි මෙහෙම වෙන්නෙ.

මම ඔබතුමා කියන ඒව පිළිගන්නෙ නැහැ. මෙච්චර වෙනසක් වෙන්නෙ කොහොමද? අනික් ට්‍රැක්ටරේ වෙනස රු.2000/- යි. ඒක පිළිගන්න පුළුවන්. මම ගිය සභාවෙත් මේක කිව්ව. මම මෙහෙම අහන්නෙ මට සැක හිතෙන නිසා. ඒක නිසා සභාපතිතුමා විශේෂයෙන්ම සොයා බලන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේකෙ රියදුරු මහත්තයට මම මුණ ගැහෙන්න කියන්න. බලමු මොකද වෙලා තියෙන්නෙ කියලා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතාකතා කරමින්**

සභාපතිතුමනි, අපේ බැකෝ ලෝඩර් එකයි, ගලි බවුසරයයි පිට අයට දීල අපි මුදලක් අය කරනවනේ. මේ දෙකට රු. 73188.00 සහ රු. 33633.00 ක් ඩීසල් වලට. මම ඉල්ලා සිටිනවා ගලි රථයත්, බැකෝ ලෝඩරයත් උපයන මුදලත් පෙන්නුම් කරන්න කියලා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

හැම වාහනයකටම රනින් චාර්ට් එකක් දෙනවා. ඇත්තටම අපිට ප්‍රශ්නයක් වෙලා තියෙනවා පන්සල් වලිනුයි, ඉස්කෝල වලිනුයි. බැකෝ එකේ තෙල් ප්‍රමාණයක් වෙනදට වැඩිය වැයවෙන බව මට පේනවා. මට සතියකට එකක් විතර ඉල්ලීම් එනව මේදේ කරල දෙන්න කියලා. අදත් ලියුමක් ආව පොලිසියෙන් තණකොල කපන මැෂින් එක ඉල්ලලා. ඉතින් එතෙන්ට සේවකයෙක් ගියහම අපිට ප්‍රශ්නෙ. ඊට කලින් ධර්මාශෝකෙ ඉස්කෝලෙ, පෙරේදා හිරේවත්ත පන්සලේ ඒවගේ වැඩ රාශියක අපට නියැලෙන්න වෙනවා. ප්‍රතික්ෂේප කරන්න බැරි හින්දා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතාකතා කරමින්**

සභාපතිතුමනි,අපි මේව දැක්කහම කතා කරන්න ඕනෙ. මේව නොදී බැහැ තමයි. එනිසා මේවගේ විස්තර වාර්තාවක් තියාගන්න. පාලනයක් තියෙන්න ඕන නිසයි මම ඇහුවෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතාකතා කරමින්</u>**

සභාපතිතුමනි, පන්සල් , ඉස්කෝල වලටත් පැයකට රු..500/- ක් වගේ පොඩි මුදලක් හරි ගන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙහෙමයි ඉතින් පන්සලකින් ඉල්ලන කොට ඉල්ලන්නෙ නිකන්ම තමයි. අපි අතින් තෙල් ගහල තමයි යවන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතාකතා කරමින්</u>**

සභාපතිතුමනි, තණකොල කපන මැෂිම අපට අවශ්‍ය වෙලාවකට පාරක් එළි කරන්න ගන්න බැරි වෙලා තියෙනවා. මීට පෙර අපි සතියක් උත්සාහ කරා. අහන අහන හැම දවසෙම පොලීසියේ. අපේ මාවතක් එළි පෙහෙලි කර ගන්න බැරිනම් මැෂිමෙන් වැඩක් නැහැ.

8. 4 UCCR/03 දරණ පරිගණකය සඳහා Ram 4 GB/Processor/G4/Mother board උපාංග සවිකර අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ගාස්තුව වන රු. 13700.00 ක මුදලක්ටියුලිප් කම්පියුටර්ස් වෙත ගෙවීම  සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8. 5 නොදිරන කසළ වෙන් කිරීම සඳහා ගබඩා පහසුකම් ලබාදීම කර්මාන්තය වෙනුවෙන් රු. 2044516.99 ක මුදලක් කරිත්තකන්ද ප්‍රජා මණ්ඩලය වෙත ගෙවීම සඳහා ගරු මන්ත්රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතාකතා කරමින්</u>**

සභාපතිතුමනි, මේක කරල ඉවර එකක්ද?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පළාත් සභාව විසින් අනුමත කරල එවල තියෙනවා. ලක්ෂ 20 ක් ඒගොල්ලො ගෙවනවා. ඉතිරි ගණන අපි ගෙවනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමා, මේක පළාත් සභාවට ගෙවන්න කියන්න. අපි එන්න කලින් කරපු එකක්. අපි මෙෂමන්ට් දන්නෙත් නැහැ. මොකුත් දන්නෙත් නැහැ. මමනම් කැමති නැහැ මේක ගෙවනවට. මේකත් කලින් වගේ කොමසාරිස්තුමාට දාල ගෙවන්න. මේකත් අර පහළ ටොයිලට් එක වගේ. අපිට සැකයක් තියෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මම පිළිගන්නවා. ටොයිලට් එක සම්බන්ධයෙන් උප සභාපතිතුමා මට කරුණු කීපයක් පෙන්නල දුන්නා. එතන ලොකු වැරදි රාශියක් තියෙනවා. මේකත් ඒ විදියට හොයන්න .කිසිම ප්‍රශ්නයක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතාකතා කරමින්</u>**

සභාපතිතුමනි, මෙතන ගිහිල්ල බැලුවොත් භෞතිකව තියෙන්නෙ ගඩොලින් බැදල කපරාරු නොකරපු අඩි 10X 10 වගේ කාමර තුනක්. මේ ලක්ෂ 21 ටම ඔච්චර තමයි තියෙන්නෙ. මේක තාක්ෂණ සේවා නිලධාරිගේ වාර්තාව අනුව හරිද කියල මම දන්නෑ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒව ඔක්කොම ඉංජිනේරු මහත්තරු බලල අනුමත කරල තියෙන්නෙ.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතාකතා කරමින්**

සභාපතිතුමනි,ඉංජිනේරු මහත්තරු බැලුවට අපිට පේන්නෑ ලක්ෂ 21 ක වැඩක් එතන තියෙනවයි කියලා. ඉංජිනේරු මහත්තරු බැලුවට අපිටත් සාමාන්‍ය දැනීමක් තියෙනවනේ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සභාපතිතුමා, මෙම ගෙවීම් කටයුතු පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු මහතාගේ අධීක්ෂණය යටතේ එම දෙපාර්තමේන්තුවේ ටී.ඕ. මහතකු ලවා මිනුම් කටයුතු හරිද කියල බලවන්න. එතකොට අපිට පුළුවන් සෑහීමකට පත් වෙන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

පළාත් පාලන දිස්ත්‍රික් ඉංජිනියර් අත්සන් කරල තියෙන්නෙ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සභාපතිතුමා, ටොයිලට් එකෙත් එතුමා අත්සන් කරලනෙ ගෙවල තියෙන්නෙ. මම ඔබතුමාට පෙන්නුව ඒකෙ අඩුපාඩු.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙහෙම ප්‍රශ්නයක් තියෙනවා. මේක අහන්න වෙන්නෙ ටෙක්නිකල් ස්ටාෆ් එකෙන්. ඒගොල්ලොම තමයි අත්සන් කරල තියෙන්නෙ. පළාත් සභාවෙ ඉන්න ඉහලම එක්කෙනත් අත්සන් කරල තමයි මෙතෙන්ට ඇවිල්ල තියෙන්නෙ. එතකොට අපි අහන්නෙ කාගෙන්ද කියල එක ගැටළුවක්. උප සභාපතිතුමා මට පෙන්නපු කාරණය ඇත්ත විත්තිය මට තේරුණා. මේගොල්ලොම අනුමත කරනවා, වැඩ කරනවා, ගෙවා ගන්නවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතාකතා කරමින්**

සභාපතිතුමා, උප සභාපතිතුමා කියන්නෙ මේ ටොයිලට් එක වගේ එකක් කියලද මේකත්. අපි මන්ත්‍රීවරු 21 දෙනා නගරයේ මිනිස්සුන්ට උත්තර දෙන්න ඕනෙ මේවට. අපි මේ නගරයේ ජීවත් වෙන්න ඕනෙ. අපේ ගරුත්වය රැකගෙන. මම දන්නෑ දැන් ඉන්න අය ගැන. ඉදපු එක්කෙනානම් පැනල යන්න ගියා. උප සභාපතිතුමා කියන කතාව සම්පූර්ණ ඇත්ත. දැන් සරත් මන්ත්‍රීතුමා කිව්වෙ කාමර 3 යි කියල මේකෙ තියෙන්නෙ. මමනම් කියන්නෙ මේව හොයන්න මන්ත්‍රීවරු හතර පස් දෙනෙක් දාල වාර්තාවක් ගන්න. මේ දෙකට අපි යවමු අපේ වාර්තා. ඇස් පනාපිටම පේනව රු.250/- ක් වෙන්නෑ ටැප් එක. රු. 2500/- ක් දානව. අදටත් වහල දාල. හාර ලක්ෂ අසූ හය දාහයි. අනිත් එක බලන්න අද නවීන සමාජෙ අපි කවුරුවත් වල් කකුස්සියක් ගහගන්නෙ නැහැ. 16000/- ක් අරගෙන මේ කටවල් දෙකට මම කියන්නෙ කොමඩ් එකක් වත් ගැහුවනම්. අපි මේව අත අරින්න හොද නැහැ. අපි මන්ත්‍රීවරු 5 දෙනෙක් දාල වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන්න කියන්න. ඒක අපි යවමු වගකිව යුතු නිලධාරීන්ට. මේව නතර කරන්න අපි පූර්වාදර්ශයක් දෙමු.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මම ගිහිල්ල මේක බැලුවහම අත්තිවාරමෙන්ම ගෙදර යන්න වෙනවා. මම කැමති නැහැ කාගෙවත් රස්සාවක් නැති කරල දොස් අහන්න. ඒක නිසා සභාපතිතුමා මේක නිවැරදි කරන්න කියන්න අනිවාර්යෙන්. යතුර නැතුව මම බොහොම අමාරුවෙන් යතුර හොයා ගෙන දොර ඇරව ගත්තෙ. මට කියන්න කණගාටුයි අපි එන්න කලින් කාර්යාලය බෙදා වෙන් කිරීම් කරපු එක පිට කොන්ත්‍රාත්කරුවෙක් කරල තිබුණෙ. අනික් ඔක්කොම බිල් ඇරල. මේ බිල ඇරල නෑ. මම විෂයෙන් ඇහුවහම කිව්ව මේකෙ වැඩ අවසන් කියල ලිපියක් නැහැ කිව්ව. මම ඒපාර ඇහුව මේකෙ යතුර බාර දීලත් නෑ. වතුර සප්ලයි එකවත් දීල නෑ. එහෙමත් එකේ ඒ බිල් ගෙවලත් ඉවරයි. අර මනුස්සයගෙ බිල තියන් හිටියා. ඉතාමත් අසාධාරණ විදියට වැඩ කෙරුනෙ. මම සී5 කන්ට්‍රැක්ටර් කෙනෙක්. මට බොරු කරන්න බැහැ කාටවත්. උදාහරණයක් විදියට අපි අඩි 15 පයිප්පයක් දැම්මොත් ඒක එන විදිය පෙන්නන්න ඕනෙ.දැන් බලන්න ගිහිල්ල ඒ විදියට තියෙනවද කියලා. මීටර් 20 ක් දාල තියෙනව බටේ. බාගයක්වත් නැහැ. නමුත් ගෙවීම් කරල. ඒක නිසා සභාපතිතුමා කරුණාකරල මේව නිවැරදි කරන්න කියන්න ඉතා ඉක්මනින්.

**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

සභාපතිතුමා මේ ගෙවීම් පිළිබඳව අපිටත් හරිම ගැටළුවක්. ඕකෙ මුදල් ගෙවන්න ගියහම අපිත් අනුබල දුන්න වගේ වෙනවනෙ. ඉතින් මේ පල්ලෙහා ටොයිලට් එකේ වලක් නැහැ. හරිම ගැටළුවක්. මේ ග්ලක්ෂ 20 මම හිතන්නෙ ප්‍රධාන අමාත්‍යතුමා එවල තියෙන්නෙ. හරියට වැඩ කර ගැනීඹ එදා හිටපු පාලන තන්ත්‍රෙ කරන්න ඕනෙ. ඒක නිසා මේව සම්බන්ධව හොඳට හොයල බලල ගෙවීම් කරන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

හල්වතුර කසළ දමන ස්ථානයේ ඉදිකිරීමත්, මේ කියන ටොයිලට් එකත් යන දෙකම මහජනතාවට සාධාරණ වෙන අන්දමින් ඉටු කරල තියෙනවද කියල සොයල බලන්න කමිටුවක් වශයෙන් වෙනම වාඩිවෙලා කටයුතු කරන්න. උප සභාපතිතුමා, ඩෙනට් මහත්මයත්,අතුල මහතා,ධම්මික කොඩිකාර මහත්මයත් දයානන්ද මහතා, එස්.එම්. සරත් මහතා සහ රාහුල මන්ත්‍රීතුමා ඇතුළු කමිටුවක් මගින් වාර්තාවක් හදල ඒක ඊලග සභාවට යොමු කරල මේ ගෙවීම පිළිබඳව තීන්දු කරමු.

8. 6 PF-7424 කැබ් රථයේ වායු සමීකරණ පද්ධතියේ සිදු කරන ලද අළුත්වැඩියාව වෙනුවෙන් රු. 30500.00 ක මුදලක් වතුගෙදර, පරගහතොට, නො. 05 හි ස්විස් ස්කූල් ඔටෝ ඒ.සී. වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**

සභාපතිතුමා මේ ඔබගේ නිල රථයද?මේවා කම්පැණි එකෙන් අලුත්වැඩියා කරන්නැද්ද.මුදලක් වැඩි පුරගියත් කම්පැණි එකෙන් කරන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

කම්පැණි දැම්මම වැඩි කාලයක් ගතවෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රිනී වඩුමේස්ත්‍රි නිලානි මෙනවිය කතා කරමින්**

සභාපතිතුමණි සැලසුම් විෂයේ කටයුතු කරද්දි පසු ගිය වසර 3 නේ වැඩ කෙරුනේ නෑ කීවට මම දැක්කා ධම්මිකා මිය සහ තවත් නිලධාරීනියක් කාර්යක්ෂමව හොඳට වැඩ කළා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

අපි මේ වැඩ කොටස් දැන් පවරලා තියෙන්නෙ.

8.7 2018 – 2 කාර්තුව මැයි 16-31 දක්වා VATමුදල වන රු. 115400.36 ක මුදලක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවීම සදහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සදහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.8 2018 – 2 කාර්තුව ජුනි 01-15 දක්වා VATමුදල වන රු. 292398.11 ක මුදලක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවීම සදහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සදහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.9 ගරු සභාපතිතුමා උප සභාපතිතුමා ඇතුළු නාගරික මන්ත්‍රීවරුන්ගේ ගමන් වියදම් වෙනුවෙන් රු. 48000.00 ක මුදලක් ගෙවීම සදහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සදහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.10 ෆොටෝ කොපි යන්ත්‍රය සදහා අළුතින් ටෝනර් එකක් මිලදී ගැනීම වෙනුවෙන් රු. 10925.00 ක මුදලක් ගාල්ල, ලංකා ටෙක්නොලොජි ආයතනය වෙත ගෙවීම සදහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැතිවූ බැවින් එම මුදල ගෙවීම සදහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

## (09) ගිණුම්

**9.1 2018මැයි මාසයට අදාල පොදු ගිණුම- වියදම් වැය විශ්ලේෂණය හා 2018 මැයි මස වියදම් වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

<u>**ගරු නගර සභා මන්ත්‍රී ගංගේ සරත් ශ්‍රීලාල් මහතා කතා කරමින්**</u>

වියදම් වාර්වේ. ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලයට රු.258.30යි.වතුර බිල 80290.00 යි.මේ තරම් මුදලක් යන්න හේතුව මොකක්ද ජලය සඳහා?

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මේ මුළු නගර සභාවටම ගණන.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**</u>

බිල් කිහිපයක් එකතු කරලා එවන කොට බලන්න ඕන හොඳින්.මොකද ගණන් වැඩි කරලා එවන වේලාවල් තියෙනවා.

## (10) weia;fika;=

10:1)

රොබ

<u>*තීරණය*</u>

**රොබට් වික්‍රමසූරිය පාර ඉතිරි කොටස සංවර්ධනය කිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු.120,000.00 ක ඇස්තමේන්තුව පිළිගතයුතු බවටත් මෙම මුදල සහා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්තමහතාවිසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:2) පෝරඹවලව්වපාරසංවර්ධනයකිරීමසඳහාතාක්ෂණසේවානිළධාරීවිසින්සකස්කරනලදරු. 500000/- ක්වූඇස්තමේන්තුවසභාගත කරන ලදී.

<u>**තීරණය**</u>

**පෝරඹ වලව්ව පාර සංවර්ධනය කිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු.500,000.00 ක ඇස්තමේන්තුව පිළිගතයුතු බවටත් මෙම මුදල සහා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්තමහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:3) මානිමුල්ල නිවාස යෝජනා ක්‍රමයේ කාණු පද්ධතිය සකස්කිරීමසඳහාතාක්ෂණසේවානිළධාරීවිසින්සකස්කරනලදරු. 550000/- ක්වූඇස්තමේන්තුවසභාගත කරන ලදී.

<u>**තීරණය**</u>

**මානිමුල්ල නගර සහා නිවාස පාර කාණු පද්දතිය සකස් කිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු.550,000.00 ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් මෙම මුදල සහා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රිනී ඒ.පී.ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:4) මහ අම්බලන්ගොඩ පොදු නාන ළිද අළුත්වැඩියාකිරීමසඳහාතාක්ෂණසේවානිළධාරීවිසින්සකස්කරනලදරු. 60,000/- ක්වූඇස්තමේන්තුවසභාගත කරන ලදී.

<u>**තීරණය**</u>

**මානිමුල්ල නගර සහා නිවාස පාර කාණු පද්ධතිය සකස් කිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු.550,000.00 ක ඇස්තමේන්තුව පිළිගතයුතු බවටත් මෙම මුදල සහා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනී ඒ.පී.ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:5) පොල්වත්ත වෙළඳ සංකීර්ණයේ ඇති වැසිකිළිය සහ වහල අළුත්වැඩියාකිරීමසඳහාතාක්ෂණසේවානිළධාරීවිසින්සකස්කරනලදරු. 50,000/- ක්වූඇස්තමේන්තුවසභාගත කරන ලදී.

<u>**තීරණය**</u>

**පොල්වත්ත වෙළඳ සංකීර්ණ ගොඩනැඟිල්ලේ අලුත්වැඩියාව (වැසිකිළිය සහ වහළ )සකස් කිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු.50,000.00 ක ඇස්තමේන්තුව පිළිගතයුතු බවටත් මෙම මුදල සහා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ස මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:6) නගර සභා ක්‍රීඩාංගණයේ කාණු පද්ධතිය අළුත්වැඩියා කිරීම (දේවානන්ද විදුහල අසල)සඳහාතාක්ෂණසේවානිළධාරීවිසින්සකස්කරනලදරු. 105000/- ක්වූඇස්තමේන්තුවසභාගත කරන ලදී.

<u>තීරණය</u>

**නගර සභා ක්‍රීඩාංගනය කාණු පද්දතිය අලුත්වැඩියාව (දේවානන්ද විදුහල අසල) සදහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු.1050,000.00 ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර උප සභාපති කමල් වැල්ලගේ ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:7) දළුක්කන්ද පාර අළුත්වැඩියාකිරීමසඳහාතාක්ෂණසේවානිළධාරීවිසින්සකස්කරනලදරු. 620000/- ක්වූඇස්තමේන්තුවසභාගත කරන ලදී.

<u>තීරණය</u>

**අම්බලන්ගොඩ දළුක්කන්ද පාර අළුත්වැඩියා කිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු.620,000.00 ක ඇස්තමේන්තුව පිළිගතයුතු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සබාපති කමල් වැල්ලගේ ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:8) සුදුවැල්ල පාර අළුත්වැඩියාකිරීමසඳහාතාක්ෂණසේවානිළධාරීවිසින්සකස්කරනලදරු. 800000/- ක්වූඇස්තමේන්තුවසභාගත කරන ලදී.

<u>තීරණය</u>

**අම්බලන්ගොඩ සුදුවැල්ල පාර අළුත්වැඩියා කිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු.800,000.00 ක ඇස්තමේන්තුව පිළිගතයුතු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:9) කළුවඩුමුල්ල ක්‍රීඩාංගණයදුර පනින වල සෑදීමසඳහාතාක්ෂණසේවානිළධාරීවිසින්සකස්කරනලදරු. 200,000/- ක්වූඇස්තමේන්තුවසභාගත කරන ලදී.

<u>තීරණය</u>

**කළුවඩුමුල්ල ක්‍රීඩාංගනය දුර පනින වල සැකසීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු.200,000.00 ක ඇස්තමේන්තුව පිළිගතයුතු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:10) ආර්.ඊ ද සිල්වා මාවත හරස් පාර කොන්ක්‍රීට් කිරීමසඳහාතාක්ෂණසේවානිළධාරීවිසින්සකස්කරනලදරු. 400,000/- ක්වූඇස්තමේන්තුවසභාගත කරන ලදී.

<u>තීරණය</u>

**ආර්.ඊ ද සිල්වා මාවත හරස් පාර කොන්ක්‍රීට් කිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු.400,000.00 ක ඇස්තමේන්තුව පිළිගතයුතු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා විසින් ස්ථිර**

**කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:11) දූව වත්ත පාර තාර දැමීම සඳහාතාක්ෂණසේවානිළධාරීවිසින්සකස්කරනලදරු. 270,000/- ක්වූඇස්තමේන්තුවසභාගත කරන ලදී.

<u>තීරණය</u>

**දූව වත්ත පාර තාර දැමීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු.270,000.00 ක ඇස්තමේන්තුව පිළිගතයුතු බවටත් මෙම මුදල සහා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:12) ශ්‍රී බුද්ධදත්ත මාවත ප්‍රතිසංස්කරණය කිරීම සඳහාතාක්ෂණසේවානිළධාරීවිසින්සකස්කරනලදරු. 510000/- ක්වූඇස්තමේන්තුවසභාගතකරනලදී.

<u>තීරණය</u>

**ශ්‍රී බුද්ධදත්ත මාවත අලුත්වැඩියාව සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු.510,000.00 ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් මෙම මුදල සහා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**

10:13) පොල්වත්ත බුද්ධදත්ත දෙවන හරස් පාර කාණු පද්ධතිය සකස් කිරීම සඳහාතාක්ෂණසේවානිළධාරීවිසින්සකස්කරනලදරු. 70,000/- ක්වූඇස්තමේන්තුවසභාගතකරනලදී.

<u>තීරණය</u>

**පේල්වත්ත බුද්දදත්ත දෙවන හරස් පාර කාණු පද්දතිය (නිපුන් රංසික මහතාගේ නිවස අසල) සකස් කිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු.70,000.00 ක ඇස්තමේන්තුව පිළිගතයුතු බවටත් මෙම මුදල සහා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:14) පොල්වත්ත ක්‍රීඩාංගනය අසල ආරක්ෂිත ආවරණය සඳහාතාක්ෂණසේවානිළධාරීවිසින්සකස්කරනලදරු. 16,000/- ක්වූඇස්තමේන්තුවසභාගතකරනලදී.

<u>තීරණය</u>

**පොල්වත්ත ක්‍රීඩාංගනය අසල ආරක්ෂිත කොන්ක්‍රීට් ආවරනය සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු. 16,000.00 ක ඇස්තමේන්තුව පිළිගතයුතු බවටත් මෙම මුදල සහා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:15) අම්බලන්ගොඩ සුදු වැල්ල නගර සභා පෙර පාසලට ගමන් කරන මාර්ගය අලුත්වැඩියා කිරීම සඳහාතාක්ෂණසේවානිළධාරීවිසින්සකස්කරනලදරු.300,000/- ක්වූඇස්තමේන්තුවසභාගතකරනලදී.

<u>තීරණය</u>

**අම්බලන්ගොඩ සුදුවැල්ල නගර සභා පෙර පාසලට ගමන් කරන මාර්ගය අළුත්වැඩියා කිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු.300,000.00 ක ඇස්තමේන්තුව පිළිගතයුතු බවටත් මෙම මුදල සහා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල්**

**වැල්ලගේ ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:16) අම්බලන්ගොඩ සුදු වැල්ල පාර කාණු පද්ධතිය කොටසක් ඉදිකිරීම සකස් සඳහාතාක්ෂණසේවානිළධාරිවිසින්සකස්කරනලදරු.910,000/- ක්වූඇස්තමේන්තුවසභාගතකරනලදී.

<u>තීරණය</u>

**අම්බලන්ගොඩ සුදු වැල්ල පාර කාණු පද්ධතියේ කොටසක් සකස් කිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු.910,000.00 ක ඇස්තමේන්තුව පිළිගතයුතු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ ද සිල්වාමහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:17) අම්බලන්ගොඩ දළුක්කන්ද පාර කාණු පද්ධතිය කොටසක් සකස් කිරීම සඳහාතාක්ෂණසේවානිළධාරිවිසින්සකස්කරනලදරු.850,000/- ක්වූඇස්තමේන්තුවසභාගතකරනලදී.

<u>තීරණය</u>

**අම්බලන්ගොඩ දළුක්කන්ද පාර කාණු පද්ධතියේ කොටසක් සකස් කිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු.850,000.00 ක ඇස්තමේන්තුව පිළිගතයුතු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ ද සිල්වාමහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:18) අම්බලන්ගොඩ හල්වතුර කසල දමන ස්ථානයේ කසල තුනී කිරීම සහ පස් තුනී කිරීම සඳහාතාක්ෂණසේවානිළධාරිවිසින්සකස්කරනලදරු1,977,835.75ක්වූඇස්තමේන්තුවසභාගතකරනලදී.

<u>තීරණය</u>

**අම්බලන්ගොඩ හල්වතුර කසල දමන ස්ථානයේ කසල තුනී කිරීම සහ පස් තුනී කිරීම සඳහාතාක්ෂණසේවානිළධාරිවිසින්සකස්කරනලදරු1,977,835.75ක්වූඇස්තමේන්තුවපිළිගතයුතු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු මන්ත්‍රී ලසන්ත අජිත් කුමාරමහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:19) මහ අම්බලන්ගොඩ දෙල්දූව පාර ප්‍රතිසංස්කරණය කිරීම සඳහාතාක්ෂණසේවානිළධාරිවිසින්සකස්කරනලද රු.3,400,000.00ක්වූඇස්තමේන්තුවසභාගතකරනලදී.

<u>තීරණය</u>

**මහ අම්බලන්ගොඩ දෙල්දූව පාර ප්‍රතිසංස්කරණය කිරීම සඳහාතාක්ෂණසේවානිළධාරිවිසින්සකස්කරනලදරු.3,400,000.00ක්වූඇස්තමේන්තුවපිළිගතයුතු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු මන්ත්‍රිනී ඒ.පී.ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මෙනවිය විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ ද සිල්වා මහතා කතා කරමින්</u>

සභාපතිතුමණි ඉල්ලා සිටිනවා තල්ගස්ගොඩ වැඩ කොටස් ටෙන්ඩර් කරලා සිදු කරන්න කියලා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මං සියලුම මන්ත්‍රීවරුන්ට දැනගන්න කියන්නේ.මේ වැඩ කඩිනමින් කිරීමට අවශ්‍ය නිසා මං කීවා ටෙන්ඩර් කරන්න කියලා.මාස 2- 3 ක් තිස්සේ ටෙන්ඩර් ඩොකියුමන්ට් හදාගන්න බැරි වෙලා තියෙන්නේ.මේ නිලධාරීන්ට මේ පුහුණුව ලබා දිය යුතුයි ප්‍රථමයෙන්ම.

**<u>ගරු නගර සභා මන්ත්‍රීනී ඊ ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

මං පාරවල් 02 ක් සංවර්ධනය කරලා දෙන්න කියලා ඉල්ලුවා.කොඩිකාර පෙදෙස දැඩි ලෙස අබලන් වී ඇති මාර්ගයක්.ඔබතුමා ගිය වාරයේදී කීවා මේක කරලා දෙන්නම් කියලා.නමුත් මේ සම්බන්ද ඇස්තමේන්තවක් සභාවට ඉදිරිපත් වෙලා නෑ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපට සමහර මාර්ග පැච් කරලා හදන්න පුළුවන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රීනී ඊ ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

මේ මාර්ගය සම්පූර්ණයෙන්ම හදන්න ඕන.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රීවරු දන්නවා දැනට කිසිදු මාර්ගයක් ප්‍රතිසංස්කරණය නෙකරපු ප්‍රෙද්ශ තියෙනවා.එක කොට්ටාශයකට එක දවස බැගින් තියෙන්නේ.දැන් මේ කාර්යය නතර වෙලා තියෙනවා විලේගොඩින්.ඊලඟට පනියන්දුවට හා හිරේවත්තට යන්න ඕන.අපි කළුවඩුමුල්ලේ ප්‍රධාන පාර හරි පැච් කරලා හදලා දෙන්නම්.ඔබතුමිය ඉල්ලපු මානිමුල්ල පාර සහ වටරවුම් පාර අපි හදලා දුන්නා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමා ප්‍රදේශයේ වැඩ කරන කොට ඉන්නේ එක මන්ත්‍රී කෙනෙක් විතරක් නෙවෙයි.මන්ත්‍රීවරු හැමෝම දැනුවත් රකන්න ඕන.පහුගිය දින වල පොල්වත්තේ වැඩ කරනකොට මං දන්නෑ.එකනිසා දැනුවත් කරන්න ඕන.පොල්වත්තේ වැඩක් කරන කොට මම දැන ගන්න ඕන.මොකද මට මහ ඇමතිතුමාගෙන් මුදල් ගන්න පුළුවන්.දැනටමත් නුගේතුඩුව පාරේ ලයිට් දාන්න රු.865000.00 ක් වෙන් කරලා තියෙනවා.මේ ඉන්න කිසිදු මන්ත්‍රීවරයකුට එහෙම මුදල් ලැබෙන්නෑ.එනිසා පොල්වත්තේ වැඩක් කරන කොට මාව දැනුවත් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මුදල් ගැනීමේ හැකියාව තියෙන අයට අපි අවස්ථාව දෙන්න ඕන.මං ඔබතුමා ගැන වසර 13 ක් දන්නවා.ඔබතුමා හොඳින් වැඩ කරනවා.නමුත් නවක මන්ත්‍රීවරු ඉන්නවා.ඔවුන්ටත් වැඩ කිරීමේ හැකියාව තියෙන නිසා අපි ඔවුන්ටත් අවස්තාව දෙන්න ඕන.අපි ඔබතුමාට යහපත් දේට සහයෝගය දක්වනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩී.ධර්මදාස මහතා කතා කරමින්</u>**

ධනසේන මාදුවගේ මන්ත්‍රීතුමා කියනවා එතුමාලට මහ ඇමතිතුමා සල්ලි දෙනවා කියලා.එතකොට අපට කවුද දෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රීනී ඒ.පී.ලක්ෂ්මී හේමන්තාද සිල්වා නෙවිය කතා කරමින්</u>**

මටනම්ඒගැටළුවනෑ.තුඩුවමුල්ලපාරඇස්තමේන්තකිරීමේදීනිලානිමන්ත්රීතුමියගෙදරටඇවිත්මටකීවා.මංනීලා නිමන්ත්රීතුමියඑතනරදවලාමමආවා.එටඑහෙමගැටළුවක්නෑ.මටඕනවැඩකරන්නවිතරයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩනගරසභාවෙන්කොහේවැඩක්කරත් මම දවසට පැයක් හරි එතනට යනවා.අපේ නගර සභාවේ සුපවයිසර්ලා හිගයක් තියෙනවා.සුපවයිසර් කරන්නත් වෙන්නේ මන්ත්‍රීවරුන්ට.තාක්ෂණ සේවා නිලධාරී ඇස්තමේන්තු කිරීමේදී කොට්ඨාශයේ සියලුම මන්ත්‍රීවරුන්ට කියන්න.එයා කොට්ඨාශ 13 ක වැඩ කරන්න ඕනනේ.එනිසා ඔයා මන්ත්‍රීවරුන්ට වේලාවක් කියන්න.එයාලා එනවනම් ඒවී.

**(11)** fjk;a IreKq

11:1 **‘ මාර්ගය නගර සභාවට පවරා සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලීම ’** මැයෙන් අම්බලන්ගොඩ, පින්නදූව ,නො.75/2 , ක්‍රිෂ්ණා ජයවීර මහතා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

මාර්ගය නිරන්තරයෙන් වර්ෂාවට සේදී යාම සිදුවන බැවින් ඉතා අබලන් මට්ටමේ බවතින එල්.සී.ද සිල්වා මාවතේ අතුරු මාවත නගර සභාවට පවරා දීමට සියල්ලන් කැමැත්ත ප්‍රකාශ කරන බවත් මාර්ගය ප්‍රතිසංස්කරනය කර දීමට කටයුතු කරන ලෙසත් ක්‍රිෂ්ණා ජයවීර, ප්‍රියන්ත කුමාරසිරි,කේ.එල්.පුෂ්පා චන්ද්‍රලතා, නයෝමි කංචනා,ජී.ඩබ්.ධනවතී,බී.ඒ.හසේර කුමාර මෙන්ඩිස් යන මහත්ම මහත්මීන් අත්සන් කර ඉල්ලා තිබුණි.

__.ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්__

මේ ඉල්ලීම කරපු අය මේ පිළිබඳව මාවත් දැනුවත් කළා, මට කිවා මේ පිළිබඳව ඔබතුමාව දැනුවත් කලා කියලා.මේ පාර පින්නදූව ප්‍රදේශයේ ප්‍රතිසංස්කරණය නොකර තියෙන එකම පාර වෙන්න ඇති මං හිතන විදියට.

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

අදාළ පැවරීම් නියෝග සබාවට ඉදිරිපත් කරන්න ඕන.

__තීරණය__

**පින්නදූව අම්බලන්ගොඩ පදිංචි ක්‍රිෂ්ණා ජයවීර මහතා විසින් එල්.සී.ද සිල්වා මාවතේ ඇති අතුරු මාර්ගය නගර සභාවට පවරාගන්නා ලෙස කරන ලද ඉල්ලීම පිළිබඳ සාකච්ජා කළ සභාව මේ සම්බන්ධ-යෙන් අදාළ පැවරීම් නියෝග ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මාර්ගය නගර සභාවට පවරා ගැනිමට කටයුතු කරන ලෙසට ගරු නගර සභා මන්ත්‍රී කෙරමිණියගේ ශ්‍රේෂන් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:2** **“ අයිඩියල් සිටි මාර්ගයට ගල් අතුරා තාර දමා සකස් කර ගැනීමට සිදු කරනු ලබන ඉල්ලීම”**මැයෙන් අම්බලන්ගොඩ,කැපු ඇල පාර.අයිඩියල් සිටි ප්‍රෙද්ශවාසීන් විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

අයිඩියල් සිටි ප්‍රෙද්ශයට ඇතුළු වන පවුල් 14 ක් පදිංචි පාර නගර සභාව මඟින් මේ දක්වා කිසිදු නඩත්තු කටයුත්තක් සිදු කර නොමැති බැවින් මෙම මාර්ගය සංවර්ධනය කිරීමට අදාල ප්‍රතිපාදන ඩී.ධර්මසාස නාගරික මන්ත්‍රීතුමාට වෙන් කර දෙන මෙන් ප්‍රෙද්ශවාසීන් 14 දෙනෙකු අත්සන් කරමින් ඉල්ලා තිබුණි.

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

මාර්ගය නගර සභාවට පවරා නොමැති නම් ප්‍රථමයෙන් මාර්ගය පැවරීම කළ යුතුය.

__තීරණය__

**කැපු ඇළ පාර අම්බලන්ගොඩ පිහිටි අයිඩියල් සිටි මාර්ගය ගල් අතුරා තාර දමා සකස් කර දෙ ලෙස ප්‍රෙද්ශවාසීන් කරන ලද ඉල්ලීම සම්බන්ධයෙන් ප්‍රතමයෙන් පැවරීම් සිදු කර නොමැති නම් පැවරීම් සිදු කරන ලෙසටත් ඉන්පසුව මෙය ඉටු කිරීමට කටයුතු සිදු කිරීමටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුන ප්‍රදීප් මහතා යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඩී.ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:3** **' කෙරමිණිය පින්නදූව ක්‍රීඩා පිටියසඳහා පරිතයාග කරනු ලැබූ බිම් කොටස සම්බන්ධවයි '**මැයෙන් ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් එවා තිබූ ලිපිය සභාගත සභාගත කරන ලදී.

කෙරමිණිය පින්නදූව පුස්තකාලය අසල ක්‍රීඩා පිටියක් ගොඩනැංවීම සඳහා පරිත්‍යාගශීලී එස්.එම්.මල්ලිකා මහත්මිය සින්නක්කර ඔප්පුවක් මඟින් නගර සභාවට ප්‍රදානය කළ ඉඩම මැන මායිම් ගල් පිහිටුවා නිශ්චිත භූමිය වෙන් කරන ලෙස ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

**කෙරමිණිය පින්නදූව පුස්තකාලය අසල ක්‍රීඩාපිටියක් ගොඩනැඟීම සඳහා නගර සබාවට ප්‍රදානය කර ඇති ඉඩම මායිම් ගල් පිහිටුවා නිශ්චිතව භූමිය වෙන් කර දෙන ලෙස ගරු කෙරමිණියගේ ශ්‍රේෂන් මහතා විසින් කරන ලද ඉල්ලීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝදතාවයක් නොතිබූ බැවින් සබාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:4** **' අම්බලන්ගොඩ - ඕකන්ද ප්‍රජා ශාලා ගොඩනැඟිල්ලට වම් පසින් ගබඩා කාමරයක් සාදා දෙන ලෙසඉල්ලා සිටීම '**මැයෙන් ඕකන්ද එක්සත් මරණාධාර සමිතිය විසින් එවා තිබූ ලිපිය සභාගත සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ ඕකන්ද ප්‍රජා ශාලාව ගමේ සමාජ හා සුභ සාධන සමිති විසින් රැස්වීම් සඳහා භාවිතා කරන බවත් ග්‍රාම සංවර්ධන හා සමෘද්ධි සංවර්දන කාර්යාල මෙම ගොඩනැඟිල්ලේ පවත්වා ගෙන යන බවත් මරණාධාර සමිතිය විස්න් තමන් සතු ටකරන්,ටෙන්ට් ,කොඩි සහ පුටු ආදිය මෙම ගොඩනැඟිල්ලේම ගබඩා කර තබන බවත් රැස්වීම් පැවැත්වීමේදී මෙය බාධාවක් වන බැවින් මෙම ගොඩනැඟිල්ලේ වම් පසින් පිහිටි ත්‍රිකෝණාකාර කොටසෙහි ගබඩා කාමරයක් ඉදිකර දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>.ගරු නගර සභා මන්ත්‍රීනී ඊ ඉන්ද්‍රාඅයිරාංගනී මහත්මිය කතා කරමින්</u>

මෙම කටයුත්ත අත්‍යාවශ්‍ය දෙයක්.මේ ගොඩනැඟිල්ලේ නිලධාරීන් ඉන්නවා,ගොඩනැඟිල්ල ඇතුලෙමයි බඩු තියලා තියෙන්නේ.බඩු ගෙනියන්න ආවම මේක විශාල ගැටළුවක් වෙනවා මොකද යතුරු පරිහරණය සම්බන්දයෙන්.සමෘද්ධි රැස්වීමක් තියන කොට බඩු අස්කරලා ඕන රැස්වීම තියන්න.මේක මරණාධාර සිමිතියට මහ ඇමතිතුමාගෙන් ලැබුණු ගොඩනැඟිල්ලක්,දැන් මේක නගර සභාව සතු කරලා තියෙනවා.මං මේ ගරු සබාවෙන් ඉල්ලා සිටිනවා මේක අත්‍යාවශ්‍ය කරුණක් නිසා සහ රජයේ විමධ්‍යගත මුදල් වලින් ලබා දීපු වටිනා බඩු තියෙන් නිසා ඒවා ආරක්ෂා කරන එක අපේ යුතුකමක්.එනිසා මේක කරලා දෙන්න කියලා.ඉඩමත් තියෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

සභාපතිතුමා ඔබතුමාලා අපි ඉන්න කාලේ නගර සභා ප්‍රතිපාදන සහ මහ ඇමතිතුමාගේ ප්‍රතිපාදන දාලා තමයි මේ ප්‍රජා ශාලාව හැදුවේ.මේ කියන කතාව නිවැරදියි.මුළුන්ම කරන්න ඕන ප්‍රක්‍ඩා ශාලාවට අදාල භූමියේ මායිම් නිරවුල් කරගන්න ඕන.ඊට පසුව පොඩි වියදමකින් මේ ගොඩනැඟිල්ල හදලා දෙන්න පුළුවන්.

<u>ගරු නගර සභා මන්ත්‍රීනී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමණි,තුඩුවමුල්ල ගම්වාසීන්ගේ ඉල්ලීම පරිදි ගරු ප්‍රදාන අමාත්‍යතුමා මරණාධාර සමිතිය සඳහා ලක්ෂ 15 ක් එවලා තියෙනවා.ඔබතුමා ඒක අනුමත කරලා දුන්නා කීවා.මං සියලුම මන්ත්‍රීවරුන්ට ස්තුති කරනවා ඒ සම්බන්ධයෙන්.ඉල්ලීම කරප් අය කීවා ගරු සභාවේදී මේ සම්බන්ධයෙන් ඔවුන්ගේ ස්තුතිය ප්‍රකාශ කර සිටින්න කියලා.

<u>ගරු නගර සභා මන්ත්‍රීනී ඒ.පී.ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>

ප්‍රධාන අමාත්‍යතුමා ලක්ෂ 15 ක් මේ සම්බන්ධව වෙන් කිරීම වෙනුවෙන් ප්‍රථමයෙන් ස්තූතිවන්ත වෙනවා.මේන්ක අපේ ගමට සම්පතක්.මේ ඉඩම පවරා දීමට අදාල අපේ කැමැත්ත අපි ප්‍රකාශ කර සිටියා.ඒ සම්බන්ධව ඉඩම පවරා දීමට කැමැත්ත පල කර මේ මන්ත්‍රීවරුන්ටත් මගේ ස්තූතිය මම ප්‍රකාශ කර සිටිනවා.ඒ වගේම ඕකන්ද ප්‍රජාශාලාව වම් පසින් ගබඩා කාමරයක් ඉදිකිරීම සඳහා එතන ගොඩනැගිල්ලක් තියෙනවා නම් අවසර ඉල්ලලා නම් මේක කරන්නේ ඒ සම්බන්දයෙන් මගේ කිසිදු විරෝදතාවයක් නෑ.මොකද අපේ නගර සබා ඉඩම් වල අනවසර ඉදිකිරීම් වන යුගයක මේක ඉල්ලන්නේ ගමේ මරනාධාර සමිතියට නිසා සහ ඔවුන් නීති ානුකූලව ඉල්ලීම කරන නිසා අවසර දීම සම්බන්ධව මගේ විරෝධතාවයක් නහැ.

<u>.ගරු නගර සභා මන්ත්‍රිනී ඊ ඉන්ද්‍රාඅයිරාංගනී මහත්මිය කතා කරමින්</u>

මේ ප්‍රජාශාලාව හදලා තීලා තියෙන්නේ අපේ සමිති සමාගම් කරන්න.දැන් සමෘද්ධී නිලධාරී,ග්‍රාම නිලධාරී එක්කොම ඉන්නවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ ප්‍රජා ශාලාව හැදුවේ නගර සභාවේ මුදල් වලින්.ඔතන කුඩු ගහන්න,බොන්න ගත්තා.එකපාරක් ඕතන ගිනි තිබ්බා.පුටු වගයකුත් ගිනි ගත්තා.මෙවැනි දේවල් නතර කරන්න ඕන.

<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඊ ඉන්ද්‍රාඅයිරාංගනී මහත්මිය කතා කරමින්</u>

දැන් එවැනි දේවල් සිදු වෙන්නෑ.සම්පූර්න පාලනය අපි අරගන තියෙන්නේ.ඒ අයට විරුද්දව නීතිය ක්‍රියාත්මක කළෙත් අපි.දැන් මේ ස්ථානයේ වටිනා බඩු රැසක් තියෙන නිසා මේක කරන්න ඕන.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

පවතින ගොඩනැගිල්ලෙහි අලංකාරයට හානි නොවන පරිදි මේය ඉටුකළ යුතුයි.

<u>තීරණය</u>

**ඕකන්ද එක්සත් මරණාධාර සමිතිය සඳහා අම්බලන්ගොඩ ඕකන්ද ප්‍රජා ශාලා ගොඩනැගිල්ට වම් පසින් ගබඩා කාමරයක් සාදා දෙන ලෙස එක්සත් මරනාදාර සමිතයෙහි සබාපතිතුමා විසින් කරන ලද ඉල්ලීමට අන්ව අදාල කොටස මැන මායිම් වෙන් කර ගන්නා ලෙසත් ප්‍රජා ශාලා ගොඩනැගිල්ලට අවලස්සන නොවන පරිදි ගබඩා කාමරයක් එක්කරගන්නා ලෙසටත් ගරු සබාපති එම්.ඩබ්.අරුන ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රීනීඊ ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථීර කරන ලදුව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:5** **‘ බස්නැවත්ම්පොල ව්‍යාපෘතිය තැන්පත් ගිණුමේ ඇති ශේෂයෙන් බස්නැවත්ම්පොල ව්‍යාපෘතිය සඳහා ලබාගෙන ඇති ණය මුදල ගෙවීම සම්බන්ධයෙන් ගිණුම් විෂය නිලධාරී ඉදිරිපත් කරන ලද වාර්තාව පරිදි පහත සඳහන් නිර්දේශ’**ලේකම්තුමිය විසින් සභාවට ඉදිරිපත් කර තිබුණි.

I. අක්‍රිය වී ඇති 035200196318575 දරණ ඉහත ගිණුම සක්‍රීය කර ගැනීම සඳහා බැංකුව විසින් උපදෙස් දුන් පරිදි පොදු ගිණුමෙන් යම්කිසි මුදලක් (සභා අනුමැතිය පරිදි) මෙම ගිණුමට බැර කිරීම.

II. එම ගිණුම මඟින් ගණුදෙණු කිරීම සඳහා සභාවේ චෙක්පත් සඳහා අත්සන් කිරීමට බලය පවරා ඇති නිලධාරීන්ගේ අත්සන් බැංකුව වෙත ලබාදීම.

**III.** බස් නැවතුම්පොල ව්‍යාපෘතියේ 2017.12.31 දිනට හිඟ ණය ශේෂය හා පොලිය පිළිබඳ සහතිකයක් නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබාගෙන එම මුදල කොටස් වශයෙන් හෝ සභාව අනුමත කරන පරිදි ගෙවීම සඳහා අවශය පියවර ගැනීම.

__තීරණය__

**බස් නැවතුම්පොළ ව්‍යාපෘතිය තැන්පත් ගිණුමේ ඇති ශේෂයන් බස් නැවතුම්පොළ ව්‍යාපෘතිය සඳහා ලබා ගෙන ඇති ණය මුදල ගෙවීම සම්බන්ධයෙන් විෂය නිලධාරී විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව සඳහා සභාව අනුමැතිය ලබා දෙන ලදි.**

## (12) න්‍යාය පත්‍රයට ඇතුලත් නොවූ වෙනත් කරුණු

12.1 **' JCB යන්ත්‍රය සහ කොඩි කණු ලබා ගැනීම සම්බන්ධවයි'**මැයෙන්අම්බලන්ගොඩ, කැටන්තොට, සුමනාරාමයේ විහාරාධිපති ශාස්ත්‍රපති යටියන සීවලී ස්වාමින් වහන්සේ විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

ඇසල පොහොය නිමිත්තෙන් 26,27,28, සහ 29 යනදිනවලඋත්මිධාතුවන්දනාවක්ඇතුළුවපිංකම්රාශියක්සිදුකිරීමටනියමිතබැවින්පන්සලඅවටපරිසරයපවිත්‍රකරගැනීමටජූලි 09 වනදිනනොමිලයේJCB යන්ත්‍රයලබාදෙනලෙසත්කොඩිකණු 50 ක්ලබාදිමටකටයුතුකරනලෙසත්ඉල්ලාතිබුණි.

__තීරණය__

**අම්බලන්ගොඩ කැටන්තොට සුමනාරාම විහාරස්ථානයේ විහාරාධිපති ශාස්ත්‍රපති යටියන සීවලී ස්වාමින් වහන්සේ විසින් කරන ලද ඉල්ලීම පරිදි JCB යන්ත්‍රය සහකොඩිකණු 50 ක්නොමිලයේ ලබාදිමට ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

12.2 **' දකුණු පළාත් රාජ්‍ය සේවා ක්‍රීඩා උළෙල - 2018 - කලාප තෝරා ගැනීම් තරඟ සඳහා පොල්වත්ත පියසේන ක්‍රීඩාංගනය වෙන් කරවා ගැනීම'**මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

දකුණු පළාත් රාජ්‍ය සේවා ක්‍රීඩා උළෙලට අම්බලන්ගොඩ කලාපය නියෝජනය කරමින් සහභාගී වන සැහැල්ලු පන්දු ක්‍රිකට් කණ්ඩායම තෝරා ගැනිමට අදාළව අම්බලන්ගොඩ,බලපිටිය,බෙන්තර,කරන්දෙණිය, හා ඇල්පිටිය ප්‍රාේදේශිය ලේකම් කාර්යාල අතර පැවැත්වෙන් තෝරා ගැනිමේ තරග සඳහා 2018.07.05 දින පෙ.ව.8.30 සිට පස්වරු 5.00 දක්වා පොල්වත්ත පියසේන ක්‍රිඩාංගනය නොමිලයේ වෙන් කර දෙන මෙන් ඉල්ලා තිබුණි.

__තීරණය__

**2018 දකුණු පළාත් රාජ්‍ය සේවා ක්‍රිඩා උළෙල කලාප තෝරා ගැනිම් තරඟ සඳහා 2018.07.05 දින පෙ.ව.8.30 සිට ප.ව.5.00 දක්වා අම්බලන්ගොඩ පොල්වත්ත පියසේන ක්‍රීඩාංගනය නොමිලයේ ලබා ගැනීම සඳහා අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කරන ලද ඉල්ලීමට අනුව ක්‍රීඩාංගනය නොමිලයේ ලබා දිම සඳහා ගරු මන්ත්‍රිවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

12.3 **' අධ්‍යාපන චාරිකාවක් සඳහා බස් රථ ලබා ගැනීම,** මැයෙන් පෙර පාසල් ගුරුවරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

පෙර පාසල් දරු දැරියන්ගේ වාර්ෂික අධ්‍යාපන චාරිකාව 2018.09.14 දින යාමට තීරණය කර ඇති බවත් ඒ සඳහා පෙර පාසල් දරු දැරියන් 125 ක් සහ භාරකරුවන් සහභාගී වීමට නියමිත බැවින් අවශ්‍ය ප්‍රවාහන පහසුකම් ලබා දෙන ලෙස නගර සභා පෙර පාසල් 09 ය විසින් ඉල්ලා තිබුණි.

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

පෙර පාසලකට එක බැගින් ලබා දෙන්න බෑ.ළමයි 125 ඉන්නේ.බස් 03 ක් ලබා දෙමු.

__තීරණය__

**2018.09.14 දින අම්බලන්ගොඩ නගර සභාවට අයත් පෙර පාසල් දරු දැරියන්ගේ වාර්ෂික අධ්‍යාපන චාරිකාව යාම සඳහා ප්‍රවාහන පහසුකම් ලබා ගැනීමට පෙර පාසල් ගුරුවරුන් විසින් කරන ලද ඉල්ලීමට අනුව සහා අරමුදලින් බස් රථ 03 ක් ලබා දීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

12.4 ‘ **2018 දෙවන කාර්තුව සඳහා සිසුන් බඳවා ගැනීම** ’ මැයෙන් බලපිටිය කාර්මික විද්‍යාලයේ විදුහල්පතිනිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

කාර්මික විද්‍යාලයේ දෙවන කාර්තුවේ පැවැත්වෙන පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීම සිදු කරමින් පවතින බැවින් මේ පිළිබඳව ප්‍රදේශවාසීන් දැනුවත් කිරීමට සකස් කරන ලද 6 * 3 ප්‍රමාණයේ දැන්වීම් පුවරුවක් අම්බලන්ගොඩ නගරයේ ප්‍රදර්ශනය කිරීමට අවශ්‍යව ඇති බවත් එම දැන්වීම් පුවරුව නොමිලයේ ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

**බලපිටිය කාර්මික විද්‍යාලය විසින් 2018 දෙවන කාර්තුවට පාඨමාලා සඳහා සිසුන් ඇතුළත් කර ගැනිම සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා සකස් කරන ලද 6×3 ප්‍රමාණයේ දැන්වීම් පුවරුවක් මුදල් අයකිරිමකින් තොරව අම්බලන්ගොඩ නගරයේ ප්‍රදර්ශනය කිරීම සඳහා කරන ලද ඉල්ලීම සඳහා සභාව ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.**

**12.5** ‘ **කිරි අලෙවි හලක් පවත්වාගෙන යාම**’ මැයෙන් ප්‍රාදේශීය අලෙවිකරු කළමණාකරු,මිල්කෝ පුද්ගලික සමාගම,ගාල්ල විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

අංක 08,විලේගොඩ,අම්බලන්ගොඩ ලිපිනයේ අජිත් හේමන්ත යන අය විසින් බස් නැවතුම්පොල පරිශ්‍රයේ හයිලන්ඩ් කිරි හලක් පවත්වා ගෙන යාම සඳහා මිල්කෝ ආයතනයට අයදුම්කර ඇති බවත් ඒ සඳහා මෙම පරිශ්‍රෙය් සුදුසු ගොඩනැඟිල්ලක් පවතීනම් ඒ සඳහා අවසර ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

කිරි හලෙහි සැලැස්මකුත් ඔවුන් අපට එවලා තියෙනවා

<u>ගරු නගර සභා මන්ත්‍රීන ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

මේක ඉල්ලලා තියෙන්නේ ව්‍යාපාර කටයුත්තකට නේද? අපට පුළුවනිද එහෙම නගර සභාවට අයත් දේපල දෙන්න.අනෙක් අයත් ඉල්ලුවොත් දෙන්න වෙනවා නේද?

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ සම්බන්ධයෙන් ආදායම් පරීක්ෂක මහතා විසින් වාර්තාවක් ඉදිරිපත් කරලා තියෙනවා.මේ කිරිහල වෙළඳහල ඉදිරිපිට ස්ථානගත කිරීම සුදුසු බවත් එමඟින් ජනතාවට සේවයක් සැලසෙන බවත්මේ සඳහා මාසික බදු කුලිය අවම වශයෙන් මසකට රු.6000.00 ක් යෝජනා කරන අතර ඉදිරිකටයුතු සඳහා සභාවට යොමු කරනවා කියලා වාර්තා කරලා තියෙනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ ද සිල්වා මහතා කතා කරමින්</u>

මේක ගැටළුවක් වෙන්න පුළුවන් සභාපතිතුමා, ආදායම් පරීක්ෂක මහත්තයා වාර්තාවක් ඉදිරිපත් කරලා තියෙනවනම් මේතන දෙන්න සුදුසුයි කියලා, ඒක ටෙන්ඩර් කරන්න.මිල්කෝ එකෙන් වගේම නෙස්ලේ එකෙනුත් ඉල්ලුවොත් මොකද වෙන්නේ.ඒකටත් දෙන්න වෙනවනේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

සභාපතිතුමා අපි කලිනුත් දුන්නා ඔතන කිරි හලක් පවත්වා ගෙන යන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**
පශු සංවර්ධන වෛද්‍ය අධිකාරීවරයාට අපි ස්ථානයක් ලබාදීලා තියෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

මිනිස්සු සොයාගන යන දෙයක් හයිලන්ඩ් නිෂ්පාදන.මේ වර්ගය සොයාගන්න නෑ.මේක හොඳ නිෂ්පාදනයක් නිසා මිනිස්සුන්ට කිරි ටිකක් ලබාගන්න අවස්ථාවක් ලබාදීම හොඳයි.එනිසා මේක ලබා දෙනවනම් හොඳයි.ලබා දෙන ක්‍රම වේදය නගර සභාව විසින් තීරණය කළාට කමක් නෑ.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර මහතා කතා කරමින්**

මෙම ස්ථානය ලබා දිම පිළිබඳ අපට ගැටළුවක් නෑ.නමුත් මේක කරන්නේ මොන ක්‍රම වේදයටද කියන එක පැහැදිලිව තියෙන්න ඕන.මේක ටෙන්ඩර් කරන්න ඕන.එක වසරකටද? වසර පහකටද කියන එක තියෙන්න ඕන. එහෙ කොන්දේසි ඇතිව නීතිානුකූල පදනමක් යටතේ මේක දෙන්න ඕන.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**

මිල්කෝ වෙළඳ ආයතනයක් අම්බලන්ගොඩ නෑ.ගාල්ලේ තියෙනවා.අනුරාධපුරත් තියෙනවා.එනිසා මේක දීම සම්බන්ධව අපේ විරෝධතාවයක් නෑ.නමුත් කොන්දේසි සහිතව ලබා දීම සිදුකරන්න ඕන.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ ද සිල්වා මහතා කතා කරමින්**

මේක වැරදි පූර්වාදර්ශයක් ලබා දීමක්.ඒ පුද්ගලයා ඇවිත් මාවත් හමුවේලා මට කීවා විස්තරය.බස්නැවතුම්පොලේ මෙහෙම දෙන්න ගියොත් හැමෝටම දෙන්න වෙනවා.එතුමාගේ කඩයකුත් තියෙනවා මෙතන.එහෙම තියාගන තමයි ඉල්ලන්නේ.ඒක වැරදි පූර්වාදර්ශයක් වනවා.වෙනත් කෙනෙක් මිල්ගෝ එකෙන් ලිපියක් ගෙනාවත් දෙන්න වෙනවා.එනිසා මෙවැනි දේවල් සඳහා අවසර ලබා දෙන්න එපා කියලා මං ඉල්ලනවා.මගේ විරෝධතාවය මම ප්‍රකාශ කර සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්**

මිල්කෝ ආයතනය කියන්නේ දේශීය සම්පත් අපේ ජනතාවගේ අතට පත් කරන ආයතනයක්.අම්බලන්ගොඩ බස් නැවතුම්පොල අවිධිමත් වෙළඳ ක්‍රියාකාරකම් නිසා අවභාවිතා වේලා තියෙනවා.නමුත් මේ වෙළඳ හළ පිහිටුවීමෙන් කිසිදු අවහිරයක් නොවන බව තමයි මගේ අදහස.මේ සමාගම අපේ දේශීය කිරි ගොවියා නඟා සිටුවීමේ වැඩ පිළිවෙලක් ඔවුන්ගේ තියෙන්නේ.එනිසා මේ වර්ග අඩි 8*8 ප්‍රමාණක මේ බිම් කඩ, යම් නිර්නායක පද්ධතියක් යටතේ ලබා දීම සුදුසුයි කියලා මං අදහස් කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර මහතා කතා කරමින්**

මේ නරක වෙළඳාමක් නෙවෙයි කරන්නේ.එනිසා මං කීවේ දෙන පුද්ගලයා නෙවෙයි වැදගත් වන්නේ, ලබා දෙන ක්‍රම වේදය.එනිසා නිසි ක්‍රම වේදයකට කරන්න කියන එකයි මම කියන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

මේක හොඳ දේකට ඉල්ලන්නේ මේ පුද්ගලයා. එනිසා ටෙන්ඩර් කරනවා කියන එක හරියන්නෑ. එහෙනම් ලොතරැයි කුඩු වලට දීලා තියෙන්නේ ඕන තරම්. මේකෙන් ජනතාවට හොඳ දෙයක් ලැබෙනවා.නගර සභාවට ආදායමක් ලැබෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා කතා කරමින්**

මේක ටෙන්ඩර් කරනවා නම් කිරි හලක් සඳහා පමණක් ටෙන්ඩර් කරන්න.නැතිනම් මෙතන ලොතරැයි හලක් දාවී.වෙනත් ඉල්ලුම්කරුවෝ නැතිවුනොත් මේ මහතාටම ගන්න පුලුවන්නේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රිනී ඊ ඉන්ද්‍රාඅයිරාංගනී මහත්මිය කතා කරමින්**</u>

මිල්කෝ කිරි හලවල් හැම බස්නැවතුම්පලකම තියෙනවා.මේ පුද්ගලයා මෙක ඉල්ලන්නේ ජීවත්වීම සඳහානේ.එනිසා නගර සබාවට ආදායමක් එන විදියට අපි මෙක හදාගන දෙමු ගැටළුවක් ඇති කර ගන්නැතිව.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ආදායම් පරීක්ෂක, සරත් මන්ත්‍රීතුමා කීව පරිදි ලබන සභාවට මේ පිළිබඳව වාර්තවක් ඉදිරිපත් කරන්න.

<u>තීරණය</u>

**විලේගොඩ පදිංචි අජිත් හේමන්ත ද සිල්වා මහතා විසින් අම්බලන්ගොඩ බස් නැවතුම්පල පරිශ්‍රයේ හයිලන්ඩ් කිරිහලක් පවත්වාගෙන යාම සඳහා 8'*8' ප්‍රමාණයේ ස්ථානයක් ලබා දීමට අනුමැතිය ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම පිළිබඳ සාකච්ජා කළ සභාව මේ පිළිබඳ සියලු සාධක පීළිබඳ ආදායම් පරීක්ෂක විසින් පරීක්ෂා කර බලා එහි වාර්තාව ලබන සභාවට යොමු කරන ලෙසට තීරණය කරන ලදි.**

**12.6** **‘ අතුරු මාර්ගයක් කොන්‍ක්‍රීට් කරවා ගැනීම සඳහා’**මැයෙන් පොල්වත්ත ප්‍රදේශවාසීන් විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ පොල්වත්ත ශ්‍රී බුද්ධදත්ත මාවත විදුහල අසල පාසලන්, පොල්වත්ත හන්දියත් අතර තිබෙන පාර කොන්ක්‍රීට් කර ගැනීම සඳහා මීට ඉහතදීද ඉල්ලීමක් කළ බවත් මෙම මාර්ගය නගර සභාවට පවරා ගෙන කොන්ක්‍රීට් කර දෙන මෙන් නැවතත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

**අම්බලන්ගොඩ පොල්වත්ත ශ්‍රී බුද්දදත්ත මාවත විදුහල අසල පාසලෙන්, පොල්වත්ත හන්දිටයත් අතර තිබෙන පාර නගර සභාවට පවරා ගන්නා ලෙසට කරන ලද ඉල්ලීමට අනුව අදාල පවරා ගැනීමේ ලිපි ඉදිරිපත් කර පවරා ගැනීම් කටයුතු සිදු කරන ලෙසට සභාව විසින් තීරණය කරන ලදී.**

**12.7** **‘ 2017.12.31 දිනට පවත්වන ලද පුස්තකාල පොත් සමීක්ෂණයේ නිර්දේශ සහ යෝජනා ක්‍රියාත්මක කිරීම** ’ මැයෙන් අභ්‍යන්තර විගණන නිලධාරී විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

2017.12.31 දිනට පැවැති පුස්තකාල පොත් සමීක්ෂණයේ නිර්දේශ සහ යෝජනා ක්‍රියාත්මක කිරීමට 2018.02.08 දින පැවැති මූල්‍ය හා ප්‍රතිපත්ති කමිටුවේ 1.5 හා 1.6 යටතේ නිර්දේශ ලබා දී ඇති බවත් ඒ අනුව භාවිතා කළ නොහැකි පොත් විධිමත් පරිදි විනාශ කිරීමට නිර්දේශ ලබා දී ඇති බවත් මේ අනුව 2018.07.05 වන සඳුදා දින මේය සිදුකරන බවත් මෙම කාර්යය අධීක්ෂණය කිරීමට නගර සභා මන්ත්‍රීවරු දෙදෙනෙක් පත් කරන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

**ප්‍රධාන පුස්තකාලයේ සහ ශාඛා පුස්තකාලවල භාවිතයට ගත නොහැකි ලෙස විනාශ වී තිබූ පොත් විධිමත් පරිදි විනාශ කිරීමේ කටයුතු 2018.07.05 දින සිදු කිරීමටත් මෙම කාර්යය අධීක්ෂණය සඳහා ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණයගේ මහතා සහ ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**12.8** **‘ නගර සභා කාය වර්ධන මධ්‍යස්ථානයේ අය කිරීම්** ’ සම්බන්ධයෙන් විෂය ලිපිකාරිනිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

නගර සභා කාය වර්ධන මධ්‍යස්ථානයේ දැනට අනුමත කරන ලද මුදල වැඩිහිටියකු සඳහා රු.600.00 ක් හා පාසල් සිසුවකු සඳහා රු.250.00 ක් බවත් දේශීය ආදායම් කොමසාරිස්ගේ 2012 වර්ෂයේදී නිකුත් කරන ලද චක්‍රේල්ඛණය පරිදි මේ සඳහා වැට් හා එකතු කළ අගය මත බදු අයකළ යුතු බවත් ඒ අනුව මෙම මුදල වැඩිහිටියකු සඳහා රු.702.00 හා පාසල් සිසුවකු සඳහා රු.292.50 වන බවත් මෙම මුදල සඳහා පුහුණුකරුවකු නොමැතිව පුද්ගලයින් නොපැමිණිය හැකි බැවින් වැට් සහ එකතු කළ අගය මත බදු එක්කර පසු රු.600.00 ය හා රු.250.00ක් යන මුදල අය කිරීමට අනුමැතිය ඉල්ලා තිබුණි.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මෙහිදී සභාවට ලැබෙන්නේ රු.512.83 , වැට් එක රු.76.92 ක් වනවා , එකතු කළ අගය මත බද්ධ රු.10.25 ක වනවා.

<u>තීරණය</u>

**කාය වර්ධන මධ්‍යස්ථානය සඳහා අනුමත කරන ලද මුදලෙන් වැඩිහිටියන් සඳහා අය කරනු ලබන රු.600ක් සහ පාසල් ළමුන් සඳහා අය කරනු ලබන රු250.00 ක මුදල තුළ VAT සහ NBTමුදලඇතුළත්විය යුතු බව සභාවදැනුම්දෙනලදි.**

**12.9 'මාරම්බරී ගී ප්‍රසංගය - 2018 ජූලි 28'** මැයෙන්විදුහල්පතිතුමා ඇතුළු පිරිස ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

මාරම්බරී ගී ප්‍රසංගය 2018 ජූලි මස 28 වන දින සවස 2.30 හා 6.30 එස්.තෝමස් ද සිල්වා අනුස්මරන ශ්‍රවණාගාරයේදී පැවැත්වීමට නියමිත බැවින් සහ මෙම ප්‍රසංගයේ ආදායම ශිෂය සුභසාධනය කටයුතු හා පාසල් නඩත්තු කටයුතු වෙනුවෙන් යොදවන බැවින් මෙම ප්‍රසංගය විනෝද බද්දෙන් නිදහස් කිරීමට කටයුතු කරන මෙන් ඉල්ලා තිබුණි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණයගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමණි විනෝද බද්ධ ගැන මීට පෙර සභාවේදී තීරණයක් ගනු ලැබුවා.ඉල්ලන සියලුම දේ සඳහා අපි විනෝද බද්ධ නිදහස් නොකර අවශ්‍ය දේවල් සඳහා පමණක් නිදහස් කරමු කියලා. එනිසා අපි මේ ගැන සැලකිලිමත් විය යුතුයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

මමත් සංගමයේ ඉන්නවා.සියලු ආදායම් යොදවන්නේ ශිෂ්‍ය සුභ සාධනය සඳහා.එනිසා මේක නිදහස් කරන්න කියලා ඉල්ලනවා.

<u>තීරණය</u>

**ධර්මාශෝක විද්‍යාලීය ආදී ශිෂ්‍ය සංගමය මගින් 2018 ජූලි 28 වන දින එස්.තෝමස් ද දිල්වා අනුසමරණ ශ්‍රවනාගාරයේදී පවත්වනු ලබන මාරම්බරී ගී ප්‍රසංගයෙන් ලැබෙන ආදායම ශිෂ්‍ය සුභසාධන කටයුතු හා පාසල් නඩත්තු කටයුතු සඳහා යොදවන බැවින් මෙම ප්‍රසංගය විනෝද බද්දෙන් නිදහස් කරන ලෙසට කරන ලද ඉල්ලීමට අනුව විනෝද බද්දෙන් නිදහස් කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**

**12.10 'ආරක්ෂක සේවාව සඳහා සේවක මහතුන් බඳවා ගැනීම'** මැයෙන්විෂය නිලධාරී විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

උක්ත කරුණ සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් විමසීමේදී පහත පරිදි කරුණු පෙන්වා දුන් බව සඳහන් කර තිබුණි.

- දකුණු පළාත් පළාත් පාලන ආයකතන වලට මුරකරු තනතුර සඳහා නව තනතුරු අනුමත වීමට කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවට යොමු කළත්, අදාළ සේවා අවශ්‍යතාවය මත බාහිර සේවා ආයතනයකින් සපුරා ගැනිමට කටයුතු කරන ලෙස දන්වා ඇත.

- මෙයට පෙර ටෙන්ඩර් පටිපාටිය යටතෙත් ආරක්ෂක සේවාව ලබාගත් අතර ,එම ටෙන්ඩරයේ දෙවන ටෙන්ඩර්කරුවක් තෝරා ආරක්ෂක සේවාව සඳහා බඳවා ගැනිම සුදුසු යැයි යෝජනා කර තිබුණි.

<u>තීරණය</u>

**ආරක්ෂක සේවාව සඳහා කැඳවන ලද ටෙන්ඩරය වෙනුවෙන් ඉදිරිපත් වී ඇති ටෙන්ඩර් කරුවන් අතරින් දෙවන ටෙන්ඩර්කරුවෙකු තෝරා ගැනීම සඳහා ටෙන්ඩර් කමිටුව නියෝජනය සඳහා ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා සහ ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාරමහතා, ලේකම්, ගණකාධිකාරී(අම්බලන්ගොඩ කලාප කාර්යාලයේ),විමර්ශව නිලධාරී(පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය), ද ප්‍රධාන කළමණාකරණ සහකාර ,අභ්‍යන්තර විගණන නිලධාරීවිසින් යන පිරිසෙන් සමන්විත ඇගයුම් කමිටුවක් මඟින් 2018.08.01 දින සිට අම්බලන්ගොඩ නගරභාවට ආරක්ෂක සේවාව සැපයීම සඳහා සුදුසු ආයතනයක් තෝරා ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.**

**12.11** **'ආරක්ෂක අංශය -2018 ජූලි මස සඳහා සේවයේ යෙදවීම'** මැයෙන්ආරක්ෂක සේවක මහතුන් විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සහාගත කරන ලදී.

ආරක්ෂක අංශයේ සේවයේ යෙදී සිටි එම්.ඩබ්.බන්දුසිරි සහ ඩබ්.ඒ.බන්දුලසිරි යන අය වයස අවුරුදු 60 ඉක්මවීම මත 2018.12.31 වන දිනෙන් සේවය නතර කරන ලද බවත් ඉන්පසුව මාසිකව ලබාගත් අනුමැතිය පරිදි සේවයේ යෙදුන බවත් ඒ අනුව 2018 ජූලි මාසය සඳහා සේවයේ යෙදීමට අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>
සභාපතිතුමණි ත්‍රිවිධ හමුදා, පොලීසි වලට යන අණ පනත්ම තමයි පුද්ගලික ආරක්ෂක අංශයටත් යන්නේ.අවුරුදු 60 වඩා ඉන්න කොට ඩී.එම්.ඕ ගේ වාර්තාවකින් තමයි මාස 06 අපි කාලය දීර්ඝ කරන්නේ.එහෙ නොවුනොත් යම් ගැටළුවක් වුනොත් රාජකාරියේදී එහි වගකීම නගර සභාවට භාරගන්න වෙනවා.එහෙම වුනොත් නීතිමය ගැටළු වලට නගර සභාවට මුහුණ දෙන්න වෙනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ගැටළුව තියෙන්නේ දැනට නගර සබාවේ ආරක්ෂක අංශයේ නියලිලා ඉන්නේ නිලධාරීන් දෙදෙනයි.ඒ දෙන්නත් ගියොත් අපට විශාල ගැටවවකට මුහුණ දෙන්න වෙනවා.

<u>ගරු නගර උප සභාපති කමල් වැල්ලගේද සිල්වා මහතා කතා කරමින්</u>
සිවිල් ආරක්ෂණ කමිටුවෙන් ආරක්ෂක නිලදෘරීන්ට වැටුප් ගෙවන නිසා එවුන් ආරක්ෂක නිලධාරීන් රජයේ ආයතන වලට ලබා දෙනවා.ඉල්ලීමක් කරලා බලන්න සභාපතිතුමා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>
සිවිල් ආරක්ෂන කමිටුවේ ගණන් වැඩී.

<u>තීරණය</u>

**ආරක්ෂක අංශයේ සේවයේ යෙදී සිට වයස අවු .60 ඉක්මවීම මත 2018.06.30 දිනට විශ්‍රාම ලැබූ එම්.ඩබ්.බන්දුසිරි මහතා සහ ඩබ්.ඒ.බන්දුලසිරි මහතා යන දෙදෙනා තව දුරටත් එම කාලය දීර්ඝ කර ගැනීම සඳහා කරන ලද ඉල්ලීම පිළිබඳ සාකච්ඡා කළ සභාව ආරක්ෂක සේවා කටයුතු පවත්වාගෙන යාමේදී ගැටලුකාරී තත්වයක් ඇති විය හැකි බැවින් 2018 ජූලි මස 31 වන දින දක්වා එම කාලය දීර්ඝ කිරීමට සභාව විසින් තීරණය කරන ලදී.**

**12.12** **'අම්බලන්ගොඩ නගරයේ වෙසක් සතිය තුළ කානිවල් සංදර්ශනපැවැත්වීම '** මැයෙන්අම්බලන්ගොඩ සද්ධර්ම ප්‍රෙබාේධ බෞද්ධ සමිතිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සහාගත කරන ලදී.

අනාදිමත් කාලයක පටත් 90% ට වැඩි බෞද්ධයන් පිරිසක් සිටින නගරයක් ලෙස අම්බලන්ගොඩ නගරය ප්‍රසිද්ධ බවත් ඔවුන් ඈත අතීතයේ සිට තොරන් සහ පෙරහැර පවත්වමින් වෙසක් අත්සවය සැමරූ බවත් වර්තමානයේදී කානිවල් සංස්කෘතියක් පවත්වමින් වෙසක් සතිය සමරන බවත් මුදල් ගොවා ඔට්ටු සෙල්ලම් කරන සූදු පොළවල්ද තිබූ බවත් එබැවින් කානිවල් මඩු සංස්කෘතිය අම්බලන්ගොඩ නගරයෙන් තුරන් කිරීමට අවශ්‍ය නිති සම්පාදනය කරන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

වෙසක්,පොසොන් හෝ ඇසළ උත්සව වැනි අපේ සංස්කෘතියට අදාල වන දෙයක් හැර සූදු ක්‍රමයට යන කිසිම දේකට අපි එකඟ වෙන්න හොඳනැහැ. මේ ලිපියේ සත්‍යයක් තියෙනවා.අපි අපේ මුතුන් මිත්තන්ගේ දේවල් ආරක්ෂා කළ යුතුයි.එනිසා මුදල් අපයන්න සූදු ක්‍රමයට යන දේවල් සඳහා අනුමැතිය නොදී ඉමු කියලා මම කියනවා.

<u>තීරණය</u>

**අම්බලන්ගොඩ නගරයේ වෙසක් සතිය තුළ කානිවල් සංදර්ශන පැවැත්වීමේදී මුදල් ඉපයීම සඳහා සූදු ක්‍රමයට සිදු කරන කිසිදු කාරණයකට අනුමැතිය ලබා නොදීම සුදුසු බව ගරු සභාව විසින් ඒකමතිකව තීරණය කරන ලදී.**

**12.13 'අතුරු මාර්ගයක් කොන්ක්‍රිට් කර ගැනීම'** මැයෙන් අම්බලන්ගොඩ,පටබැඳිමුල්ල,වෙරළ පාර,නො.55/2 ලිපිනයේ කේ.පී.තිලක් නන්ද මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ පටබැඳිමුල්ල මුහුදු වෙරළ පාරේ දකුණට මාතරගේවත්තද උතුරට ඕකඩබඩවත්තට මැදිව ඇති මුහුදට යන මාර්ගය වෙරළ තෙක් කොන්ක්‍රිට් අතුරාසකස් කර දෙන මෙන් ඉල්ලා තිබුණි.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේක නගර සභාව සතු පාරක්.අපේ නිවාස සංකීර්නයක් මැදින් යන එකක්.එනිසා ඒක සංවර්ධනය කරන්න ඕන.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

මේක අඩි 10 ක පාරක්.භෞතිකව අඩි 08 ක් පේනන් තියෙන්නේ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

නෑ අඩි 10 ක් පේන්න තියෙනවා.

<u>තීරණය</u>

**අම්බලන්ගොඩ පටබැඳිමුල්ල මුහුදු වෙරළ පාරේ දකුණට මාතරගේවත්තද උතුරට ඕකඩබඩවත්තට මැදිව ඇති මුහුදට යන මාර්ගය වෙරළ තෙක් ඇති අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම සම්බන්ධයෙන් කරන ලද ඉල්ලීමට අනුව මෙය නගර සභාව සතු මාර්ගයක් බැවින් කොන්ක්‍රීට් කිරීම සඳහා ගරු සභාපති ඇම් .ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**

- **වෙනත් කරුණු**

**01.** <u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

මෙම ස්ථානයේ සභාපතිතුමණි කිරි හල බඳු ගැනිමට ඉල්ලලා තිබුණ පුද්ගලයත් හිටියා ඇවිල්ලා.මල් කඩය දීපු මන්ත්‍රීවරු හැමෝම හමුවන්න ඇති .මේ පුද්ගලයා මාව හමුවන්නත් ආවා.අපි හැමෝවම හමු වෙන්න එන්න ඇති. අපි කවුරුත් මේ ගැන දැන ගන්න ඕන.අපි ගිය සභාවේදී කතා කරා ලක්ෂ 50 ට

බඳු දීපු මල් කඩේ වික්ක එකට අල්ලපු කඩේ පුද්ගලයා මේ කරන්නේ.මල් කඩේ ඉස්සරහා මේක තියන්න හදන්නේ.මට කීවා මේකට උදවු කරන්න කියලා.හරි වැරදි සභාපතිතුමා මේ දේවල්.මම නරක පුද්ගලයා වේවී.නමුත් සාධාරණයක් තියෙන්න ඕන.සියලු මන්ත්‍රිවරු මේ පිළිබඳව දැනුවත් වෙන්න ඕන.ආදායම් පරීක්ෂකවරු වාර්තාවක් දෙන කොට සභාපතිතුමා හෝ මන්ත්‍රිවරු දැනුවත් කරන්න ඕන.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**
සභාපතිතුමා ඔබ තුමාටත් ලිපියක් නිකුත් කරලා තියෙනවා පටබැඳිමුල්ලේ පී.ජී.නිහාල් මහතා.මේ මහතාගේ නිවසට යාබද ගොඩනැගිල්ල අනුමත කරලා තියෙන්නේ තට්ටු 02 කට.මේ දේවල් වැරදි ආදර්ශ වෙනවා.ඔබතුමා මේක වහාම නතර කරන්න කියලා ලිපියකුත් ගහලා තියෙන්වා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**
මේක අනුමත කරලා තියෙන්නේ නාගරික සංවර්ධන අධිකාරියෙන්

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**
තාක්ෂණ සේවා නිලධාරීන් ගිහිල්ලා මේක බලලා තියෙනවා.ඔවුන්ට කීවම ඉටිකොළයක් ගහලා තියෙනවා.මේ ගොඩනැගිල්ල නිවස ආසන්නයේමයි තියෙන්නේ.මේවගේ දේවල් මුළු නගරයටම ගැටළුවක්.අනුමැතිය දුන්නේ තට්ටු 02 නම් නිලධාරීන් දැන ගන්නඕන අපෙත් ගරුත්වය ආරක්ෂා කරලා මේවා නතර කරන්න.අපට මේ දෙනෝ දාහක් ඇහැට කනට ජේනවා.මිනිස්සු අපට කියනවා මොකක්ද කරන්නේ කියලා.වේලාවකට හිතෙනවා ගාලු පාර වහලා මේවට උද්ගෝෂණ කරන්න.මේවා හරිම වැරදී.තාක්ෂණ සේවා නිලධාරීන් කරුණාකරලා නීතිය ක්‍රියාත්මක කරන්න.මම සංවර්ධන කමිටුවේදීත් මහ ඇමතිතුමා අසලදීත් කියන්නේ ඒකයි.අපි අපේ නගරය ආරක්ෂා කර ගන්න ඕන.මම කීවා යන්න පොලීසියට කියලා. මං පොලීසියට පුද්ගලිකව කතා කරලා කීවා, මේවැනි දේවල් අසාධාරණයි කියලා.කෝට ගණන් සල්ලි තිබ්බ පලියට අසරණ මිනිස්සු තලලා පෙළන්න ඉඩ දෙන්න බෑ.මේ සම්බන්ධයෙන් නිලධාරීන් ක්‍රියාත්මක නොවුනොත් මිනිස්සු එක්ක අපි බෝඩ් අල්ලන් පාරට බහිනවා.මේ මිනිස්සුන්ට කරදරයක් වුනොත් කෝ ආරක්ෂාවක්.මේක නාගරික සංවර්ධන අධිකාරියෙන් අනුමත කළාට නගරයේ වගකීම තියෙන්නේ නගර සභාවට.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**
මේ සම්බන්ධයෙන් ඔබතුමා ඇත්ළු අපි සියලු දෙනාම දැන ගත යුතු දේවල් තියෙනවා.දැනට වෙරළ මීටර් 300 කලාපයට අයත් වන සියලු ස්ථාන නගර සභාවෙන් ඉවත් කරලා නාගරික සංවර්ධන අධිකාරියට පවරගෙන තියෙනවා.එනිසා මෙහෙම සැලැස්මක්වත් අනුමත වුනාද කියන්න අපට දැන ගන්න විදියක් නෑ.වාචිකව තමයි දැනගන තියෙන්නේ තට්ටු දෙකකටය අනුමත වේලා තියෙන්නේ කියලා.අවාසනාවකට වගේ අපට පොලිස් බල තල නෑ.එනිසා අපට අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් කරන්න තියෙන්නෙ උසාවියේ නඩු දාන්න.මං කීවා මම මේ ලිපිය නිකුත් කරන්නම් , උසාවියට ගිහින් ඉදිරිපත් කරලා සම්පූර්ණයෙන්ම මේ ගේ හදන එකට තහනම් නියෝගයක් ගන්න පුළුවන් කියලා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**
එතකොට මීටර් 300 කලාපය තුළ නාගරික සංවර්ධන අධිකාරියෙන් තට්ටු දෙකට අනුමත කරන් තට්ටු 07 ක් හදනවා.එතකොට නගරයේ ආරක්සාව වෙනුවෙන් ඔබතුමාට මුකුත් කරන්න බෑ.එතකොට මේ නගරයට මොකද වෙන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**
දේශපාලන හුවමාරුව තුළ තියෙන ගැටළු මේවා.උදාහරණයකට අපට අපේ සල්ලි වලින් වැඩ කරන්න බැරි වේලා තියෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**
මෙවැනි දේවල් ඉදිරියට නොවෙන්න,ඔබතුමා නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉල්ලන්න විස්තර වාර්තාවක්.මේ දේවල් අපට තදින්ම බලපානවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**
මේ දෙදෙනාම මගේ කොට්ඨාශයේ, මම ඇසුරු කරන අය.නමුත් අපට පනත අනුව මුකුත් කරන්න බෑ.අපිට කරන්න පුළුවන් නාගරික සංවර්දන අධිකාරියට ලිපියක් යොමු කරන්න විතරයි,මේ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරන්න කියලා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**
මෙයාලා ඉටි කොලයක් ගහන්නේ.විශාල ගොඩනැගිල්ලක් ඉදිකරන කොට දරලක් ගහන්න ඕන.මේ පුද්ගලයා ඉල්ලන්නේත් ඒක විතරයි.එනිසා මේ පිළිබඳව කටයුතු කරන්න කියලා ඉල්ලනවා.සභාපතිතුමා ඔබටත් මෙම ලිපිය ලැබෙන්න ඇති.මහ අම්බලන් නගර සබාවට අයත් හිස් බිමක පිහිටි පැරණි ළමා ක්‍රීඩාංගනය.රේල් ගේට්ටුව පහු වුනාම දොළොස්මහේ ගබඩාවට පිටු පස කැල්ල.එතන තිබුණා ළමා ක්‍රීඩාංගනයක්.එතන ලොකු වාහන ස්ටාට් කරනවලු,වාහන ශබ්දය ,දූවිල්ල ගෙවල් වලට යනවා.ඒක මිනිස්සුන්ට හිරිහැරයක්.එනිසා මේවා මේ විදියට මිනිස්සුන්ට දෙන්න එපා.මේවා නගර සභාව සතු ඉඩම්.එනිසා වැට ගහලා මේවා වෙන් කරන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**
අපි මේවා දීලා නෑ.එවුන් වාහන නතර කරනවා.අපි මේක නොදුන්නොත් ඔවුන් වාහන ටික පාර දිගට නතර කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රීනී ඒ.පී.ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**
අපි පොඩි කාලේ ඔතන පොඩි පාරක් තිබුනේ.හැමදාම අවුරුදු උත්සවයක් තිබුනේ මේ භූමියේ.ජනතා විමුක්ති පෙරමුනේ රැස්වීමක් තිබ්බෙත් මෙතන.එල්.සී.ද සිල්වා මහත්මයලාගේ රැස්වීමක් තිබ්බෙත් මෙතන.කරුණාරත්ත මහත්තයාලා 77 රැස්වීම් තිබ්බෙත් මෙතන.රයිටර් තිලකසේකර මහත්තයලා රැස්වීම් තිබ්බෙත් මෙතන.මේ තරම් අතීතයක් තියෙන හොඳම හිස් භූමියක් මේක.ඔය ඉඩම් වලට පාර තියෙන්නේ මෙතනින් නෙවෙයි.එහා පැත්තේන් තියෙන්නේ.ගෑස් කඩේ තියෙන්නේ ට්‍රාන්ස්පෝමරය තිබ්බ ගොඩනැගිල්ලෙ.ඒකවත් ඒ මිනිහා හදාගත්තේ නැ.නගර සභාව හදාපු ගොඩනැගිල්ලේ ගෑස් විකුණනවා.කෝ ඒකට බද්ධක්.ඒකටත් බද්ධක් ගන්නකෝ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**
මේක පසුගිය සභාවක් විසින් එයාට ලබා දීපු කොටසක්.

**ගරු නගර සභා මන්ත්‍රීනී ඒ.පී.ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**
ඔප්පුවකින් දීලා තියෙනවද?

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**
ඒ කාලේ හිටපු සභාව මේක ඒකමතිකව අනුමත කරලා මහ ඇමතිතුමාගේ අනුමැතියකින් දීලා තියෙන්නේ.මහ අම්බලන්ගොඩ පාර හදන වේලාවේ ගෑස් කඩේ අයිති විජේවික්‍රම මහතාගේ ඉඩමෙන් අම්බලන්ගොඩ නගර සභාව අරන් තියෙනවා පර්චස් 6 දශම ගාණක් .නගර සභාවෙන් එතුමාට දීලා තියෙනවා පර්චස් 3ගාණක්.මේක හුවමාරු ඔප්පුවකින් කරලා තියෙන්නේ.ඉන් පසු මෙ මහත්මයා ඉල්ලීමක් කලා හිටපු උපසබාපති එස්.කේ.සිරිතිලක මහත්මයා මඟින් එයාලා පර්චස් 6 ක් දීලා තියෙනවා නගර සභාව දීලා තියෙන්නේ පර්චස් 03.එනිසා තව පර්චස් 01 ක් දෙන්න කියලා.එවකට 1997 හිටපු සභාව සිරිතිලක මහත්මයාගේ යෝජනාව පරිදි ඔය කඩේ හදපු පර්චස් 01 දුන්නා හුවමාරු ඔප්පුවට අනුව.එප්පුව බලන්න පුළුවන්.එදා සභාව එදා දිනයට සාපේක්ෂව නිවැරදි දෙයක් කරලා තියෙන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රීනී ඒ.පී.ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**
විජේවික්‍රම මහතාට එතන ඉඩමක් තිබුනේ නෑ.තිබුණ නම් මං දන්නවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**
මේ ගිවිසුම ඇති කරගෙන තියෙන්නේ 1969 වර්ෂයේදී.

**ගරු නගර සභා මන්ත්‍රීනී ඒ.පී.ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**
විජේවික්‍රම මහතාට ඉඩම් තිබුටණ් ජල සම්පාදනයට මෙහා පැත්තේ ගෙදර.ඒ හැර ඩෙනට් මහත්මයා ඉන්න තැනින් ඇතුල් පාරේ ගෙවල් ටික එතුමාගේ.තව සිංගර් එක ළඟ ගේ සහ ෂෙඩ් එක විතරයි.විජේවික්‍රම මහතාට පුලස්ති ගෙදර අයිතියක් නෑ.විජේවික්‍රම මහත්මයාට ඔතන ඉඩම් තිබුනේ නෑ.එහෙනම් එවකට මේ වැඩේ කරපු අය ඔබතුමාලටත් කොලේ වහලා තමයි මේ වැඩේ කරලා තියෙන්නේ.මම දන්නවා ඔය ස්ථානයේ ඉඩම් පිළිබඳ පරම්පරාව කියන්න.මට දැන ගන්න ඕන එය ඉඩම ඔප්පුවකින්ද දීලා තියෙන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

සභාවෙන් අනුමත කරලා පළාත් පාලන ඇමතිට දාලා, පළාත් පාලන ඇමතිගෙන් පස්සේ තමයි දීලා තියෙන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රීනී ඒ.පී.ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**

ඔප්පුවකින්නේ දෙන්න ඇත්තේ.අපට ඒ ලිපි ගොනු බලන්න පුළුවන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔව් බලන්න පුළුවන්

**ගරු නගර සභා මන්ත්‍රීනී ඒ.පී.ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**

දැන් ඔය ගෑස් කඩේ කට්ටිය ගේ කඩලා හදනවා.එයාලත් මේ පැත්තටම පාර මුහුන දැම්මොත් ඔතන ළමා උද්‍යානයක් හදන්න වෙන්නෑ.ටයර් කඩේ අයත් පාර මුහුණත මේ පැත්තට තියලා තියෙන්නේ.පාර මුහුණත තියෙන්නේ අනෙක් පැත්තට.නමුත් කට්ටිය භාවිතා කරන්නේ මේ පැත්ත.සභාපතිතුමා හෙට වෙන කවුරු හරි ඔතන මඩුවක් ගැහුවොත් මම නම් විරුද්ධ වෙන්නෑ.මාත් ලී කෑල්ලක් හරි හිටවලා උදවු කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**

සභාපතිතුමණි අපි ළමා උද්‍යානයට තියෙන මේ ඉඩම මායිම් ලකුණු කරලා වෙන් කර ගමු.එතකොට ගැටළුවක් නෑනේ.ඔතන සියලුම ළමයින්ට භාවිතා කරන්න ළමා උද්‍යානයක් හදලා දෙමු.සභාපතිතුමණි බුද්ධදත්ත මාවතේත වතර ගලා යෑම පිළිබඳව ගැටළුවක් තියෙනවලු.ඔබතුමාටත් ලිපි දීලා තියෙනවා.2012 වර්ෂයේ සිට මේ ගැටළුව තිබිලා තියෙනවා.නගර සභාවෙන් ලියුම් පවා මෙයාලට දීලා තියෙනවා.එක කට්ටියක් කාණුව වහලා තියෙනවලු.දැන් පාර හදන්නත් හදනවනේ.ඊට පෙර මේ ගැටළුව විසදන්න ඕන.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ ද සිල්වා මහතා කතා කරමින්**

කුනු වතුර බැහැලා යන කාණුවක් වහන්න බැහැ.සභාපතිතුමණි, මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයා යොමු කරලා මේක නිවරදි කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**

මානාන පිට්ටනියේ මං දැක්කා වාහන පදවන්න පුරුදු වෙනවා.ඒක වැරදි.පිට්ටනිය අපි නඩත්තු කරනවා. අනවශය දේවලට යොදා ගන්න දෙන්න හොදනෑ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

තාක්ෂණ සේවා නිලධාරී මෙතන ගේට්ටුවක් දාන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**

සභාපතිතුමණි, ඒ වගේම 2015 ලක්ෂ 10 දීලා ප්‍රතිපාදන ලැබුණ ඒවා දීලා මං ඔතන වැට ගැහුවේ.දැන් නගර සභා පෙර පාසල පැත්තෙන් කඩේට යන්න වැට කඩලා.ඕක වහනන් ඕන.නැතිනම් එතනින් හරකුන් ඇතුළු වෙනවා.ඒ වගේම ඕක අනවශ්‍ය මාවතක් කර ගන්නවා මිනිස්සු.ඒ වගේම අම්බලන්ගොඩ නගරයේ අපේ පාරවල් වල අනවශ්‍ය තැන් වල වෙළඳාම් කරනවා.දොළොස් මහ ළඟ ඉදලා එනකොඩ මිලාන බේකරිය දක්වා තියෙනවා.සරත් මන්ත්‍රීතුමා මේක දුන්නේ.ඇඳලම තියෙනවා.අනුමත නැතිනම් මේවා ඉවත් කරන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ආදායම් පරීක්ෂක මහත්වරු මේවා බලලා ඉවත් කරන්න.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමණි, අපි ගිය සභාවේදී අනුමත කළා, මාළු ලෑලී කඩලා වෙළෙන්දෝ ටික දාන්න ...ඒවා කඩන්න කීවාම වාර්තාවක් ඇවිත් නෑ කීවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

සෞඛ්‍ය කමිටු තීරණය අරන් සභාවේදී අනුමත වුනාම මේ වැඩ කෙරෙන්න ඕන.

**ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා කතා කරමින්**

සභාපතිතුමණි සෞඛ්‍ය කමිටුවේදී වෛද්‍යතුමියත් මේ පිළිබඳව කීවා.සභාවෙත් මේ ගැන කතා කළා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**
මේ සභාවෙන් ගන්න තීන්දු අදාළ නිලධාරීන්ට ගියේ නැත්නම් ඒක ක්‍රියාත්මක වෙන්නෑ.ඒ නිලධාරීන් මේ ගැන දන්නෙත් නෑනෙ.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**
පවතින මාළු ලැලි ටිකකඩලා ඔතන හදලා දෙන්න ගිය සභාවේදී තීරණයක් ගත්තා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**
මන්ත්‍රීතුමා ඔය මාළු ලැලි කැඩුවත් ඔය මිනිස්සු ඔතනින් යන්නෑ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ ද සිල්වා මහතා කතා කරමින්**
නමුත් අපි අපේ වගකීම ඉටුකරන්න ඕනනේ සභාපතිතුමා.ඔය මාළු ලැලි ජරා වේලා තියෙන්නේ.ඒවා කඩලා ඉවත් කරමු.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**
තාක්ෂණ සේවා නිලධාරී, නියෝග එනකම් ඉන්න ඕන නෑ.අපි මාකට් එකේ එාළු ලැලි ටයිල් කරලා හදලා තියෙන්නේ.ඒවා ජරා වේච්ච නිසා කඩලා ඉවත් කරන්න.ඔයාලට කරන්න බැරි නම් ඇස්තමේන්තුවක් දෙන්න.අපි ටෙන්ඩර් කරලා කරමු.

**ගරු නගර සභා මන්ත්‍රීනී වඩුමේස්ත්‍රි නිලානි මෙනවිය කතා කරමින්**
මම කතා කරන්නේ ළමා උද්‍යානය ගැන.ඔබතුමා කීවා පාරට ඉඩම් කොටසක් දීපු නිසා තමයි ඔය ඉඩම් කොටස දුන්නේ කියලා.නමුත් නගර වැසියෝ ගොඩක් දෙනෙක් පාරවල් වලට ඉඩම් වලින් දීලා තියෙනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**
එවකට සිරි තිලක මහතාගේ වුවමනාවට තමයි ඕක දුන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රීනී වඩුමේස්ත්‍රි නිලානි මෙනවිය කතා කරමින්**
සිරි තිලක මහත්මයාගේ වුවමනාවට නොවෙයි මං හිතන්නේ එවකට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ෂාන් විජයලාල් මහ ඇමතිත්මා පත් වේලා ආපු අලුත එම පක්සයේ මහ අම්බලන්ගොඩ කාර්යාලයෙන් ලිපියක් ආවා මේ පිළිබඳව පරීක්ෂා කරන්න කියලා.මම එතකොට ලංකා සම සමාජ පක්ෂයේ හිටියේ.ඇත්තෙන්ම වෙන්න ඕන අපේ නගර සභා ඉඩම් රැක ගැනීම.දැන් මානාන ක්‍රීඩාංගනයත් ව්‍යාපාරික ස්ථානයක් කරගන.එහෙම කරනව නම් සභාවට ආදායමක් ලබා ගන්න ඕන.එනිසා නගර සභා ඉඩම් යම් ආකාරයකින් ව්‍යාපාරික කටයුතු වලට යොදා ගන්නවනම් ඒ වෙනුවෙන් මුදලක් අයකරන්න.ළමා ක්‍රීඩාංගනය සම්බන්ධයෙන් නම් මම විරුද්දයිතමොකද අපේ මන්ත්‍රීතුමිය කීවා වගේ අපේ ජනාධිපතිනිය අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණිය ඉන්න කාලේ මෙතන රැස්වීමක් පවා තිබ්බා.එනිසා මම ඉල්ලන්නේ අපි ඒකමතිකව තීරණයක් ගමු මෙතන ළමා ක්‍රීඩාංගනය විදියටම පවත්වා ගෙන යන්න. ඒ වගේම අපේ අනෙකුත් ඉඩම්,නගර සබාවට ආදායමක් ලැබෙන ආකාරයට පරිහරණය කරන්න දෙන්න කියලා ඉල්ලනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍රමහතා කතා කරමින්**
සභාපතිතුමණි,ඇමතිතුමා මට ස්තූති කරලා ලිපියක් එවලා තියෙනවා නාම පුවරු කඩා ඉවත් කිරීමට සහයෝගය ලබා දීම සම්බන්ධයෙන්.ඒකට මමත් ස්තූතිය පුද කර සිටිනවා.සභාපතිතුමණි,අම්බලන්ගොඩ බස්නැවතුම්පොල සවස 06 න් පස්සේ සහ සෙනසුරාදා, ඉරිදා ඔබතුමාගේ පාලනයෙන් ඉවත් වෙනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**
මන්ත්‍රීතුමා මම ඒක පිළිගන්නවා.අපේ ආරක්ෂක නිලධාරීන් බස්නැවතුම්පොලේ නැති නිසා අපේ පාලනය ගිලිහිලා තියෙනවා.අපි ආරක්ෂක නිලධාරීන් ස්ථාපනය කරලා නැවත අපේ පාලනයක් ඇති කරමු.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර මහතා කතා කරමින්**
මම බයිසිකලය ටිකකට නතර කරාම, මට කියනවා බයිසිකලය එහාට ගන්නලු.අම්බලන්ගොඩ අය නම් නෙවෙයි.එයාලා දන්නවා.මම පහු ගිය දවසක නගරයට එනකොට සභාපතිතුමණි,පියෝ ටී.වී.එකේ ප්‍රචාරක රථයක් නාම පුවරුවත් වැහෙන්න නතර කරලා, බස්නැවත්ම්පොල අවහිර වන

ආකාරයට.මම එයාලට කීවම එයාලා අයින් කරගත්තේ නෑ.එපාර මම පොලීසියන් ගෙන්නලා කීවම,එයාලා බලපත්‍රය පෙන්නුවා.මම කීවා බලපත්‍රය දීලා තියෙන්නේ ඇතුළු වන දොරටුව අවහිර කරන්න නෙවෙයි කියලා.එහෙම බලන කොට දවල් කාලයෙත් එබතුමාගේ පාලනයෙන් ගිලිහිලා තියෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
ආරක්ෂක නියාමකවරු පිහිටුවන්න ඕන.ඒක කරන්න බැරි වුනේ අපට නිලධාරීන්ගේ අවශය සහයෝගය ලැබුනේ නෑ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර මහතා කතා කරමින්</u>**
සභාපතිතුමණි මම අම්බලන්ගොඩ නගරයේ බලපත්‍රලාභී ව්‍යාපාර නාම ලේඛණයක් ලබා දෙන්න කියලා.ඒක ලැබුනේ නෑ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
ආදායම් පරීක්ෂක මහත්මයා ව්‍යාපාර නාම ලේඛනය, පරිසර නිලධාරීසමඟ එක් වී ලබා දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඊ ඉන්ද්‍රාඅයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

මම තැලිගලකන්ද ඉඩමට ඔප්පු ලබා දිම පිළිබඳව කතා කරන්න හදන්නේ.එම්.ඩබ්.චන්ද්‍රලතා මහත්මිය ඇයගේ ඉඩම් කොටසේ තක්සේරු වටිනාකම නගර සභාවට ගෙවලා ලදුපතක් අරගන තියෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔප්පුවක් දෙන කොට පරිපාලන යෝජනාවක් ඇමතිතුමාට යවන්න ඕන,මම කීවා මේ යෝජනාව ඉදිරිපත් කරන්න කියලා.නමුත් ලේකම්තුමිය මේක ඉදිරිපත් කළේම නෑ.ඒ පරිපාලන යෝජනාව ඉදිරිපත් වුන ගමන් අපි මේක අනුමත කරලා ඉදිරියට යවමු.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

සභාපතිතුමණි, මට ලිපියක් ලැබිලා තියෙනවා ට්‍රැක්ටරයේ සේවය කිරීම සම්බන්දවයි කියලා සජී කියලා මහත්මයාගෙන්.එයා වසර 18 ක් මෙහේ සේවය කරලා තියෙනවයි.දැන් කුණු ට්‍රැක්ටරයකට මාරු කරලා තියෙනවයි කියලා.මෙක මහ ඇමතිතුමාටත් ගිහින් තියෙනවා.එනිසා පොඩ්ඩක් මේක බලන්න කියලා ඉල්ලනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කුණු ට්‍රැක්ටරයට දාලා නෑ.කර්මාන්ත අංශයේ ට්‍රැක්ටරයේ ඉන්නවා.මන්ත්‍රීතුමා කර්මාන්ත අංශයේ හිමාල් මහත්මයා දවසක් රියැදුරෝ නැති නිසා ලොරිය පැදවුවා.මම කීවා එයාට අසනීපයක් තියෙනව නම් වෛද්‍ය වාර්තාවක් අරන් එන්න කියලා.එයා ගෙනාවේ නෑ තවම වෛද්‍ය වාර්තාවක්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මම කීවේ මෙහෙම වෙන කොට, දේශපාලන පලිගැනීම් වෙනවා කියලනේ පැතිරෙන්නේ.
**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

වෙනත් රියැදුරෙකුට පපුවේ අමාරුවක් සම්බන්දව වෛද්‍ය වාර්තාවක් ඇවිත් තියෙනවා.ඒකයි ගැටවව.අපට යොදවන්න රියැදුරෝ නෑ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඒ වගේම සභාපතිතුමා සමහර නිලධාරීන් තමන්ගේ රාජකාරියට වඩා දේවල් අභිබවා යන්න හදනවා.එහෙම වෙනකොට ඒක වැඩ කරන නිලධාරීන්ට හා සේවකයින්ට ගැටවවක් වෙනවා.එනිසා ඒ ආකාරයෙන් කටයුතු කරන්න දෙන්න එපා කියලා මම කියනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඒ.පී.ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

මමඉල්ලගත්තාමහඅම්බලන්ගොඩඅනවසරඉදිකිරීමසම්බන්ධසමූහස්ථානීයපරීක්ෂණය.මහ අම්බලන්ගොඩ ළිඳ ලඟ දැනටත් තියෙනවා ලැලි වලින් හදලා,ගඩෝල ටිකක් බැඳලා.මේකත් ස්ථිර ගොඩනැඟිල්ලක් වේවී.ඔබතුමා දන්නවා මේ සම්බන්ධයෙන් නීතියේ ප්‍රතිපාදන තියෙනවා.ඇයි ඔබතුමා මේ සම්බන්ධයෙන් නීතියෙන් කටයුතු නොකරන්නේ.අඩි 09 ක් දිගයි,අඩි 13 ක් පළලට ඉදිකිරීම තියෙනවා.තමන්ගේ ගොඩනැඟිල්ලට යාබදව තමයි ලැලි ගහලා තීන්ත ගාලා තියෙන්නේ.පර්චස් 2 පමණ නගර සබාවේ ඉඩම අල්ලලා තියෙන්නේ.මේවට නීතියෙන් පියවර ගන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නිලානි මන්ත්‍රීතුමිය එයාලට තේරුම් කරලා දෙන්න, නඩු දාන්න වෙන්නේ මුළු ගෙදරටම.එනිසා ඔය කෑල්ල ඉවත් කරගන්න කියන්න.මුළු ගේම අයින් කළොත් නඩු දාලා, මය පවුලම පාරට වැටෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඒ.පී.ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

ඔතන එයාලට ගෙයක් අවශ්‍ය නෑ සභාපතිතුමා.නිලානී මන්ත්‍රීතුමිය එයාලට හල්වතුරින් ගෙයක් දුන්නා.දැන් එයාලය ලක්ෂ 150,250,300 ලොකු ඉඩම් තියෙනවා.මේක උවමනාවෙන් කරන දෙයක්.මේ නිවස බදු දීලා රු.4000.00 ක් ගන්නවා මාසෙට.මම ලබන සභාවට ඡන්ද හිමි නාම ලේඛණයේ උද්‍යතයක් අරගෙන එනවා.ඉන්න තැනක් නැති කෙනෙක් ගෙයක් හදාගන්නවා වගේ නෙවෙයි සභාපතිතුමා මේක හිතලම කරන දෙයක්.චන්ද්‍රලතා මහත්මියට ඉන්න තැනක් නැති නිසා එතුමිය එතන ගෙයක් හදා ගත්තා.මේ ළඟදිත් ඒ තැනැත්තිය ලක්ෂ 150 ක ගොඩනැඟිල්ලක් මිලදී ගත්තා.එයාලට ලියුමක් හරි යවන්න.ඇයි ඒකවත් කරන්න බැරි.මේ අනවසර ඉදිකිරීම සම්බන්දයෙන් මේ අය දැනුවත් කරන්න.එයාල අහන්නැතිනම් නීතිය ක්‍රියාත්මක කරන්න.නැතිනම් මිනිස්සු අපට බනිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මගේ පාලන කාලය තුළ සාමාන්‍යයන් මම අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් නඩු පැවරීමට උනන්දුවක් කළේ නෑ.අපටත් මනුස්ස හදවතක් තියෙන නිසා.මම කෙනෙක්ගේ නිවසක් කැඩුවා.ඒ මනුස්සයා අපේ ගෙදරට ඇවිල්ලා, උබට උපදින ආත්මයක් ගානේ ගෙයක් ලැබෙන්න එපායි කියලා පොළවේ අත ගහලා කියලා ගියේ.ඕක තමයි සමාජ සේවයේ අරුත.ඒ කෙනාට මම හල්වතුර ඉඩම් බෙදන කොට ඉඩමක් දුන්න, එස් වදීවි කියලා.අපි සභාපතිවරු විදියට බල්ලෝ මරනවා.බලු නැටි ගානට තමයි ගෙවන්නේ.බෞද්ධ සංස්කෘතිය අනුව බල්ලෙක් මැරුවම බෙල්ල කැපෙනවාලු බලු මයිල් ගාණට.එතකොට අපේ කොච්චර කැපෙන්න ඕනද?ඉතින් මේ වගේ වස් වදිනවා.මම කීවේ සාමාන්‍ය ධර්මතාවය.නිලානි මන්ත්‍රීතුමියත් කියනවා නම් මම නඩු දාන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

අපි කතා කළා පඤ්ඤාලෝක මාවතේ ඉදිකරන ගොඩනැඟිල්ලක් ගැන,ඒක නීති ානුකූලද කියලා බලන්න කියලා.මොකද ඒකේ තත්වය?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔය කියන එක අනුමත කරලා තියෙන්නේ.ඕක අයිති විනිශ්චකාරවරයකුට.එතුමා අයදුම්පත්‍රයක් දැම්මා ඇවිල්ලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

පොඞ්ඩක් අපට බලන්න දෙන්න ඒක.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

හිරිකැටිය හරස් පාරේ මැදක් හරියට එන කොට වේලේ පන්සල ළඟින් තිබුණා අඩි 10 ක විතර කාණුවක්.එතන කාණුව යම් පුද්ගලයෙක් වහලා කොන්ක්‍රිට් තටුට්වක් දාලා ගේට්ටුවක් දාලා ඉබ්බෙක් දාලා වහලා. මිනිස්සු අහනවා අපටත් එහෙම කරන්න පුළුවන්ද කියලා.

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්
මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා මේක හොයලා බලන්න.

ගරු නගර සභා මන්ත්‍රීනී වඩුමේස්ත්‍රි නිලානි මෙනවිය කතා කරමින්
සභාපතිතුමා,ඔය කියන්නේ මගේ සහෝදරයගේ හෝටලය,කාණුව අහුරලා තියෙන්නේ 2002.අපට මුදල් ආවා ලෝක බැංකුවෙන් කාණු හදන්න.එවකට එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරයෙක් වෙලා හිටිය වම් මන්ත්‍රීතුමා ඔය කාණුව හැදුවේ.හෝටලයට එහායින් තියෙන කාණුව නම් පටු කරලා තියෙනවා.හෝටලය ළඟ තියෙන කාණුවට මිනිස්සුන්ට යන්න පුලුවන් වෙන විදියට,කාණුව තියන්න ඕන ප්‍රමාණයට තියලා තියෙනවා කියලා මම වගකීමෙන් කියනවා.මොකද ඔය හෝටලයේ සියලුම වැඩ කළේ මම.නගර සභාවෙන් කාණුවට කොන්ක්‍රීට් ලෑලි දැම්මෙත්.

ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා කතා කරමින්

එතකොට ගේට්ටුවක් දාලා තියෙන්නේ කවුද? ඒකත් නගර සභාවෙන්ද කරලා තියෙන්නේ.

ගරු නගර සභා මන්ත්‍රීනී වඩුමේස්ත්‍රි නිලානි මෙනවිය කතා කරමින්
ගේට්ටුව අපේ හෝටලයට දාපු එක.

**ප.ව' 2.20ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.**

| | |
|---|---|
| බී. ඒ. ධම්මිකා, | අරුණ ප්‍රදීප් මණිමෙල් වඩු, |
| ලේකම්, | සභාපති, |
| අම්බලන්ගොඩ නගර සභාව. | අම්බලන්ගොඩ නගර සභාව. |

**2018 -07 - 30**වන දින,
අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.